

වාර්ෂික වාර්තාව

හා මූල්‍ය ප්‍රකාශන

2023

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

දැක්ම

"සමාන ඉගෙනුම් අවස්ථා ලබා දෙමින් ජීවිතයේ කඩඉම් වෙනස් කරන අධ්‍යාපනයේ විශිෂ්ටත්වය අත්කර ගැනීම."

මෙහෙවර

"ඉගැන්වීමේ සහ පර්යේෂණයේ විශිෂ්ටත්වය සඳහා වූ කැපවීම සහිත විවෘත, දුරස්ථ හා නම්‍යශීලී අධ්‍යාපනය හරහා යාවජීව ඉගෙනුම් අවස්ථා සැලසීම."

ආයතනික අරමුණු

1. ජීවිතයේ කඩඉම් වෙනස් කරන අධ්‍යාපනය සඳහා සහාය දක්වන ඉගැන්වීමේ සහ ඉගෙනීමේ ක්‍රියාවලියේ ගුණාත්මකභාවයේ විශිෂ්ටත්වය සාක්ෂාත් කර ගැනීම.

2. ගෝලීය දෘශ්‍යතාව සහ පිළිගැනීම සමඟ පර්යේෂණයේ විශිෂ්ටත්වය සාක්ෂාත් කර ගැනීම.

3. මානව ප්‍රාග්ධනය සහ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම

4. අධ්‍යාපනය සඳහා ප්‍රවේශ වීම පුළුල් කිරීම සහ ජීවිතයේ කඩඉම් වෙනස් කිරීමේ අධ්‍යාපනය සඳහා අවස්ථා වැඩි දියුණු කිරීම.

5. උසස් ගුණාත්මකභාවයෙන් යුත් අධ්‍යාපනික උපකාරක සේවා සහතික කිරීම.

6. සමාජ සහ පාරිසරික ප්‍රතිචාර්යතාව සහතික කිරීම.

උපකුලපතිතුමාගේ පණිවිඩය



ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය ශිෂ්‍යයන් සඳහා පදනම් අදියරේ සිට ආචාර්ය උපාධි අදියර දක්වා තම අධ්‍යාපනය කරගෙන යා හැකි ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම විවෘත හා දුරස්ථ ඉගෙනුම් ආයතනය වේ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ විෂය පථයට අයත් රජයේ ජාතික විශ්වවිද්‍යාල 17න් එකක් වන විවෘත විශ්වවිද්‍යාලය, නෛතික, ආයතනික හා අධ්‍යාපනය යන ක්ෂේත්‍රවලින් ශ්‍රී ලංකාවේ අනෙකුත් ජාතික විශ්වවිද්‍යාල හා සමානව ක්‍රියාකරයි. විශ්වවිද්‍යාලය අනුගමනය කරන ඉගැන්වීම් ක්‍රමවේදවල ස්වභාවය සහ අප සතුව ඇති යටිතල පහසුකම් හේතුවෙන් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය දිවයින පුරා ව්‍යාප්තව සිටින විශාල ශිෂ්‍යයන් ප්‍රමාණයකට සේවා සැපයිය හැකි තත්වයක පවතී. වර්තමානය වන විට, දිවයින පුරා පිහිටා ඇති ප්‍රාදේශීය මධ්‍යස්ථාන 9කින් හා අධ්‍යයන මධ්‍යස්ථාන 19කින් සේවා ලබා ගන්නා 45,000කට අධික ශිෂ්‍යයින් සංඛ්‍යාවක් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය තුළ ඉගෙනුම ලබයි.

විශ්වවිද්‍යාලයේ මෙහෙවර වන්නේ විවෘත හා දුරස්ථ ඉගෙනුම් ක්‍රමවේදයන් හරහා උසස් තත්වයේ, දැරිය හැකි සහ අදාළත්වයකින් යුත් අධ්‍යාපනයක් සඳහා ප්‍රවේශ පහසුකම් වැඩි දියුණු කිරීම මෙන්ම 21 වන සියවසේ අභියෝගයන්ට මුහුණ දීම සඳහා යාවජීව ඉගෙනුම් අවස්ථා වැඩි දියුණු කිරීමත්ය. මෙම මෙහෙවර සාක්ෂාත් කරගැනීම උදෙසා, විශ්වවිද්‍යාලය විසින් සැමවිටම ශිෂ්‍යයන් තම ප්‍රධාන කේන්ද්‍රය කරගනිමින් බොහෝ ක්‍රමවේදයන් අනුගමනය කරයි. විශ්වවිද්‍යාලය විසින් පීඨ 6ක් යටතේ ක්‍රියාත්මක වන අධ්‍යනාංශ 25ක් මගින් විවිධ අධ්‍යයන වැඩසටහන් 79කට අධික සංඛ්‍යාවක් පිරිනමනු ලබයි.

අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ සිදු වෙමින් පවතින තාක්ෂණික සංවර්ධනයන්ට සමගාමීව, අපගේ ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය හරහා මාර්ගගත සහාය සැපයීම ඇතුළත්ව, නවීන තාක්ෂණය තුළින් අපයේ ශිෂ්‍යයන් වෙත වැඩි ඉගෙනුම් සහයක් ලබා දීම සඳහා විශ්වවිද්‍යාලය සාමූහික ප්‍රයත්නයක් දියත් කර තිබේ. රැකියාවෙහි නියුතු වැඩිහිටියන්ට සහ සාම්ප්‍රදායික විශ්වවිද්‍යාලවලට ඇතුළත්වීමට වරම් නොලබන අය සඳහා විකල්ප මාර්ග ලබාදීමෙන් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය වෙත සුවිශේෂ ලෙස පිවිස ඇත.

ශ්‍රී ලංකා රජය විසින් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය රටේ උසස් ගුණාත්මක අධ්‍යාපනය සඳහා වැඩිවන ඉල්ලුම වෙනුවෙන් අධ්‍යාපනික සේවා සැපයීමේ වැදගත් හවුල්කරුවෙකු ලෙස බැරෑරුම් ලෙස සලකන බව අපි සතුටින් සටහන් කරමු. උසස් අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම සඳහා වන රජයේ පුළුල් දැක්මට ප්‍රතිචාර වශයෙන්, 2023 වසර තුළ නව රැකියා ඉලක්ක කරගත් උපාධි වැඩසටහන් පිරිනැමීමට විශ්වවිද්‍යාලය කටයුතු කර ඇත. රට තුළ පැවති කැළඹිලි සහිත ආර්ථික වාතාවරණය නොතකා 2023 වර්ෂය තුළ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් අතිරික්තයක් වාර්තා කරමින් විශාල පරිවර්තනයකට ලක් විය. විශ්වවිද්‍යාලය විසින් ලොව ප්‍රකට විශ්වවිද්‍යාල සමඟ ගිවිසුම්ගත වෙමින් තම ජාත්‍යන්තර ගමන් මග ශක්තිමත් කරගන්නා ලදි. ඩිජිටල්කරණ ක්‍රියාවලිය යනු ජාත්‍යන්තරකරණය කිරීමේ ඉලක්කය කරා සමීප වීම වෙනුවෙන් ඉහළ තලයකට පිවිසීමේ ප්‍රධානම නියමුවෙක් ලෙස සැලකිය හැකි ය.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය. පී.එම්.සී තිලකරත්න
උපකුලපති

පටුන

1 කොටස - සාමාන්‍ය .....

1.0 සාමාන්‍ය 1

1.1 විශ්ලේෂණය 1

1.2 පාලන අධිකාරිය 3

2 කොටස - කාර්ය මණ්ඩලය 7

2.0 කාර්ය මණ්ඩලය 8

2.1 ආයතනික ව්‍යූහය 8

2.2 කාර්ය මණ්ඩල තොරතුරු 10

3 කොටස - ශිෂ්‍ය කාර්යසාධනය 11

3.0 ශිෂ්‍ය කාර්ය සාධනය 12

3.1 බඳවා ගැනීම් 12

3.1.1 දේශීය ශිෂ්‍යයින් 12

3.1.2 විදේශීය ශිෂ්‍යයින්: 12

3.2 සම්පූර්ණ කිරීම් 13

3.2.1 උපාධි ප්‍රදානෝත්සවය 13

3.2.2 සහතික පත්‍ර ප්‍රදානෝත්සවය 13

3.3 ශිෂ්‍ය ප්‍රජාවගේ ජයග්‍රහණ 14

4 කොටස - පීඨ වාර්තා 16

4.0 පීඨ වාර්තා 17

4.1 අධ්‍යාපන පීඨය 17

4.1.1 විශ්ලේෂණය 17

4.1.2 ශිෂ්‍ය බඳවාගැනීම් සහ තනි පුද්ගල වැඩසටහන් සම්පූර්ණ කිරීම 18

4.1.3 ශිෂ්‍ය බඳවාගැනීම් සහ තනි පුද්ගල වැඩසටහන් තුළ කාර්ය මණ්ඩලය 19

4.1.4. නව පාඨමාලා/ වැඩසටහන් 19

4.1.5 මාර්ගගත පාඨමාලා 19

4.2 ඉංජිනේරු තාක්ෂණ පීඨය 22

4.2.1 විශ්ලේෂණය 22

4.2.2 ශිෂ්‍ය බඳවාගැනීම් සහ තනිපුද්ගල වැඩසටහන් සම්පූර්ණ කිරීම 24

4.2.3 ශිෂ්‍ය බඳවාගැනීම් සහ තනි පුද්ගල වැඩසටහන් තුළ කාර්ය මණ්ඩලය 24

4.2.4 නව පාඨමාලා/ වැඩසටහන් 25

4.2.5 මාර්ගගත පාඨමාලා 25

4.3 සෞඛ්‍ය විද්‍යා පීඨය 31

4.3.1 විශ්ලේෂණය 31

4.3.2 ශිෂ්‍ය බඳවාගැනීම් හා තනි පුද්ගල වැඩසටහන් සම්පූර්ණ කිරීම 34

4.3.3 ශිෂ්‍ය බඳවාගැනීම් හා තනි පුද්ගල වැඩසටහන් තුළ කාර්ය මණ්ඩලය 34

4.3.4 නව පාමාලා/ වැඩසටහන් 35
4.3.5 මාර්ගගත පාඨමාලා 35
4.4. මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය 38
4.4.1 විශ්ලේෂණය 38
4.4.2 ශිෂ්‍ය බඳවාගැනීම් හා තනි පුද්ගල වැඩසටහන් සම්පූර්ණ කිරීම 39
4.4.3 ශිෂ්‍ය බඳවාගැනීම් හා තනි පුද්ගල වැඩසටහන් තුළ කාර්ය මණ්ඩලය 40
4.4.4 නව පාඨමාලා/ වැඩසටහන් 41
4.4.5 මාර්ගගත පාඨමාලා 41
4.5 කළමනාකරණ අධ්‍යයන පීඨය 43
4.5.1 විශ්ලේෂණය 43
4.5.2 ශිෂ්‍ය බඳවාගැනීම් සහ තනි පුද්ගල වැඩසටහන් සම්පූර්ණ කිරීම 44
4.5.3 ශිෂ්‍ය බඳවාගැනීම් හා තනි පුද්ගල වැඩසටහන් තුළ කාර්ය මණ්ඩලය 44
4.5.4 නව පාඨමාලා/ වැඩසටහන් 45
4.5.5 මාර්ගගත පාඨමාලා 45
4.6 ස්වභාවික විද්‍යා පීඨය 46
4.6.1 විශ්ලේෂණය 46
4.6.2 ශිෂ්‍ය බඳවාගැනීම් සහ තනි පුද්ගල වැඩසටහන් සම්පූර්ණ කිරීම 48
4.6.3 ශිෂ්‍ය බඳවාගැනීම් සහ තනි පුද්ගල වැඩසටහන් තුළ කාර්ය මණ්ඩලය 48
4.6.4 නව පාඨමාලා/ වැඩසටහන් 49
4.6.5 මාර්ගගත පාඨමාලා 49

5 කොටස - පර්යේෂණ සහ ප්‍රකාශන 50
5.0 පර්යේෂණ හා ප්‍රකාශන 51
5.1 පර්යේෂණ ව්‍යාපෘති/ පත්‍රිකා 51
5.2 ග්‍රන්ථ/පේටන්ට් 52
5.3 සම්මාන 52
6 කොටස – මධ්‍යස්ථාන හා ඒකක 53
6.0 මධ්‍යස්ථාන සහ ඒකක 54
6.1 ප්‍රාදේශීය අධ්‍යාපන සේවා 54
6.2 පුස්තකාලය 55
6.3 කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය 56
6.4 වෘත්තීය උපදේශන ඒකකය 57
6.5 මුද්‍රණාලය සහ මධ්‍යම පොත් බෙදාහැරීමේ ඒකකය 58
6.6 ජාතික මාර්ගගත දුරස්ථ අධ්‍යාපන සේවා මධ්‍යස්ථානය 60
6.7 ජාත්‍යන්තර සබඳතා ඒකකය 61
6.8 ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය 70
6.9 අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍යය මධ්‍යස්ථානය 83
6.10 ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වන මධ්‍යස්ථානය 88

6.11 පර්යේෂණ අංශය 89
6.12 පාරිසරික අධ්‍යයන සහ තිරසාර සංවර්ධන මධ්‍යස්ථානය 92
6.13 ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමතාවය සහ සමානාත්මතාවය සඳහා වූ මධ්‍යස්ථානය 97
6.14 තත්ත්ව පාලන මධ්‍යස්ථානය 100

7 කොටස – අනාගත සැලසුම් 102
7.0 අනාගත සැලසුම් - 2024 103

8 කොටස – මූල්‍ය තොරතුරු **105**
8.0 මූල්‍ය තොරතුරු 106
8.1 පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර: 106
8.2 ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර: 106
8.3 ව්‍යාපෘති ආදායම් සහ වියදම් පිළිබඳ විස්තර (දේශීය/ විදේශීය අරමුදල් සපයන ලද) 107
8.4 මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම්): 109
8.5 මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (උත්පාදනය කළ ආදායම): 109
8.6 මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය - 2023: 109
8.7 ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය මූල්‍ය සහ භෞතික ප්‍රගතිය 110

9 කොටස - අවසාන ගිණුම් **111**
9.0 අවසාන ගිණුම් 112
9.1 2023.12.31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය 112
9.2 2022.12.31 දිනට මුල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශනය 114
9.3 2023.12.31 දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශය 146
9.4 2023.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ කොටස්වල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය 147
9.5 මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 148
9.6 අයවැය හා තත්‍ය මුදල් සංසන්දනය කිරීම පිළිබඳ ප්‍රකාශය 153
9.7 පසුගිය වර්ෂ පහ තුළ මූල්‍යමය ලෙස වැදගත් සිදුවීම් 154

10 කොටස - විගණන වාර්තා **156**
10.0 විගණන වාර්තා 157
10.1 විගණකාධිපති වාර්තාව 157
10.2 පිළිතුරු වාර්තාව 166

❖ පර්යේෂණ, නවෝත්පාදන හා ප්‍රකාශන පිළිබඳ තොරතුරු (ඉංග්‍රීසි මාධ්‍යයෙන් සඳහන් කොටසෙහි ඇමුණුම්වල ඇතුළත් වේ. පිටු අංක 175-199)

1 කොටස - සාමාන්‍ය

1.0 සාමාන්‍ය

1.1 විශ්ලේෂණය



විවෘත හා දුරස්ථ ඉගෙනුම් විශ්වවිද්‍යාලයක් ලෙස ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය ආරම්භ කරන ලද්දේ වර්ෂ 1980 ජූනි මස 19 වැනිදාය. 1978 විශ්වවිද්‍යාල පනතෙහි අංක 16 හි 23 (01) හා 18 වගන්ති ප්‍රකාරව 1980 අංක 03 දරණ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාල ආඥා පනත අනුව ද ඉන් අනතුරුව සංශෝධිත 1983 ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාල ආඥා පනත් අංක 01 හා 1996 ආඥා පනත් අංක 12 යටතේ එම ස්ථාපනය සිදු විය. මෙම ආරම්භක පියවරෙහි අවසාන අරමුණ වූයේ "යාවජීව අධ්‍යාපන අවස්ථා සැලසීමත් එමඟින් උසස් අධ්‍යාපනයට පිවිසීම තුළින් ජීවන අවස්ථා වැඩිදියුණු කර ගැනීමට සෑම පුරවැසියෙකු සතු හිමිකම සලසා දීමත්ය."

ජාතික විශ්වවිද්‍යාල පද්ධතියේ විශ්වවිද්‍යාල 15න් එකක් වන විවෘත විශ්වවිද්‍යාලය, නීතිමය, ආයතනමය හා අධ්‍යාපනය යන ක්ෂේත්‍රවලින් ශ්‍රී ලංකාවේ අනිකුත් විශ්වවිද්‍යාල හා සමානව ක්‍රියාකරයි. එසේ වුවද, වයස, පූර්ව අධ්‍යාපන සුදුසුකම්, ආදායම, භූගෝලීය සාධක සහ වෘත්තීමය වශයෙන් ඇති බාධා යන කරුණු කිසිවක් නොතකමින් උසස් අධ්‍යාපනය සඳහා ඉඩකඩ වඩාත් ප්‍රසාරණය කිරීම අරභයා විවෘත හා දුරස්ථ අධ්‍යාපන දර්ශනය කෙරෙහි එහි පවතින නිදහස් ස්වභාවය කරණකොට ගෙන අනිකුත් ජාතික තලයේ විශ්වවිද්‍යාලවලින් මෙම ආයතනය වෙන් කර දැක්විය හැකිය.

දැක්ම

"සමාන ඉගෙනුම් අවස්ථා ලබා දෙමින් ජීවිතයේ කඩඉම් වෙනස් කරන අධ්‍යාපනයේ විශිෂ්ටත්වය අත් කර ගැනීම."

මෙහෙවර

"ඉගැන්වීමේ සහ පර්යේෂණයේ විශිෂ්ටත්වය සඳහා වූ කැපවීම සහිත විවෘත, දුරස්ථ හා නම්‍යශීලී අධ්‍යාපනය හරහා යාවජීව ඉගෙනුම් අවස්ථා සැලසීම."

ශ්‍රී ලංකා රජය විසින් ලබා දෙන අරමුදල් සීමා කිරීම සහ පනවන ලද මෙහෙයුම් සීමා හේතුවෙන් 2023 වර්ෂය අභියෝගාත්මක වර්ෂයක් ලෙස සැලකිය හැකි ය. මෙම සියළු බාධා මධ්‍යයේ 2023 වර්ෂය තුළ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය සුවිශේෂී ප්‍රගතියක් වාර්තා කරන ලදි. මෙම සියළු බාධා සහ අභියෝග තිබියදීත් විශ්වවිද්‍යාලය ස්ථාවරත්වය කරා මෙහෙයවීමට ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය කටයුතු කරන ලදි. පුද්ගලිකව සමාජීය වශයෙන් සහ විශ්වවිද්‍යාල ප්‍රජාව ලෙස අපට ඇති වූ අභියෝගය වන්නේ රජයේ ප්‍රතිපත්ති මූලපිරීම්වලට අනුගත වීම සඳහා කටයුතු කිරීමයි. මෙහිදී සීමිත සම්පත් ප්‍රමාණයක් සහිතව සේවය කරමින් විශ්වවිද්‍යාලය දියුණු කිරීම සඳහා කටයුතු කිරීමට සියළුම කාර්ය මණ්ඩල සාමාජිකයින් කටයුතු කරන ලදි.

විවිධ උපාධි වැඩසටහන් සඳහා ශිෂ්‍යයින් ආකර්ෂණය කර ගැනීමට ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් විවෘත ඇතුළත් වීමේ ප්‍රතිපත්තිය සහ ස්වයං ප්‍රවර්ධන උපාය මාර්ග අනුගමනය කරනු ලබයි. රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවලින් එල්ල වූ තරඟකාරීත්වය හේතුවෙන් ශිෂ්‍ය

බඳවාගැනීමේ ක්‍රියාවලියට විවිධ ගැටළුවලට මුහුණ දීමට සිදු විය. කෙසේ වෙතත්, විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන ඩිප්ලෝමා සහ උපාධි පාඨමාලා සඳහා ඉලක්කගත ශිෂ්‍යය සංඛ්‍යාවක් ආකර්ෂණය කර ගැනීමට විශ්වවිද්‍යාලය විසින් අනුගමනය කළ ප්‍රවර්ධන උපාය මාර්ග මඟින් හැකියාව ලැබිණ.

2021-2025 වර්ෂ සඳහා සකස් කරන ලද උපාය මාර්ගික කළමනාකරණ සැලැස්ම සංශෝධනය කිරීමට විශ්වවිද්‍යාලය විසින් තීරණය කරන ලදි. මෙම සැලැස්ම මගින් විශ්වවිද්‍යාලයක් ලෙස 2028දී අප සිටිය යුතු තත්ත්වය පැහැදිලි කරයි. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය 2023 වර්ෂය වන විට ජාතිය වෙනුවෙන් වර්ෂ 43ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති බැවින් එම වර්ෂය විශ්වවිද්‍යාලයට ඉතා වැදගත් වසරක් විය. රට තුළ ගැටළුකාරී ආර්ථික තත්වයක් පැවතියද 2023 වර්ෂය තුළ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදි. 2023 වර්ෂය සඳහා භාණ්ඩාගාරය විසින් ප්‍රාග්ධන ප්‍රදාන කප්පාදු කළද සෞඛ්‍ය විද්‍යා පීඨයේ ගොඩනැගිල්ල ඉදි කිරීම අඛණ්ඩව සිදු කරන ලදි.

සියළුම අධ්‍යයන හා කළමනාකරණ කාර්යයන් සහ ඉගැන්වීම් - ඉගෙනුම් කර්යයන් සඳහා සහාය වන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) යටිතල පහසුකම් සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය සතුව පුළුල් කළමනාකරණ තොරතුරු පද්ධතියක් (OMIS) තිබුණද OMIS පද්ධතිය වැඩි දියුණු කිරීමට අවශ්‍ය විය. එමනිසා, තොරතුරු තාක්ෂණ අංශයේ අභ්‍යන්තර කාර්ය මණ්ඩලයේ නායකත්වය ඇතිව නව කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIS) වැඩි දියුණු කිරීමේ ක්‍රියාවලියක් විශ්වවිද්‍යාලය විසින් ආරම්භ කරන ලදි. මෙම ව්‍යාපෘතිය OMIS enhancement project ලෙස නම් කර ඇත.

එසේම, තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් ඉහළ නැංවීම සිදු කළ අතර විශ්වවිද්‍යාලය විසින් අධි අභිසාරී සේවාදායක පද්ධතියක් ස්ථාපිත කරන ලදි. අධි අභිසාරී සේවාදායක පද්ධතියක් ස්ථාපිත කිරීම මඟින් විශ්වවිද්‍යාලයීය තොරතුරු තාක්ෂණ සේවාවල කාර්යක්ෂමතාව වර්ධනය විය. විශ්වවිද්‍යාලය විසින් රථයක් (motor coach) මිලදී ගත් අතර එය ජංගම රසායනාගාරයක් බවට පරිවර්තනය කරන ලදි. මෙම ව්‍යාපෘතිය සඳහා ලෝක බැංකුවේ AHEAD ව්‍යාපෘතිය මඟින් සම්පූර්ණයෙන් අරමුදල් සපයනු ලැබේ.

වෘත්තීය උපදේශන ඒකකය විසින් රැකියා වෙළඳපොළක් සංවිධානය කළ අතර එය අනෙකුත් විශ්වවිද්‍යාල සහ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවල උපාධි අපේක්ෂකයින් සඳහා විවෘත විය. රැකියා වෙළඳපොළට සමගාමීව, උපාධි අපේක්ෂකයින්ට රැකියා සහ රැකියා පුහුණු අවස්ථා ලබා ගැනීම සඳහා වෙබ් අඩවියක් වෘත්තීය උපදේශන ඒකකය විසින් හඳුන්වා දෙන ලදි.

විවෘත විශ්වවිද්‍යාලයීය වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණය iOURS-2023 සම්පූර්ණ මාර්ගගත ජාත්‍යන්තර සම්මන්ත්‍රණයක් ලෙස සාර්ථකව පවත්වන ලදි. විවෘත විශ්වවිද්‍යාලයීය වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණයට සමගාමීව විශ්වවිද්‍යාලය විසින් ආචාර්ය උපාධි සම්මන්ත්‍රණයක් සහ මිනිත්තු 3ක උපාධි නිබන්ධන තරඟයක් සංවිධානය කරන ලදි.

රත්නපුර ප්‍රදේශීය මධ්‍යස්ථානය අලුත්වැඩියා කිරීමේ කටයුතු ශ්‍රී ලංකා යුද හමුදාවට බාර දෙන ලදි. ශ්‍රී ලංකා යුද හමුදාව විසින් අළුත්වැඩියා කිරීමේ කටයුතු සඳහා නොමිලේ ශ්‍රම දායකත්වය සපයන ලද අතර විශ්වවිද්‍යාලය විසින් ද්‍රව්‍ය පිරිවැය දරන ලදි. ඕනෑම අධ්‍යාපන ආයතනයක අවධාරණය කළ යුතු වැදගත් විෂය ක්ෂේත්‍රයක් වන්නේ අධ්‍යයන වැඩසටහන්වල ගුණාත්මකභාවය වේ. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන අධ්‍යයන වැඩසටහන්වල ගුණාත්මකභාවය සහ අදාළතාව වැඩි දියුණු කිරීම සඳහා කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් තත්ව පාලන මධ්‍යස්ථානය හා එක්ව වැඩමුළු පවත්වන ලදි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව පරිපාලනය කිරීමේ කවුන්සිලය විසින් 2023 වර්ෂය සඳහා උපාධි වැඩසටහන් 7ක් ඇගයීමට ලක් කරන ලදි.

විශ්වවිද්‍යාලයීය ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය විසින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර විශේෂයෙන් කෘෂිකර්මාන්තයේ සහ ආහාර කර්මාන්තයේ සහයෝගීතා ව්‍යාපෘති සඳහා එම කර්මාන්ත සමඟ හවුල්කාරීත්වයකට එළඹීමේ ක්‍රියාවලියකට අවතීර්ණ විය.

විශ්වවිද්‍යාලය විසින් ලබා දී ඇති අවස්ථාව තෝරාගත්, රැකියාවෙහි නියුතු වැඩිහිටියන්ට සහ තරුණ ප්‍රජාවට අධ්‍යාපනය සඳහා විකල්ප මාර්ග සැපයීම මඟින් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයට සුවිශේෂී ලෙස පිවිස ඇත. තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය, සැපයුම් සහ සැපයුම් දාම කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය සහ චක්‍රීය ආර්ථිකය සඳහා බලශක්තිය පිළිබඳ විද්‍යාපති උපාධිය ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් 2023 වර්ෂය තුළ හඳුන්වා දෙන ලදි. චක්‍රීය ආර්ථිකය සඳහා බලශක්තිය පිළිබඳ විද්‍යාපති උපාධිය සඳහා යුරෝපා සංගමය විසින් සම්පූර්ණ අනුග්‍රහය දක්වන ලද අතර ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය ප්‍රධාන සම්බන්ධීකාරක ලෙස කටයුතු කරනු ලබයි. මෙම වැඩසටහන ව්‍යූහගත කර ඇති ආකාරයට අනුව ශිෂ්‍යයින් ප්‍රථම අධ්‍යයන වර්ෂය සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය තුළ ලියාපදිංචි වන අතර පිළිවෙලින් පේරාදෙණිය, මොරටුව සහ රුහුණ විශ්වවිද්‍යාලවලින් පිරිනමන විශේෂීකරණ ක්ෂේත්‍රයන්ට අනුකූලව දෙවන අධ්‍යයන වර්ෂයේ අධ්‍යයන කටයුතු සිදු කරනු ලබයි.

ඉංජිනේරු තාක්ෂණ පීඨය විසින් පිරිනමනු ලබන තාක්ෂණවේදී (ගෞරව) උපාධිය විද්‍යාවේදී ගෞරව ඉංජිනේරු උපාධිය ලෙස නැවත නම් කරන ලදි. 2023 වර්ෂය තුළ මෘදුකාංග ඉංජිනේරු අධ්‍යනාංශය සහ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයක් ස්ථාපිත කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යෝජනා ඉදිරිපත් කරන ලදි.

ශ්‍රී ලංකා රජය උසස් අධ්‍යාපන ආයතනයකට ඇතුළත් වීමට සුදුසුකම් ඇති සියලුම දෙනාට අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය පුළුල් කිරීමට උනන්දු වන අතර ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය එම වැඩිවන ඉල්ලුමට ප්‍රතිචාර දැක්වීම සඳහා වැදගත් හවුල්කරුවෙකු ලෙස සලකන බව සඳහන් කල හැකි ය. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ සක්‍රීය දායකත්වයත් සමඟ මෙම ඉලක්කය සපුරා ගැනීමට රටට හැකි වනු ඇතැයි විවෘත විශ්වවිද්‍යාලය විශ්වාස කරයි.

1.2 පාලන අධිකාරිය

විශ්වවිද්‍යාලයේ කුලපති: මහාචාර්ය. ධම්මික ඒ. තන්ත්‍රිගොඩ

විශ්වවිද්‍යාලයීය පාලක සභාව:

නිල බලයෙන් සාමාජික:

උපකුලපති: ජ්‍යෙෂ්ඨ මහාචාර්ය. පී.එම්.සී තිලකරත්න

පීඨාධිපතිවරු:

අධ්‍යාපන පීඨය:	මහාචාර්ය. එස්.කුගමූර්ති
	ආචාර්ය. ඩී.වී.එම් ද සිල්වා මිය(2023.03.09 දින සිට)
ඉංජිනේරු තාක්ෂණ පීඨය:	මහාචාර්ය. එච්.පී.ජී.ඒ රත්නවීර
සෞඛ්‍ය විද්‍යා පීඨය:	ආචාර්ය. බී.එස්.එස්. ද සිල්වා
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය:	මහාචාර්ය.ඩී.ඩී.ඒ. පියරත්න
ස්වභාවික විද්‍යා පීඨය:	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය. ජී.ඩබ්ලිව්.ඒ.ආර්. ප්‍රනාන්දු
කළමනාකරණ පීඨය:	මහාචාර්ය. එන්. අබේසේකර

සනාතන සභාව විසින් පත් කළ සාමාජිකයින් වනුයේ,

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය. එස්.ආර්. වීරකෝන්
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය. සී.එස්. ද සිල්වා

උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පත් කළ සාමාජිකයා වනුයේ,

කේ.ආර්. උඩුවාවල මහතා

රාජ්‍ය තොරතුරු අමාත්‍යාංශය විසින් පත් කළ සාමාජිකයා වනුයේ,

ඩී.පී.යූ වේලාරත්න මෙය

උපකුලපතිවරුන් සහ අධ්‍යක්ෂවරුන්ගේ කමිටුව විසින් පත් කළ සාමාජිකයා වනුයේ,

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය. එච්.ඩී. කරුණාරත්න

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරන ලද සාමාජිකයින් වනුයේ,

මහාචාර්ය. රංජිත් සේනාරත්න
ආචාර්ය. ප්‍රසාද් සමරසිංහ
ආචාර්ය. ජේ.ජී.එල්.එස්. ජයසේකර
ආචාර්ය. එන්.සී. කුමාරසිංහ
ඉංජිනේරු රංජිත් ජී රූබසිංහ
රූබන් වික්‍රමාරච්චි මහතා
තිස්ස නන්දසේන මහතා
නුවන් විතානගේ මහතා
තුසාන්ත විජේමාන්න මහතා
කේ.ටී.කේ ප්‍රසන්න අරම්පත් මහතා
ගයානි ද අල්විස් මෙය

පාලක සභාවේ ලේකම්

ලේඛකාධිකාරී: ඩබ්ලිව්.එල්.වින්ධ්‍යා ජයසේන මිය

විශ්වවිද්‍යාලයීය සනාතන සභාව:

නිල බලයෙන් සාමාජික:

උපකුලපති: **ජ්‍යෙෂ්ඨ මහාචාර්ය. පී.එම්.සී තිලකරත්න**

පීඨාධිපතිවරු:

අධ්‍යාපන පීඨය:	මහාචාර්ය. එස්.කුගමූර්ති ආචාර්ය. ඩී.වී.එම් ද සිල්වා මිය(2023.03.09 දින සිට)
ඉංජිනේරු තාක්ෂණ පීඨය:	මහාචාර්ය. එච්.පී.ජී.ඒ රත්නවීර
සෞඛ්‍ය විද්‍යා පීඨය:	ආචාර්ය. බී.එස්.එස්. ද සිල්වා
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය:	මහාචාර්ය.ඩී.ඩී.ඒ. පියරත්න
කළමනාකරණ පීඨය:	මහාචාර්ය. එන්. අබේසේකර
ස්වභාවික විද්‍යා පීඨය:	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය. ජී.ඩබ්ලිව්.ඒ.ආර්. ප්‍රනාන්දු

අධ්‍යක්ෂවරු

අධ්‍යක්ෂ/ඉංග්‍රීසි පශ්චාත් උපාධි ආයතනය:	ආචාර්ය. රොමෝලා රසූල්
වැඩබලන අධ්‍යක්ෂ/ අධ්‍යාපන තාක්ෂණික සහ මාධ්‍යය මධ්‍යස්ථානය:	මහාචාර්ය. සී.එස්. ද සිල්වා
වැඩබලන අධ්‍යක්ෂ/ ප්‍රාදේශීය අධ්‍යාපන සේවා:	අනුෂ්ක බණ්ඩාර මහතා

අධ්‍යනාංශ ප්‍රධානීන්

ප්‍රධානී/ මුල් ළමාවිය සහ ප්‍රාථමික අධ්‍යාපන:	ආචාර්ය. ටී. මුකුන්තන්
ප්‍රධානී/ ද්විතීයික හා තෘතීයික අධ්‍යාපන:	මහාචාර්ය. ඩබ්ලිව්.එම්.එස්.වනසිංහ
ප්‍රධානී/ විශේෂ අවශ්‍යතා අධ්‍යාපන:	ආචාර්ය.එස්.එන්. ජයසිංහ මෙය
ප්‍රධානී/ අධ්‍යාපන නායකත්ව හා කළමනාකරණ:	ඩබ්ලිව්.එම්.එස්. වීරකෝන් මහතා
ප්‍රධානී/ කෘෂිකාර්මික සහ වැවිලි ඉංජිනේරු විද්‍යාව:	ආචාර්ය. ඒ.ජී.බී අරුග්ගොඩ මෙය
ප්‍රධානී/ පේෂකර්ම සහ ඇඟළුම් තාක්ෂණය:	ආචාර්ය. ඩී. එස්. විජේරත්න
ප්‍රධානී/ සිවිල් ඉංජිනේරු:	මහාචාර්ය. ටී.එම් පල්ලේවත්ත
ප්‍රධානී/ කෘෂිකාර්මික සහ වැවිලි ඉංජිනේරු විද්‍යාව:	ආචාර්ය. ඒ.ජී.බී අරුග්ගොඩ මෙය
ප්‍රධානී/ පේෂකර්ම සහ ඇඟළුම් තාක්ෂණය:	ආචාර්ය. ඩී. එස්. විජේරත්න
ප්‍රධානී/ සිවිල් ඉංජිනේරු:	මහාචාර්ය. ටී.එම් පල්ලේවත්ත
ප්‍රධානී/ විදුලි සහ පරිගණක ඉංජිනේරු:	එච්. පැස්කුවල් මෙය
ප්‍රධානී/ ගණිත සහ ඉංජිනේරු විද්‍යාවේ දර්ශණය:	ජී. නන්දසේන මහතා
ප්‍රධානී/ යාන්ත්‍රික ඉංජිනේරු:	ආචාර්ය.අයි.යූ. අත්තනායක මෙය
ප්‍රධානී/ භාෂා අධ්‍යයන:	ආචාර්ය. කේ.චන්ද්‍රමෝහන් මෙය
ප්‍රධානී/ සමාජ අධ්‍යයන:	ආචාර්ය. එස්. පත්මනීසන්
ප්‍රධානී/ නීති අධ්‍යයන:	
ප්‍රධානී/ නීති අධ්‍යයන:	ආචාර්ය. ඩබ්ලිව්.ඒ.එස්.එස් විජේසිංහ
ප්‍රධානී/ ඉංග්‍රීසි භාෂා ඉගැනවීම්:	ආචාර්ය. එස්.ඒ.ඒ.කේ සතරසිංහ
ප්‍රධානී/ ගණිත:	ආචාර්ය. එච්.ඕ.ඩබ්ලිව් පීරිස්
ප්‍රධානී/ පරිගණක විද්‍යා:	ආචාර්ය. එම්. පුංචිමුදියන්සේ
ප්‍රධානී/ භෞතික විද්‍යා:	ආචාර්ය. ජේ.වී.පී ප්‍රනාන්දු
ප්‍රධානී/ රසායන විද්‍යා:	එම්. තයාපරන් මෙය
ප්‍රධානී/ උද්භිද විද්‍යා:	ආචාර්ය. කේ.ඒ.ජේ.එම් කුරුප්පුආරච්චි
ප්‍රධානී/ සත්ව විද්‍යා:	ආචාර්ය. ටී.එස්.පී ප්‍රනාන්දු
ප්‍රධානී/ වෛද්‍ය රසායනාගාර විද්‍යා:	ආචාර්ය. ඩී.ටී විජේරත්න මෙය
ප්‍රධානී/ ඖෂධ විද්‍යා:	ආර්.බී.ජේ බුද්ධිකා මෙය
ප්‍රධානී/ හෙද විද්‍යා:	ආචාර්ය.කේ.ඒ ශ්‍රියානි මෙය
ප්‍රධානී/ මනෝවිද්‍යා සහ උපදේශන:	ආචාර්ය. බී.ජී.ආර්. ද සිල්වා
ප්‍රධානී/ මූලික විද්‍යා:	ආචාර්ය. ඕ.කේ.ඩී.යූ.පී නිශ්ශංක
ප්‍රධානී/ අලෙවිකරණ කළමනාකරණ:	ආචාර්ය.එස්.ජේ.එම්.පී.යූ සෙනෙවිරත්න මෙය
ප්‍රධානී/ සංවිධාන අධ්‍යයන:	ආචාර්ය. එස්.එස්.කේ එදිරිසිංහ
ප්‍රධානී/ ගිණුම්කරණය හා මූල්‍ය:	මහාචාර්ය.එච්.ඩී.ඩී.සී ලියනගමගේ
ප්‍රධානී/ මානව සම්පත් කළමනාකරණය:	කේ.පී නිශාන්ත මහතා

ජ්‍යෂ්ඨ මහාචාර්යවරුන්

රසායන විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය:	ජ්‍ය. මහාචාර්ය.කේ.එස්.ඩී.පෙරේරා
පේෂකර්ම සහ ඇඟළුම් තාක්ෂණය පිළිබඳ : ජ්‍යෙෂ්ඨ මහාචාර්ය:	ජ්‍ය. මහාචාර්ය. එස්.ඒ. අරියදුරෙයි
භෞතික විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය:	ජ්‍ය. මහාචාර්ය. ජේ.සී.එන් රාජේන්ද්‍ර
නීති අධ්‍යයනය පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය:	ජ්‍ය. මහාචාර්ය.සී.ඊ ගුණරත්න
සත්ව විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය:	ජ්‍ය. මහාචාර්ය. ජී.ආර්.ආර් රණවක
අධ්‍යාපනික තාක්ෂණය පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය:	ජ්‍ය. මහාචාර්ය. එස්.පී. කරුණානායක
භෞතික විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය:	ජ්‍ය. මහාචාර්ය. වී.පී.එස් පෙරේරා
සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය:	ජ්‍ය. මහාචාර්ය. ඩී.ඒ.ආර්. දොලගේ
භෞතික විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය:	ජ්‍ය. මහාචාර්ය. වී.පී.එස්. පෙරේරා
සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය:	ජ්‍ය. මහාචාර්ය. ඩී.ඒ.ආර්. දොලගේ

මහාචාර්යවරුන්

පේෂකර්ම සහ ඇඟළුම් තාක්ෂණය පිළිබඳ මහාචාර්ය:	මහාචාර්ය. සී.එන් හේරත්
යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ මහාචාර්ය:	මහාචාර්ය.එස්.ඒ.එම්.ඒ.එන්.එස් සේනානායක
කළමනාකරණ අධ්‍යයන පිළිබඳ මහාචාර්ය:	මහාචාර්ය.වී. සිවලෝගතාසන්
පාරිසරික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ මහාචාර්ය: සහ අධ්‍යක්ෂ/ පාරිසරික අධ්‍යයනය හා තිරසාර සංවර්ධන මධ්‍යස්ථානය	මහාචාර්ය.බී.සී.එල් අතපත්තු
භෞතික විද්‍යාව පිළිබඳ මහාචාර්ය:	මහාචාර්ය.ජී.කේ.ආර් සේනාධීර
රසායන විද්‍යාව පිළිබඳ මහාචාර්ය:	මහාචාර්ය.එස්.ආර් හෙට්ටිආරච්චි
උද්භිද විද්‍යාව පිළිබඳ මහාචාර්ය:	මහාචාර්ය.එච්.එල්.ඩී වීරහේවා
විදුලි හා පරිගණක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ මහාචාර්ය:	මහාචාර්ය. එච්.යූ.ඩබ්ලිව්. රත්නායක
ද්විතීයික හා තෘතීයික අධ්‍යාපනය පිළිබඳ මහාචාර්ය:	මහාචාර්ය. එෆ්.එම්. නවස්තීන්
ගිණුම්කරණය සහ මූල්‍ය පිළිබඳ මහාචාර්ය:	මහාචාර්ය. එල්.පී.එස් ගාමිණී
අණුක ජීව විද්‍යාව පිළිබඳ මහාචාර්ය:	මහාචාර්ය. කේ.විවේහනාතන් මෙය
භාෂා අධ්‍යයනය පිළිබඳ මහාචාර්ය:	මහාචාර්ය. කේ.ආර්.එම්. ද සිල්වා මෙය
රසායන විද්‍යාව පිළිබඳ මහාචාර්ය:	මහාචාර්ය.ආර්.එම්.ආර්.පී රත්නායක මෙය

පුස්තකාලයාධිපති

නියෝජ්‍ය පුස්තකාලයාධිපති:	ආචාර්ය.අයි.එම්. නවරත්න

පීඨ නියෝජිතයින්

නියෝ/ අධ්‍යාපන පීඨය:	එම්.එල්. සුදර්ශන මහතා
නියෝ/ ඉංජිනේරු තාක්ෂණ පීඨය:	ආචාර්ය.එස්.ඩී.ආර්. පෙරේරා
නියෝ/ ඉංජිනේරු තාක්ෂණ පීඨය:	සී.ජේ. බස්නායකගේ මහතා
නියෝ/ මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨය:	ආචාර්ය.එන්.කේ. අබේසේකර
නියෝ/ මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨය:	ආචාර්ය. ටී.ඒ වික්‍රමසිංහ
නියෝ/ ස්වභාවික විද්‍යා පීඨය:	කේ.ඩී.වී.එෆ්. සිරිවර්ධන මෙය
නියෝ/ ස්වභාවික විද්‍යා පීඨය:	ඩබ්ලිව්.සී. උඩුවෙල මෙය
නියෝ/ සෞඛ්‍ය විද්‍යා පීඨය:	පී.ඩබ්ලිව්.ජී.ඩී.පී. සමරසේකර මෙය
නියෝ/ සෞඛ්‍ය විද්‍යා පීඨය:	ආචාර්ය. එම්.පී. දිසානායක
නියෝ/ කළමනාකරණ අධ්‍යයන පීඨය:	එස්. මොනෝෂිකා මෙය
නියෝ/ කළමනාකරණ අධ්‍යයන පීඨය:	එස්.ඒ.ඩී. සේනානායක මහතා

ලේකම්

නියෝජ්‍ය ලේඛකාධිකාරී/අධ්‍යයන පරිපාලන	පී.කේ. සෙනෙවිරත්න මහතා

විශ්වවිද්‍යාලයීය නිලධාරීන්:

උපකුලපති:	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය. පී.එම්.සී තිලකරත්න
ලේඛකාධිකාරී:	ඩබ්ලිව්.එල්.වී. ජයසේන මෙය
අධ්‍යාපන පීඨය:	ආචාර්ය. ඩී.වී.එම් ද සිල්වා මෙය
ඉංජිනේරු තාක්ෂණ පීඨය:	ආචාර්ය. එච්.ජී.පී.ඒ. රත්නවීර
සෞඛ්‍ය විද්‍යා පීඨය:	ආචාර්ය. බී. සුනිල් එස්. ද සිල්වා
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය:	මහාචාර්ය. ඩී.ඩී.ඒ. පියරත්න
කළමනාකරණ අධ්‍යයන පීඨය:	මහාචාර්ය.එන්. අබේසේකර
ස්වභාවික විද්‍යා පීඨය:	මහාචාර්ය. ජී.ඩබ්ලිව්.ඒ. රොහාන් ප්‍රනාන්දු
වැඩබලන පුස්තකාලයාධිපති:	අයි.එම්. නවරත්න මහතා
මූල්‍යාධිකාරී:	ආචාර්ය. ඩබ්ලිව්.එම්.කේ.ජී.ඒ වික්‍රමසිංහ
වැඩබලන අධ්‍යක්ෂ/ අධ්‍යාපනික තාක්ෂණික සහ මාධ්‍ය මධ්‍යස්ථානය:	මහාචාර්ය.සී.එස්. ද සිල්වා
වැඩබලන අධ්‍යක්ෂ/ ප්‍රාදේශීය අධ්‍යාපන සේවා:	අනුෂ්ක බණ්ඩාර මහතා

2 කොටස - කාර්ය මණ්ඩලය


2.0 කාර්ය මණ්ඩලය

2.1 ආයතනික ව්‍යූහය

විවෘත විශ්වවිද්‍යාලයේ ආයතනික ව්‍යූහය (රූපසටහන 2) සාම්ප්‍රදායික විශ්වවිද්‍යාලයක ආයතනික ව්‍යූහය හා බෙහෙවින් එක සමාන වන අතර විවෘත හා දුරස්ථ අධ්‍යාපනික විශ්වවිද්‍යාලවලට විශේෂිත වූ අමතර තනතුරු එනම් අධ්‍යක්ෂ තනතුරු යනාදියත්, ප්‍රාදේශීය අධ්‍යාපනික සේවාවන්, අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍යය මධ්‍යස්ථානය යනාදී සේවාවලින් පමණක් වෙනස්කමක් දක්වයි. කුලපති තනතුර ගෞරවාන්විත තනතුරක් වන අතර උපකුලපතිවරයා ප්‍රධාන විධායක නිළධාරී සහ ගිණුම් නිළධාරී වේ. ලේඛකාධිකාරී ආයතනයෙහි පරිපාලනය, ආයතන සතු ලිපි ලේඛන හා වත්කම්වලට වගකිව යුතු වේ. ලේඛකාධිකාරී විශ්වවිද්‍යාලයේ සහකාර ගිණුම් නිළධාරී වේ. අනෙක් නිළධාරීන් වනුයේ පීඨාධිපතිවරුන්, අධ්‍යක්ෂ/ අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍යය මධ්‍යස්ථානය, අධ්‍යක්ෂ/ ප්‍රාදේශීය අධ්‍යාපන සේවා, පුස්තකාලයාධිපති හා මූල්‍යාධිකාරීවරයා වේ.

මීට අමතරව විශ්වවිද්‍යාල කටයුතු පුළුල් කිරීම හා අධීක්ෂණය කිරීම සඳහා එම අංශවල අර්ධකාලීන අධ්‍යක්ෂවරුන් ලෙස ජ්‍යෙෂ්ඨ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ ප්‍රධානත්වයෙන් ඒකක කිහිපයක් විශ්වවිද්‍යාලය විසින් ස්ථාපිත කර ඇත. උදාහරණයක් ලෙස,

- ප්‍රාදේශීය අධ්‍යාපන සේවා
- වෘත්තීය උපදේශන ඒකකය
- කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය
- මුද්‍රණාලය සහ මධ්‍යම පොත් බෙදාහැරීමේ ඒකකය
- ජාතික මාර්ගගත දුරස්ථ අධ්‍යාපන සේවය
- ජාත්‍යන්තර සබඳතා ඒකකය
- ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය
- අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍යය මධ්‍යස්ථානය
- උපදේශන සහ බාහිර සම්පත් මධ්‍යස්ථානය
- පර්යේෂණ ඒකකය
- පාරිසරික අධ්‍යයනය හා තිරසාර සංවර්ධන මධ්‍යස්ථානය
- ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සාධාරණත්වය සහ සමානාත්මතාවය
- තොරතුරු තාක්ෂණ අධ්‍යාපන සේවා මධ්‍යස්ථානය
- තත්ත්ව පාලන මධ්‍යස්ථානය



රූපසටහන 1 - ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ආයතනික ව්‍යූහය

2.2 කාර්ය මණ්ඩල තොරතුරු

විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩලයට 2023 වර්ෂය වන විට අධ්‍යයන කාර්ය මණ්ඩලය (ස්ථිර) **351**ක් ද අනධ්‍යයන පරිපාලන කාර්ය මණ්ඩලය (ස්ථිර) **65**ක් ද, අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය **14**ක් හා අනධ්‍යයන පරිපාලන නොවන කාර්ය මණ්ඩලය **606**ක් ද ඇතුලත් වූහ.

සේවා කාණ්ඩය	වැටුප් කේතය	වර්තමාන කාර්ය මණ්ඩලය		
		ස්ථිර		
		පුරුෂ	ස්ත්‍රී	එකතුව
ප්‍රාථමික මට්ටම				
ප්‍රාථමික ශ්‍රේණිය — නුපුහුණු	PL-1	109	17	126
ප්‍රාථමික ශ්‍රේණිය — අර්ධ පුහුණු	PL-2	30	1	31
ප්‍රාථමික ශ්‍රේණිය — පුහුණු	PL-3	47	0	47
ද්විතියික මට්ටම				
කළමනාකාර සහකාර — තාක්ෂණික නොවන	U-MN I	92	142	234
කළමනාකාර සහකාර — තාක්ෂණික	U-MT I	50	13	63
සහාය නිලධාරීන් — 2 කාණ්ඩය	U-MN2	4	1	5
සහාය නිලධාරීන් —1 කාණ්ඩය	U-MN3	8	2	10
මාණ්ඩලික සහකාර / විශේෂ සහ ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික සහකාර	U-MN4	21	69	90
තෘතියික මට්ටම				
අධ්‍යයන සහාය — 2 කාණ්ඩය	U -AS1	1	0	1
කණිෂ්ඨ විධායක / කළමනාකාරවරුන්	U -EX1	25	17	42
අධ්‍යයන සහාය —1 කාණ්ඩය	U -AS2	9	4	13
ජ්‍යෙෂ්ඨ මට්ටම				
වෛද්‍ය නිලධාරී	U-MO 1			
ප්‍රධාන වෛද්‍ය නිලධාරී	U-MO 2			
මධ්‍යම මට්ටමේ විධායකයින්	U-EX2	12	8	20
මධ්‍යම මට්ටමේ විධායකයින්	U-EX 2(a)			
ජ්‍යෙෂ්ඨ විධායකයින්	U-EX3	2	1	3
කථිකාචාර්ය	U-AC 3	123	194	317
සහාය මහාචාර්ය	U-AC 4			
මහාචාර්යවරුන් / ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන්	U-AC 5	19	15	34
එකතුව		**552**	**484**	**1036**

1 වගුව: ස්ථිර කාර්ය මණ්ඩලය

3 කොටස - ශිෂ්‍ය කාර්යසාධනය

3.0 ශිෂ්‍ය කාර්ය සාධනය

3.1 බඳවා ගැනීම්

3.1.1 දේශීය ශිෂ්‍යයින්

2023 වර්ෂයේ සම්පූර්ණ ශිෂ්‍ය බඳවාගැනීම් සංඛ්‍යාව **40679**ක් විය.

බඳවාගැනීමේ අදියර	පීඨය							
	ඉංජිනේරු තාක්ෂණ	මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා	කළමනාකරණ අධ්‍යයන	අධ්‍යාපන	ස්වභාවික විද්‍යා	සෞඛ්‍ය විද්‍යා	ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය	එකතුව
සහතික පත්‍ර	43	83	710	956	1351	-	-	**3143**
ඩිප්ලෝමා	2	51	153	-	159	-	-	**365**
උපාධි	5272	3447	8946	4553	4706	3400		**30324**
පශ්චාත් උපාධි ඩිප්ලෝමා	-	4396	-	-	-	-	-	**4396**
ශාස්ත්‍රපති	214	542	73	223	17	39		**1108**
StART@OUSL*	-	-	-	-	-	-	1296	**1296**
වෙනත්	-	-	-	-	-	-	-	**0**
දර්ශනශූරි/ දර්ශනපති	18	6	3	4	15	1	-	**47**
එකතුව	**5549**	**8525**	**9885**	**5736**	**6248**	**3440**	**1296**	**40679**

2 වගුව: 2022 වසරේ ශිෂ්‍ය බඳවාගැනීම් දේශීය

3.1.2 විදේශීය ශිෂ්‍යයින්:

පීඨය	වැඩසටහන	සංඛ්‍යාව
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය	තරුණ හා ප්‍රජා සංවර්ධනය ශාස්ත්‍රවේදී උපාධිය	02
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය	පොදු රාජ්‍ය මණ්ඩල විධායක ව්‍යාපාරපති /පරිපාලනපති උපාධිය	01

3 වගුව: 2022 වසරේ ශිෂ්‍ය බඳවාගැනීම් විදේශීය

3.2 සම්පූර්ණ කිරීම්

3.2.1 උපාධි ප්‍රදානෝත්සවය

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ 2023 (i) වන උපාධි ප්‍රදානෝත්සවය 2023 දෙසැම්බර් 13 සහ 14 වන දිනවල බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්විණි. ප්‍රථම උපාධි හා පශ්චාත් උපාධි යන අදියර යටතේ ශිෂ්‍යයින් 4016දෙනෙක් උපාධි වරම් ලැබූහ. ඔවුන් විශ්වවිද්‍යාලයේ පීඨ 4ක් පමණක් නියෝජනය කරන ලදි.

පීඨය	ආචාර්ය උපාධි	දර්ශනපති	ශාස්ත්‍රපති/ විද්‍යාපති	පශ්චාත් උපාධි ඩිප්ලෝමා	උපාධි	එකතුව
අධ්‍යාපන	-	-	494	36	395	**925**
ඉංජිනේරු තාක්ෂණ	-	1	73	-	365	**439**
සෞඛ්‍ය විද්‍යා	-	-	-	-	591	**591**
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා	1	-	24	2	1054	**1081**
කළමනාකරණ අධ්‍යයන	-	-	40	31	387	**458**
ස්වභාවික විද්‍යා	1	-	47	1	473	**522**
එකතුව	**2**	**1**	**678**	**70**	**3265**	**4016**

4 වගුව : පීඨ අනුව උපාධි ප්‍රදාන

3.2.2 සහතික පත්‍ර ප්‍රදානෝත්සවය

ඉංජිනේරු තාක්ෂණ පීඨයේ 2023 වර්ෂයට අදාළ සහතික පත්‍ර ප්‍රදානෝත්සවය මෙතෙක් පවත්වා නොමැත.

ප්‍රදාන / පීඨය	උසස් ඩිප්ලෝමා	ඩිප්ලෝමා	උසස් සහතික පත්‍ර	සහතික පත්‍ර	එකතුව
අධ්‍යාපන		55	16	32	103
ඉංජිනේරු තාක්ෂණ					-
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා		40		03	43
සෞඛ්‍ය විද්‍යා					-
කළමනාකරණ අධ්‍යයන	323		123		446
ස්වභාවික විද්‍යා	17				17
එකතුව	**340**	**95**	**139**	**35**	**609**

5 වගුව : පීඨය අනුව සහතික පත්‍ර ප්‍රදාන

3.3 ශිෂ්‍ය ප්‍රජාවගේ ජයග්‍රහණ

<u>රන් පදක්කම් සහ තිළිණ ලැයිස්තුව - උපාධි ප්‍රදානෝත්සවය 2023 (I)</u>

1. 2022 - ඉඩම් නීතිය පිළිබඳ හොඳම ශිෂ්‍යයා සඳහා වන ප්ලැසිඩස් විජේසේකර අනුස්මරණ තිළිණ ප්‍රදානය

සාවේරිමුතු ඇන්තනිදාස් මහතා

2. 2022 - නීති විද්‍යාව සඳහා වන ඇතුලත්මුදලි තිළිණ ප්‍රදානය

එදිරිමාන්නගේ අනූෂා දිල්හානි මිය

3. 2022 - නීතිය සඳහා වන ක්‍රිශාන්ති විජේතුංග ද සිල්වා අනුස්මරණ රන් පදක්කම

හේරත් පතිරන්නැහැලාගේ චමෝද්‍යා දෙව්රංගි විජේරත්න

4.2022 - කෘෂිකර්මය පිළිබඳ කර්මාන්ත අධ්‍යනවේදී (ගෞරව) උපාධිය වෙනුවෙන් හොඳම ශිෂ්‍යයා සඳහා වන අසී ඇනට් ද සිල්වා රන් පදක්කම

හේවා කොපරගේ බිනෝරි වත්සලා

5. 2022 - මෘදුකාංග ඉංජිනේරුවේදී (ගෞරව) හොඳම ශිෂ්‍යයා සඳහා වන වර්චුසා අධ්‍යයන විශිෂ්ටතා රන් පදක්කම

වෙඩිප්පුලි ආරච්චිගේ හිමාල් සඳරුවන් මහතා

6. 2022 - ඉංජිනේරුවේදය පිළිබඳ තාක්ෂණවේදී (ගෞරව) උපාධිය/ ඉංජිනේරුවේදය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධි හොඳම ශිෂ්‍යයා සඳහා වන ඕ.පී. කුල්ශේෂ්ත්‍ර රන් පදක්කම

වැලිවත්තගේ දොන්. කුෂාන් කවීශ වැලිවත්ත

7. 2022 - මෙකාට්‍රොනික්ස් ඉංජිනේරුවේදය පිළිබඳ තාක්ෂණවේදී (ගෞරව) උපාධිය/ ඉංජිනේරුවේදය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධි හොඳම ශිෂ්‍යයා සඳහා වන එස්.එම්. අබේගුණසේකර ද සිල්වා රන් පදක්කම

වැලිවත්තගේ දොන්. කුෂාන් කවීශ වැලිවත්ත

8. 2022 - සිවිල් ඉංජිනේරුවේදය පිළිබඳ තාක්ෂණවේදී (ගෞරව) උපාධිය/ ඉංජිනේරුවේදය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධි හොඳම ශිෂ්‍යයා සඳහා වන රන් පදක්කම

මානගේ හසිත සංජීව ප්‍රේමසිරි මහතා

9. 2022 - ඉංජිනේරු විද්‍යාව පිළිබඳ තාක්ෂණවේදී (ගෞරව) උපාධි පාඨමාලාවේ හොඳම ව්‍යාපෘතිය සඳහා වන තුරෙයිරාජා රන් පදක්කම

වජිර විශ්වනාත් ලියනාරච්චි මහතා

10. 2022 - සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ තාක්ෂණවේදී (ගෞරව) උපාධි පාඨමාලාවේ හොඳම ව්‍යාපෘතිය සඳහා වන රන් පදක්කම

බටුබැද්දේ පොල්වත්තේගෙදර ශසිකා අග්‍රේස්වරී ප්‍රේමචන්ද්‍ර මෙනවිය

11. 2022 - තාක්ෂණවේදී (ගෞරව) උපාධි පාඨමාලාවේ හොඳම ව්‍යාපෘතිය පාදක කරගත් හොඳම තාක්ෂණික පත්‍රිකාව සඳහා වන ඉංජිනේරු පර්යේෂණ ඒකක රන් පදක්කම

දොන් මැනුවෙල් ඇන්ද්‍රදි මුදියන්සේලාගේ ශලිඳු රුවංග ඇන්ද්‍රදි

12. 2022 - විද්‍යාව සඳහා වන ඩී.බී. ඇල්ලේපොල රන් පදක්කම

තජුස් සෆා ෆාතිමා ශබ්නම් මෙනවිය

13. 2022 - රසායන විද්‍යාව පිළිබඳ ජේ.එන් ඔලීප් ප්‍රනාන්දු රන් පදක්කම

අලි අල් බස්‍රි ෆාතිමා සකීනා

14. 2022 - භෞතික විද්‍යාව සඳහා වන ඊ.එම්. ජයසිංහ අනුස්මරණ රන් පදක්කම

හරිනි ශානිකා විජේරත්න මෙනවිය

15. ශුද්ධ ගණිතය විශිෂ්ටතාව පිළිබඳ එච්. සෝමදාස රන් පදක්කම

බුද්ධික ඉන්දීර ධනපාල ගුරුල්ලගොඩ මහතා

16. 2022 - අධ්‍යාපනපති උපාධිය සඳහා වන ජී. ඩේවිඩ් ද සිල්වා අනුස්මරණ තිළිණ ප්‍රදානය

අලියාර් නුස් රත් ෆස්ලූන් මෙනවිය

17. ස්වභාවික විද්‍යා පීඨ හොඳම කාර්යසාධනය සඳහා වන

සත්ත්ව විද්‍යා

පරගහදෙණිය ගුරුණහෙල ගෙදර හිෂාම් ඉමිතියාස් හස්නා මෙනවිය

උද්භිද විද්‍යාව

ෆාතිමා නෆ්ලා නමීස් මෙනවිය

රසායන විද්‍යාව

අලි අල් බස්රි ෆාතිමා සකීනා මෙනවිය

භෞතික විද්‍යාව

හරිනි ශානිකා විජේරත්න මෙනවිය

ව්‍යවහාරික ගණිතය

මොහොමඩ් වජීඩ් සීනතුල් ෆිනුසියා මෙනවිය

ශුද්ධ ගණිතය

බුද්ධික ඉන්දීර ධනපාල ගුරුල්ලගොඩ

පරිගණක විද්‍යාව

තජුස් සෆා ෆාතිමා ශබ්නම් මෙනවිය

ස්වභාවික විද්‍යා පීඨය

2023 මැයි 01 වන දින උපාධිය ලබා ගත් යාපනය ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ විද්‍යාවේදී උපාධිධාරියෙකු වන හරිචන්ද්‍ර කාලිංගරාජා මහතා විසින් 2023 අගෝස්තු 26 වන දින කැනඩාවේ පැවති 8 වන ජාත්‍යන්තර නව නිපැයුම් තරඟයේදී (iCAN 2023) පහත සඳහන් ජාත්‍යන්තර තිළිණ ත්‍රිත්වය දිනා ගන්නා ලදි.

• රන් පදක්කම- නවෝත්පාදන සහ උසස් කුසලතා පිළිබඳ ටොරොන්ටෝ ජාත්‍යන්තර සමාජය (TISIAS)

• FIRI AWARD (හොඳම නවෝත්පාදන සඳහා වන විශේෂ ජාත්‍යන්තර තිළිණ ප්‍රදානය)-

රන් පදක්කම - The First Institute of Inventors and Researchers in I.R. IRAN (FIRI) විසින් ප්‍රදානය කරන ලද

• CANADIAN SPECIAL AWARD - TISIAS

<u>රන් පදක්කම් සහ තිළිණ ලැයිස්තුව - උපාධි ප්‍රදානෝත්සවය 2023 (ii)</u>

2023 - කළමනාකරණ අධ්‍යයන (ගෞරව) උපාධි හොඳම කාර්යසාධනය සඳහා වන රන් පදක්කම
හේරත් මුදියන්සේලාගේ දිනුෂි දිල්හාරා කරලියද්ද මෙනවිය

2023 - කළමනාකරණ අධ්‍යයනවේදී උපාධි විශිෂ්ටත්වය සඳහා වන සුදත්ත රණසිංහ රන් පදක්කම
අගලවත්තගේ දුල්ශානි ප්‍රසන්තිමා සමරසිංහ මෙනවිය

2023 - වෛද්‍ය රසායනාගාර විද්‍යාවේදී උපාධි හොඳම ශිෂ්‍යයා සඳහා වන නන්දනී ද සිල්වා රන් පදක්කම

අබ්දුල් නසීර් ෆාතිමා රිෆානා මහත්මිය

2023 - හෙද විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධි හොඳම ශිෂ්‍යයා සඳහා වන අතබස්කා විශ්වවිද්‍යාල රන් පදක්කම

වඩුගේ කාංචනා හංසමාලි පෙරේරා මෙනවිය

2023 - හෙද විද්‍යාව විශිෂ්ටත්වය සඳහා වන රොබර්ට එල්. කැරේ තිළිණ ප්‍රදානය

වඩුගේ කාංචනා හංසමාලි පෙරේරා මෙනවිය

2023 - හෙද විද්‍යාව චන්ද්‍රා ද සිල්වා අනුස්මරණ තිළිණය

වඩුගේ කාංචනා හංසමාලි පෙරේරා මෙනවිය

2023 - ඖෂධ විද්‍යාවේදී (ගෞරව) උපාධි හොඳම ශිෂ්‍යයා සඳහා වන තුලී ද සිල්වා රන් පදක්කම

නන්ලත් ගමගේ හර්ෂනී දිශ්නා මෙනවිය

2023 - මනෝවිද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධි හොඳම ශිෂ්‍යයා සඳහා වන රන් පදක්කම

චිත්‍රාංග හසිත් එදිරිසූරිය මහතා

2023 - පොදුරාජ්‍ය මණ්ඩලීය විධායක ව්‍යාපාරපති/ රාජ්‍ය පරිපාලනපති පර්යේෂණ විශිෂ්ටතා සඳහා වන සුදත්ත රණසිංහ රන් පදක්කම

කලුදුර නදීෂාන් තාබෘ මහතා

4 කොටස - පීඨ වාර්තා

4.0 පීඨ වාර්තා

4.1 අධ්‍යාපන පීඨය

4.1.1 විශ්ලේෂණය



ශ්‍රී ලංකාව තුළ සහ කලාපය තුළ විවෘත සහ දුරස්ථ ඉගෙනුම තුළින් මූලික මානව උත්සාහයක් වශයෙන් අධ්‍යාපනයේ දැනුම සහ වෘත්තීය ව්‍යවහාරයන් වැඩිදියුණු කිරීමේ නායකයා ලෙස කටයුතු කිරීම යන තම තේමාව අනුව යමින් අධ්‍යාපන පීඨය සහතිකපත්‍ර මට්ටමේ සිට පශ්චාත් උපාධි මට්ටම දක්වා පුළුල් පරාසයක වැඩසටහන් ලබා දෙයි. ශ්‍රී ලංකාව තුළ දුරස්ථ ආකාරයට පෙරපාසල් ප්‍රාථමික සහ ද්විතීයික සහ විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය සම්බන්ධ ගුරුවරුන්ට මූලික සහ අඛණ්ඩ වෘත්තීමය සංවර්ධන වැඩසටහන් ලබා දෙන විශාලම ප්‍රතිපාදකයන් අතරින් එකක් ලෙස දැක්විය හැකියි. මෙම විද්‍යා පීඨය තුළින් ලබා දෙන වැඩසටහන් සඳහා ශිෂ්‍යන්ගේ ලියාපදිංචිය එක් අධ්‍යයන වර්ෂයක් සඳහා 7000කට වැඩි වන අතර සමත් වන ප්‍රතිශතය 80% කට ඉහළ අගයකි. අධ්‍යාපන පීඨය තුළ පර්යේෂණ යනු අවශ්‍යම උපාංගයක් වන අතර කාර්ය මණ්ඩලය පර්යේෂණ ව්‍යාපෘති ගණනාවක සක්‍රීය ලෙස දායක වී සිටිති.

අධ්‍යාපන පීඨය වර්තමානයේ පහත සඳහන් අධ්‍යනාංශ 4න් සමන්විත වේ.

1. ද්විතීයික සහ තෘතීයික අධ්‍යාපන අධ්‍යනාංශය.
2. මුල් ළමා විය සහ ප්‍රාථමික අධ්‍යාපන අධ්‍යනාංශය.
3. විශේෂ අවශ්‍යතා අධ්‍යාපන අධ්‍යනාංශය.
4. අධ්‍යාපන නායකත්ව හා කළමනාකරණ අධ්‍යනාංශය.

අධ්‍යනාංශ ප්‍රධානියා යටතේ සෑම අධ්‍යනාංශයක්ම පවතින අතර පීඨයේ අධ්‍යයන කටයුතු සඳහා සියලුම අධ්‍යනාංශ සාමූහිකව වගකිව යුතු වේ.

4.1.2 ශිෂ්‍ය බඳවාගැනීම් සහ තනි පුද්ගල වැඩසටහන් සම්පූර්ණ කිරීම

වැඩසටහන	අදියර	මාධ්‍යය	නව බඳවාගැනීම්	සම්පූර්ණ කරන ලද
විශේෂ අවශ්‍යතා අධ්‍යාපන අධ්‍යනාංශය				
විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී උපාධිය B.Ed (SNE)	උපාධි	සිංහල, ඉංග්‍රීසි	161	270
විශේෂ අවශ්‍යතා අධ්‍යාපන පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (PGDSNE)	පශ්චාත් උපාධි ඩිප්ලෝමා	සිංහල, දෙමළ, ඉංග්‍රීසි	42	
විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනපති උපාධිය	පශ්චාත් උපාධි	සිංහල, දෙමළ, ඉංග්‍රීසි	59	
පූර්ව ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපන අධ්‍යනාංශය				
පෙරපාසල් අධ්‍යාපන උසස් සහතිකපත්‍ර පාඨමාලාව	සහතික පත්‍ර	සිංහල, ඉංග්‍රීසි	42	
පෙරපාසල් අධ්‍යාපන සහතිකපත්‍ර පාඨමාලාව	සහතික පත්‍ර	සිංහල, ඉංග්‍රීසි		
පූර්ව ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපන ඩිප්ලෝමාව	ඩිප්ලෝමා	සිංහල, දෙමළ, ඉංග්‍රීසි		
ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව) උපාධිය	උපාධි	සිංහල, ඉංග්‍රීසි	1905	
ද්විතීය හා තෘතීය අධ්‍යාපන අධ්‍යනාංශය				
පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ කෙටි පාඨමාලාව - සිංහල	සහතික පත්‍ර	සිංහල		
පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ කෙටි පාඨමාලාව - ඉංග්‍රීසි	සහතික පත්‍ර	ඉංග්‍රීසි		
මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ කෙටි පාඨමාලාව	සහතික පත්‍ර	සිංහල, දෙමළ, ඉංග්‍රීසි		
ඉගෙනීමේ අපහසුතා සහිත දරුවන්ට ඉගැන්වීම පිළිබඳ කෙටි පාඨමාලාව - ඉංග්‍රීසි	සහතික පත්‍ර	ඉංග්‍රීසි		
මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ කෙටි පාඨමාලාව	සහතික පත්‍ර	ඉංග්‍රීසි		
අධ්‍යාපනවේදී උපාධිය (ස්වභාවික විද්‍යා)	උපාධි	සිංහල, දෙමළ, ඉංග්‍රීසි	08	
අධ්‍යාපනවේදී උපාධිය	උපාධි		74	
නාට්‍ය හා රංගකලාව පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව) උපාධිය	උපාධි	සිංහල		
අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	පශ්චාත් උපාධි ඩිප්ලෝමා	සිංහල, දෙමළ,	3320	
අධ්‍යාපනපති උපාධිය (Course work)	පශ්චාත් උපාධි	ඉංග්‍රීසි	372	377
ගුරු අධ්‍යාපන ශාස්ත්‍රපති උපාධිය	පශ්චාත් උපාධි	ඉංග්‍රීසි	34	
අධ්‍යාපනපති උපාධිය	පශ්චාත් උපාධි	සිංහල, දෙමළ, ඉංග්‍රීසි		
දර්ශනපති උපාධිය/ ආචාර්ය උපාධිය	පශ්චාත් උපාධි	ඉංග්‍රීසි	01	

4.1.3 ශිෂ්‍ය බඳවාගැනීම් සහ තනි පුද්ගල වැඩසටහන් තුළ කාර්ය මණ්ඩලය

වැඩසටහන	ශිෂ්‍ය සංඛ්‍යාව	අධ්‍යයන සහ අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය	අනධ්‍යයන කාර්ය මණ්ඩලය
පෙර පාසල් අධ්‍යාපන සහතිකපත්‍ර පාඨමාලාව	37	37	28
පෙරපාසල් අධ්‍යාපන උසස් සහතිකපත්‍ර පාඨමාලාව	46		
පූර්ව ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපන ඩිප්ලෝමාව	51		
අධ්‍යාපනවේදී උපාධිය	143		
ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව) උපාධිය	2878		
නාට්‍ය හා රංගකලාව පිළිබඳ අධ්‍යාපනවේදී උපාධිය	84		
විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව) උපාධිය	319		
අධ්‍යාපනවේදී උපාධිය (ස්වභාවික විද්‍යා)	23		
විශේෂ අවශ්‍යතා අධ්‍යාපන පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	57		
අධ්‍යාපන පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	4339		
අධ්‍යාපනපති උපාධිය (Coursework)	387		
විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනපති උපාධිය	107		
ගුරු අධ්‍යාපන ශාස්ත්‍රපති උපාධිය	48		
දර්ශනපති උපාධිය/ ආචාර්ය උපාධිය	06		

7 වගුව: ශිෂ්‍ය බඳවාගැනීම් සහ තනි පුද්ගල වැඩසටහන් තුළ කාර්ය මණ්ඩලය - අධ්‍යාපන පීඨය

4.1.4. නව පාඨමාලා/ වැඩසටහන්

පාඨමාලාව/ වැඩසටහන	මාධ්‍යය	අදියර
අධ්‍යාපන නායකත්ව සහ කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව (විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2023දී අනුමත කරන ලද)	සිංහල, දෙමළ, ඉංග්‍රීසි	අදියර 8

8 වගුව: නව පාඨමාලා/ වැඩසටහන්

4.1.5 මාර්ගගත පාඨමාලා

පාඨමාලාව	නම	අදියර	මාධ්‍යය
විශේෂ අවශ්‍යතා අධ්‍යාපන අධ්‍යානාංශය			
SNPA601	විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ මනෝවිද්‍යාත්මක පදනම	10	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNPA602	විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයේ සමාජ විද්‍යාත්මක හා දාර්ශනික පදනම්	10	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNPA903	විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයේ විෂයමාලා උපදෙස් සහ ඇගයීම	10	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNPA904	වර්තමාන අධ්‍යාපන ක්‍රමය තුළ විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය කළමනාකරණය කිරීම	10	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNPA605	විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති සිසුන් සඳහා මාරුවීම්	10	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNPA606	විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයේ උපකාරක සහ අනුවර්තන තාක්ෂණයන්	10	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNPA608	විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ සංඛ්‍යාත්මක පර්යේෂණ	10	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNPA609	විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ ගුණාත්මක පර්යේෂණ	10	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNPAI10	පර්යේෂණ නිබන්ධන	10	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි

පාඨමාලාව	නම	අදියර	මාධ්‍යය
SNU5535	විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය සඳහා මනෝවිද්‍යාව	5	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNU5336	විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයේ දාර්ශනික පදනම	5	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNU5237	විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයේ සමාජ විද්‍යාත්මක පදනම	5	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNU5338	සුවිශේෂීතා සහ ඉගෙනුම් අවශ්‍යතා පිළිබඳ හැඳින්වීම	5	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNU5239	විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය තුළ නැඟී එන ප්‍රවණතා	5	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNU5540	සංසන්දනාත්මක අධ්‍යාපනය සහ අධ්‍යාපනික ගැටළු	5	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNU5341	අධ්‍යාපනික මගපෙන්වීම සහ උපදේශනය	5	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNU5242	විශේෂ අධ්‍යාපනය (Inclusive Education)	5	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNU5343	විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයේ මිනුම් සහ ඇගයීම	5	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNU5244	විෂයමාලා න්‍යාය සහ පුහුණුව	5	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNE5546	විශේෂ අවශ්‍යතා සහිත ළමුන් සඳහා හොඳම අධ්‍යාපනික වටපිටාව නිර්මාණය කිරීම	5	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNE5247	ඇතුළත් වූ පංති පන්ති කාමරය තුළ ළමුන්ගේ ගැටළු පිළිබඳ කටයුතු කිරීම	5	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNU6620	විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය සඳහා අධ්‍යාපනික තාක්ෂණය	6	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNU6221	ප්‍රාථමික අධ්‍යාපනය	6	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNU6822	ව්‍යාපෘතිය	6	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNU6223	ළමා අයිතිවාසිකම්	6	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNU6224	අධ්‍යාපනික කළමනාකරණය	6	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNU6225	පුනරුත්ථාපනය සහ ප්‍රජා පාදක පුනරුත්ථාපනය	6	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNU6826	ගුරු පුහුණුව	6	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNE6546	ඇතුළත් වූ පන්ති කාමරය තුළ ළමුන් සඳහා විෂයමාලා සංවර්ධනය හා අනුවර්තනය	6	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNP8340	විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය සඳහා මනෝවිද්‍යාව	8	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNP8341	විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයේ දාර්ශනික පදනම	8	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNP8442	විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය සඳහා අධ්‍යාපනික තාක්ෂණය	8	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNP8443	විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයේ මිනුම් සහ ඇගයීම	8	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNP8244	සුවිශේෂීතා සහ ඉගෙනුම් අවශ්‍යතා පිළිබඳ හැඳින්වීම	8	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNP8245	විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය තුළ පන්තිකාමර කළමනාකරණය	8	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNP8246	විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය තුළ නැඟී එන ප්‍රවණතා	8	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNP8247	පුනරුත්ථාපනය සහ ප්‍රජා පාදක පුනරුත්ථාපනය	8	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNP8348	විශේෂ අවශ්‍යතා සහිත ළමුන් සඳහා අධ්‍යාපනික මගපෙන්වීම සහ උපදේශනය	8	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNP8849	ගුරු පුහුණුව	8	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNP8350	ක්‍රියාකාරී පර්යේෂණ ව්‍යාපෘතිය	8	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
SNP8348	විශේෂ අවශ්‍යතා සහිත ළමුන් සඳහා අධ්‍යාපනික මගපෙන්වීම සහ උපදේශනය	8	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
	ද්විතීයික හා තෘතීයික අධ්‍යාපන අධ්‍යනාංශය		
	අධ්‍යාපනපති උපාධිය	9	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
	ගුරු අධ්‍යාපනපති උපාධිය	9	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
	පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ කෙටි පාඨමාලාව		සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
	අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව	8	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
	නාට්‍ය හා රංගකලාව පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව) උපාධිය	3,4,5,6	සිංහල
	නාට්‍ය හා රංගකලාව පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව) උපාධිය	3,4,5,6	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි

පාඨමාලාව	නම	අදියර	මාධ්‍යය
මුල් ළමාවිය සහ ප්‍රාථමික අධ්‍යාපන අධ්‍යනාංශය			
EPU3530	ළමා සංවර්ධනය	3	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
EPU3331	මුල් ළමාවිය සහ ප්‍රාථමික අධ්‍යාපනයේ යථාදර්ශනය	3	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
EPU3532	විෂයමාලා අධ්‍යයන සහ ප්‍රායෝගික භාෂා අධ්‍යයන (සිංහල/ දෙමළ/ඉංග්‍රීසි)	3	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
EPU3533	විෂයමාලා අධ්‍යයන සහ ප්‍රායෝගික යෙදුම - ගණිතය	3	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
EPU3234	විෂයමාලා අධ්‍යයන සහ ප්‍රායෝගික යෙදුම - සෞන්දර්යාත්මක සහ නිර්මාණාත්මක අධ්‍යයනය	3	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
EPU3236	විෂයමාලා අධ්‍යයන සහ ප්‍රායෝගික යෙදුම - සෞඛ්‍ය පෝෂණය සහ ආරක්ෂිත පියවර	3	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
EPU3337	පූර්ව ප්‍රාථමික සහ ප්‍රාථමික ඉගැන්වීමේ ඒකාබද්ධ ප්‍රවේශය	3	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
EPU3338	මුල් ළමාවිය ආයතන සහ ප්‍රාථමික පාසල් නිර්මාණය කිරීම හා සැලසුම් කිරීම	3	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
EPU4531	ඉගැන්වීමේ සහ ඉගෙනීමේ යථාදර්ශනය	4	ඉංග්‍රීසි
EPU4232	මුල් ළමාවිය සහ ප්‍රාථමික අධ්‍යාපනයේ ක්ෂේත්‍ර පුහුණුව	4	ඉංග්‍රීසි
EPU4533	මුල් ළමාවිය සහ ප්‍රාථමික වසර ගැලපීමේ ගැටළු	4	ඉංග්‍රීසි
EPU4534	ඉගෙනුම් (Reflective Learning)	4	ඉංග්‍රීසි
EPU4335	නිවස - පාසල - ප්‍රජා සම්බන්ධතාවය	4	ඉංග්‍රීසි
EPU4337	පූර්ව ළමාවිය සහ ප්‍රාථමික වසර සඳහා සිංහල භාෂාව ඉගැන්වීම	4	ඉංග්‍රීසි
EPU4338	පූර්ව ළමාවිය සහ ප්‍රාථමික වසර සඳහා දෙමළ භාෂාව ඉගැන්වීම	4	ඉංග්‍රීසි
EPU5550	ප්‍රාථමික අධ්‍යාපනය සඳහා අධ්‍යාපනයේ පදනම්	5	ඉංග්‍රීසි
EPU5551	ප්‍රාථමික අධ්‍යාපනය සඳහා අධ්‍යාපනික තාක්ෂණය	5	ඉංග්‍රීසි
EPU5552	ප්‍රාථමික ඉගැන්වීම සඳහා ගණිතය	5	ඉංග්‍රීසි
EPU5353	ප්‍රාථමික ඉගැන්වීම සඳහා සෞන්දර්ය	5	ඉංග්‍රීසි
EPU5354	ප්‍රාථමික අධ්‍යාපනය සඳහා අධ්‍යාපනයේ පදනම්	5	ඉංග්‍රීසි
EPU5255	ප්‍රාථමික ඉගැන්වීම සඳහා විද්‍යාව සහ පරිසරය	5	ඉංග්‍රීසි
EPU5256	ප්‍රාථමික අධ්‍යාපනය සඳහා ළමා අයිතිවාසිකම්	5	ඉංග්‍රීසි
EPU5557	ප්‍රථම භාෂාව - ප්‍රාථමික පාසල් ගුරුවරු සඳහා සිංහල භාෂාව	5	ඉංග්‍රීසි
LEU5558	ප්‍රථම භාෂාව - ප්‍රාථමික පාසල් ගුරුවරු සඳහා දෙමළ භාෂාව	5	ඉංග්‍රීසි
EPU6230	ප්‍රාථමික පාසල් තුළ විශේෂ අධ්‍යාපනය (Inclusive Education)	6	ඉංග්‍රීසි
EPU6231	ප්‍රාථමික පාසල් තුළ මගපෙන්වීම සහ උපදේශනය	6	ඉංග්‍රීසි
EPU6332	ප්‍රාථමික අධ්‍යාපනයේ සමකාලීන ගැටළු	6	ඉංග්‍රීසි
EPU6533	ප්‍රාථමික අධ්‍යාපනය ඇගයීම	6	ඉංග්‍රීසි
EPU6234	ප්‍රාථමික පන්ති කාමරය කළමනාකරණය	6	ඉංග්‍රීසි
EPU6835	ප්‍රාථමික මටමේ ගුරු පුහුණුව	6	ඉංග්‍රීසි
EPU6836	ප්‍රාථමික අධ්‍යාපන ව්‍යාපෘති	6	ඉංග්‍රීසි
අධ්‍යාපනික නායකත්ව හා කළමනාකරණ අධ්‍යනාංශය			
	පාසල් කළමනාකරණය පිළිබඳ කෙටි පාඨමාලාව	-	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි
	ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්ගේ ශක්‍යතා සංවර්ධනය පිළිබඳ කෙටි පාඨමාලාව (SLEAS) - පැය 100 වැඩසටහන	-	සිංහල/ දෙමළ/ඉංග්‍රීසි

9 වගුව: මාර්ගගත පාඨමාලා - අධ්‍යාපන පීඨය

4.2 ඉංජිනේරු තාක්ෂණ පීඨය

4.2.1 විශ්ලේෂණය



ඉංජිනේරු තාක්ෂණ පීඨය ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය අධ්‍යයන පීඨ 6 අතුරින් එක් පීඨයක් වේ. පීඨයේ පරිපාලන හා අධ්‍යයන ප්‍රධානියා පීඨාධිපති වන අතර, වර්තමානයේ ආචාර්ය. එච්.ජී.පී.ඒ රත්නවීර මහතා 2021 ජූලි 07 වන දින සිට පීඨාධිපති ලෙස කටයුතු කරයි. කේ. විජිකුමාර් මහතා 2021 අප්‍රේල් 23 වන දින සිට පීඨයේ සහකාර ලේඛකාධිකාරී ලෙස කටයුතු කරයි.

පීඨය පහත සඳහන් අධ්‍යයනාංශ 6න් සමන්විත වේ.

අධ්‍යයනාංශය	අධ්‍යනාංශ ප්‍රධානී
1.කෘෂිකාර්මික හා වැවිලි ඉංජිනේරු විද්‍යාව	- ආචාර්ය. ඒ.ජී.බී අරුගොඩ
2.සිවිල් ඉංජිනේරු	- මහාචාර්ය. ටී.එම්. පල්ලෙවත්ත
3.විදුලි හා පරිගණක ඉංජිනේරු	- එච්. පැස්කුවල් මහත්මිය
4.ගණිත හා ඉංජිනේරු විද්‍යාවේ දර්ශණය	- 2023/08/31 වන දින දක්වා ජී. නන්දසේන මහතා - 2023/09/01 වන දින සිට ආචාර්ය. කේ.ඩී.එන් කුමාරි පත් කර ඇත.
5.යාන්ත්‍රික ඉංජිනේරු	- ආචාර්ය. අයි.යූ. අත්තනායක
6.පේෂකර්ම සහ ඇඟළුම් තාක්ෂණය	- ආචාර්ය. ඩී.එස්. විජේරත්න මහත්මිය

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය සනාතන සභාවේ අධීක්ෂණය යටතේ පීඨයේ සියලුම අධ්‍යයන ක්‍රියාකාරකම් ඉංජිනේරු තාක්ෂණ පීඨයේ පීඨ මණ්ඩලය විසින් පාලනය කරනු ලබයි.

අධ්‍යයන වැඩසටහන්

මින් පෙර තාක්ෂණවේදී ගෞරව (BTech Hons) උපාධි වැඩසටහන නමින් හඳුන්වන ලද ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය [BScHons (Eng)] කෘෂිකාර්මික හා වැවිලි, සිවිල්, විදුලි, මෙකාට්‍රොන්ක්ස්, යාන්ත්‍රික, පරිගණක, ඉලෙක්ට්‍රොනික්ස් සහ විදුලි සංදේශනය සහ පේෂකර්ම සහ ඇඟළුම් ඉංජිනේරු විද්‍යාව යන විෂයන්හි විශේෂීකරණයන් සඳහා පිරිනමනු ලැබේ. කෘෂිකර්මය, රෙදිපිළි තාක්ෂණය සහ කළමනාකරණය, මෝස්තර නිර්මාණ සහ නිපැයුම් ප්‍රවර්ධනය සහ පේෂකර්ම නිෂ්පාදනය සඳහා කර්මාන්ත අධ්‍යයනවේදී අධ්‍යයන වැඩසටහන පිරිනමනු ලබයි. තොරතුරු තාක්ෂණ අධ්‍යාපන සේවා මධ්‍යස්ථානය විසින් මෘදුකාංග ඉංජිනේරුවේදී උපාධි පාඨමාලාව පවත්වනු ලබයි.

ඉංජිනේරු තාක්ෂණවේදී සහ කර්මාන්ත අධ්‍යයනවේදී උපාධි පාඨමාලා සඳහා ඇතුළත් වී ඉගෙනුම ලබන ශිෂ්‍යයින්ට අදාල අවශ්‍යතා සම්පූර්ණ කර උසස් ඩිප්ලෝමාවක් ලබා ගැනීමට හැකි වේ. පීඨය විසින් පේෂකර්ම තාක්ෂණය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාවක් පිරිනමනු ලබයි.පූර්ව අවශ්‍යතා සම්පූර්ණ කිරීමෙන් තොරව, අධ්‍යයන පාඨමාලාවකට ඇතුළත් වීමෙන් තොරව, කේවල පාඨමාලා ලෙස පාඨමාලා ඒකක අගය උපරිම 18ක් වන ලෙස තබා ගැනීමට ඉගෙනුම ලබන්නන්ට අවසර ලැබේ.

පීඨය මගින් පිරිනමනු ලබන වැඩසටහන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අතර ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශවල දක්වා ඇති අවශ්‍යතා සපුරාලීම සඳහා නිර්මාණය කර ඇත. අපගේ උපාධිධාරීන් ශ්‍රී ලංකාවේ රාජ්‍ය හා පෞද්ගලික අංශවල මෙන්ම විදෙස් රටවල ද සාර්ථකව කටයුතු කරයි. ඇතැම් ශිෂ්‍යයින් දේශීය හා විදේශීය විශ්වවිද්‍යාලවල පශ්චාත් උපාධි පාඨමාලා ද හදාරා ඇත. වර්තමානයේ, අපගේ ඉංජිනේරු තාක්ෂණවේදී උපාධි පාඨමාලාව ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් එහි පිළිගැනීම සඳහා නැවත ඇගයීමට ලක් කෙරෙමින් පවතී. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය වරලත් ඉංජිනේරුවෙකු වීමට වෘත්තීය මගපෙන්වීම සිදු කරන අතර සාමාජිකත්වය (Associate membership) වෙත අයදුම් කිරීම සඳහා අ.පොෂ. උසස් පෙළ විභාගයේදී ගණිත අංශයෙන් අවම වශයෙන් C සාමාර්ථ 2ක් සහ S සාමාර්ථ 1ක් එක් වරක් පෙනී සිටීමෙන් ලබා තිබිය යුතු ය.

පීඨය විසින් පහත සඳහන් පශ්චාත් උපාධි වැඩසටහන් පිරිනමනු ලබයි.

සිවිල් ඉංජිනේරු	ව්‍යුහාත්මක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය
	කර්මාන්ත ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය
විදුලි හා පරිගණක ඉංජිනේරු	දත්ත විද්‍යාපති උපාධිය
	දත්ත විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය
යාන්ත්‍රික ඉංජිනේරු	චක්‍රීය ආර්ථිකය සඳහා බලශක්තිය පිළිබඳ විද්‍යාපති උපාධිය
	බලශක්ති කළමනාකරණපති උපාධිය

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය දර්ශනපති සහ දර්ශනසූරි උපාධි වැඩසටහන් සඳහා ද ශිෂ්‍යයින් බඳවාගැනීම සිදු කරනු ලබයි.

පීඨය තම අධ්‍යයන පාඨමාලා විවෘත හා දුරස්ථ ඉගෙනුම් ක්‍රමවේදය හරහා පිරිනමනු ලබන අතර අධ්‍යයන කටයුතු සම්බන්ධීකරණය ක්ෂේත්‍රයේ සුදුසුකම්ලත් ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ බාහිර අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් සිදු කරනු ලබයි. සංශෝධිත විෂය මාලා ක්‍රියාත්මක කිරීමේ ප්‍රයත්නයෙහි කොටසක් වශයෙන් පාඨමාලා ද්‍රව්‍ය සංශෝධනය කිරීමේදී සියලුම අධ්‍යනාංශ විශාල උනන්දුවක් දැක්වී ය. තවද, පාඨමාලා මාර්ගගත ක්‍රමවේදය හරහා පිරිනැමීම වෙනුවෙන් කාර්ය මණ්ඩල සාමාජිකයින් ඉතා උනන්දුවක් දක්වන ලදි.

පීඨය විසින් සියලුම පාඨමාලා සඳහා මාර්ගගත ප්‍රවේශය ලබා දීමට ඉගෙනුම් කළමනාකරණ පද්ධතියක් (LMS) MOODLE භාවිත කරනු ලබයි. ස්වයං අධ්‍යයනය, කණ්ඩායම් වශයෙන් අධ්‍යයනය කිරීම (සාමූහික අධ්‍යයනය) සහ අධ්‍යයන ක්‍රියාකරකම් නියමිත කාලයේදී අවසන් කිරීම සිසුන්ගේ සාර්ථකත්වය සහතික කිරීම සඳහා වැදගත් වේ. පාඨමාලා පිරිනැමීමේ ප්‍රධාන ක්‍රමවේදය වන්නේ ස්වයං-අධ්‍යයන පාඨමාලා ද්‍රව්‍ය හරහා පිරිනැමීම වේ. ඉදිරි කටයුතු පවත්වාගෙන යාම සඳහා කාර්ය සාධනය පිළිබඳ ප්‍රතිචාර සහ අවශ්‍ය මග පෙන්වීම ගුරුවරුන් විසින් ලබා දෙනු ලබයි. අධ්‍යයන වර්ෂය තුළ වීඩියෝ සම්මන්ත්‍රණ ක්‍රමවේදය හරහා අන්තර් ක්‍රියාකාරී සැසි ලෙස පවත්වනු ලබන දින පාසල් වෙත ශිෂ්‍යයින් සහභාගී වීම අත්‍යවශ්‍ය වේ. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මාර්ගගත විභාග පවත්වනු ලබන අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මාර්ගෝපදේශ අනුව පීඨය කටයුතු කරනු ලබයි.

4.2.2 ශිෂ්‍ය බඳවාගැනීම් සහ තනිපුද්ගල වැඩසටහන් සම්පූර්ණ කිරීම

වැඩසටහන	අදියර	මාධ්‍යය	නව බඳවාගැනීම්	සම්පූර්ණ කළ
ඉංජිනේරු ඇඳීම් සඳහා AutoCAD ඵලදායී භාවිතය පිළිබඳ කෙටි පාඨමාලාව	සහතික පත්‍ර	ඉංග්‍රීසි	128	87
වෘත්තීය වෙබ් නිර්මාණකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	සහතික පත්‍ර	ඉංග්‍රීසි	9	
ග්‍රැෆික් නිර්මාණ පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව	සහතික පත්‍ර	ඉංග්‍රීසි	122	107
Revit ගෘහ නිර්මාණ ශිල්පය පිළිබඳ කෙටි පාඨමාලාව	සහතික පත්‍ර	ඉංග්‍රීසි	24	38
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ කෙටි පාඨමාලාව	සහතික පත්‍ර	ඉංග්‍රීසි	60	51
ඉංජිනේරු විද්‍යාව පිළිබඳ කේවල පාඨමාලා	සහතික පත්‍ර	ඉංග්‍රීසි සිංහල දෙමළ		
ඇඟළුම් තාක්ෂණය පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව	සහතික පත්‍ර	ඉංග්‍රීසි	38	
ඉංජිනේරුවේදය පිළිබඳ තාක්ෂණවේදී (ගෞරව) උපාධිය	උපාධි	ඉංග්‍රීසි	511	15
කර්මාන්ත අධ්‍යයනවේදී (ගෞරව) උපාධිය	උපාධි	ඉංග්‍රීසි	533	101
මෘදුකාංග ඉංජිනේරුවේදී උපාධිය	උපාධි	ඉංග්‍රීසි	725	20
ඉංජිනේරුවේදය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය	උපාධි	ඉංග්‍රීසි		229
බලශක්ති කළමනාකරණපති උපාධිය	පශ්චාත් උපාධි	ඉංග්‍රීසි	54	
ව්‍යූහාත්මක ඉංජිනේරු විද්‍යාපති උපාධිය	පශ්චාත් උපාධි	ඉංග්‍රීසි	20	
චක්‍රීය ආර්ථිකය සඳහා බලශක්තිය පිළිබඳ විද්‍යාපති උපාධිය	පශ්චාත් උපාධි	ඉංග්‍රීසි	121	
දර්ශනපති උපාධිය/ ආචාර්ය උපාධිය	පශ්චාත් උපාධි	ඉංග්‍රීසි		

10 වගුව: ශිෂ්‍ය බඳවාගැනීම් සහ තනි පුද්ගල වැඩසටහන් තුළ කාර්ය මණ්ඩලය- ඉංජිනේරු තාක්ෂණ පීඨය

4.2.3 ශිෂ්‍ය බඳවාගැනීම් සහ තනි පුද්ගල වැඩසටහන් තුළ කාර්ය මණ්ඩලය

වැඩසටහන	ශිෂ්‍ය සංඛ්‍යාව	අධ්‍යයන සහ අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය	අනධ්‍යයන කාර්ය මණ්ඩලය
ඇඟළුම් තාක්ෂණය පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව	38	93	73
ඉංජිනේරු විද්‍යාව පිළිබඳ කේවල පාඨමාලා	05		
තොරතුරු පද්ධති සහ තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව	02		
කර්මාන්ත අධ්‍යයනවේදී (ගෞරව) උපාධිය	1238		
මෘදුකාංග ඉංජිනේරුවේදී උපාධිය	1777		
ඉංජිනේරුවේදය පිළිබඳ තාක්ෂණවේදී (ගෞරව) උපාධිය	2257		
ව්‍යූහාත්මක ඉංජිනේරු විද්‍යාපති උපාධිය	39		
බලශක්ති කළමනාකරණපති උපාධිය	54		
චක්‍රීය ආර්ථිකය සඳහා බලශක්තිය පිළිබඳ විද්‍යාපති උපාධිය	121		
දර්ශනපති උපාධිය/ ආචාර්ය උපාධිය	18		

11 වගුව: ශිෂ්‍ය බඳවාගැනීම් සහ තනි පුද්ගල වැඩසටහන් තුළ කාර්ය මණ්ඩලය- ඉංජිනේරු තාක්ෂණ පීඨය

4.2.4 නව පාඨමාලා/ වැඩසටහන්

පාඨමාලාව/ වැඩසටහන	මාධ්‍යය	අදියර
ඉංජිනේරු විද්‍යාව (Bridge Engineering)	ඉංග්‍රීසි	07
(Ground Improvement Techniques)	ඉංග්‍රීසි	07
චක්‍රීය ආර්ථිකය සඳහා බලශක්තිය පිළිබඳ විද්‍යාපති උපාධිය	ඉංග්‍රීසි	10

12 වගුව: නව පාඨමාලා/ වැඩසටහන් - ඉංජිනේරු තාක්ෂණ පීඨය

4.2.5 මාර්ගගත පාඨමාලා

පාඨමාලා කේතය	නම	අදියර	මාධ්‍යය
පේෂකර්ම සහ ඇඟළුම් තාක්ෂණ අධ්‍යනාංශය			
TAX6367	උසස් වර්ණ ගැන්වීම	6	ඉංග්‍රීසි
TAY7880	ඉංජිනේරු විද්‍යා පර්යේෂණ ව්‍යාපෘතිය (පේෂකර්ම සහ ඇඟලුම් පිළිබඳ ඉංජිනේරු විද්‍යාව)	7	ඉංග්‍රීසි
TAM6457	මෝස්තර අලෙවිකරණය	6	ඉංග්‍රීසි
TAZ2587	පේෂකර්ම තාක්ෂණය සඳහා ගණිතය සහ විද්‍යාව	2	ඉංග්‍රීසි සහ සිංහල
TAX3458	තන්තු විද්‍යාව සහ තාක්ෂණය	3	ඉංග්‍රීසි
TAY2690	උසස් සහතික පත්‍ර ව්‍යාපෘතිය	2	ඉංග්‍රීසි සහ සිංහල
TAY6883	පර්යේෂණ ව්‍යපෘතිය (රෙදිපිළි නිෂ්පාදනය)	6	ඉංග්‍රීසි
TAY6882	පර්යේෂණ ව්‍යපෘතිය (ඇඟලුම් නිෂ්පාදනය)	6	ඉංග්‍රීසි
TAX4462	රටා සංවර්ධනය	4	ඉංග්‍රීසි
TAX4361	ගෙතුම් තාක්ෂණය	4	ඉංග්‍රීසි
TAX3370	රෙදිපිළි සකස් කිරීම	3	ඉංග්‍රීසි
TAY4181	කණ්ඩායම් ව්‍යාපෘති (පේෂකර්ම සහ ඇඟලුම් පිළිබඳ ඉංජිනේරු විද්‍යාව)	4	ඉංග්‍රීසි
TAX4571	රෙදිපිළි වර්ණ ගැන්වීම සහ නිම කිරීම	4	ඉංග්‍රීසි
TAI6580	විලාසිතා සංදර්ශන නිෂ්පාදනය	6	ඉංග්‍රීසි
TAI4371	විලාසිතා සංකල්පය	4	ඉංග්‍රීසි
TAI4472	මෝස්තර නිර්මාණකරණ සංකල්ප	4	ඉංග්‍රීසි
TAI3332	ඇඟලුම් උපාංග	3	ඉංග්‍රීසි
TAI5277	පරිගණක ආධාරක මෝස්තර නිදර්ශනය	5	ඉංග්‍රීසි
TAI5375	නිර්මාණය (Design Through Draping)	5	ඉංග්‍රීසි
TAI5579	දෘශ්‍ය ඉදිරිපත් කිරීම සහ ප්‍රදර්ශන නිර්මාණයේ න්‍යායික අංශ	5	ඉංග්‍රීසි
TAI5376	පරිගණකය මඟින් රටා සැලසුම් කිරීම	5	ඉංග්‍රීසි
TAI5478	මෝස්තර නිර්මාණකරණය සංවර්ධනය	5	ඉංග්‍රීසි
TAI2289	මෝස්තර හැඳින්වීම	2	ඉංග්‍රීසි සහ සිංහල
TAX7369	පෙහෙකම් පිළිබඳ ඉංජිනේරු අංශ	7	ඉංග්‍රීසි
TAX7368	විශේෂිත රෙදි වර්ග	7	ඉංග්‍රීසි
TAX6366	නූල් නිෂ්පාදනය II	6	ඉංග්‍රීසි
TAI4373	විලාසිතා නිදර්ශනය II	4	ඉංග්‍රීසි
TAY5384	විලාසිතා නිර්මාණ දිරිගැන්වීම	5	ඉංග්‍රීසි
TAI3270	විලාසිතා නිදර්ශනය I	3	ඉංග්‍රීසි
TAY6885	විලාසිතා නිෂ්පාදන නිර්මාණය කිරීම සහ ප්‍රදර්ශනය කිරීම	6	ඉංග්‍රීසි
TAX7464	නූල් සහ රෙදි යාන්ත්‍ර විද්‍යාව	7	ඉංග්‍රීසි
TAX5547	ශාක උපයෝගීතා	5	ඉංග්‍රීසි
TAX3459	නූල් නිෂ්පාදනය I	3	ඉංග්‍රීසි
TAX4540	ඇඟලුම් නිෂ්පාදනය	4	ඉංග්‍රීසි
TAX6454	තාක්ෂණික රෙදිපිළි	6	ඉංග්‍රීසි

පාඨමාලා කේතය	නම	අදියර	මාධ්‍යය
TAX6556	රෙදි ව්‍යූහය සහ විශ්ලේෂණය	6	ඉංග්‍රීසි
8 "The Open Day" ප්‍රවර්ධන ව්‍යාපාරය ශිෂ්‍යයින් විශාල සංඛ්‍යාවක් සහ ඔවුන්ගේ දෙමව්පියන්ගේ සහභාගිත්වයෙන් ප්‍රාදේශීය අධ්‍යාපන සේවාවට අයත් ප්‍රාදේශීය හා අධ්‍යයන මධ්‍යස්ථානවල සාර්ථකව පවත්වන ලදි. අපගේ අධ්‍යයන වැඩසටහන් පිළිබඳ නවතම යාවත්කාලීනකිරීම් ලබා ගැනීමට ශිෂ්‍යයින්ට මෙය මහඟු අවස්ථාවක් වූ අතර තම අපේක්ෂාවන් සහ අභිලාශයන්ට ගැළපෙන හොඳම අධ්‍යාපනික වැඩසටහන් තොරාගැනීමට අවශ්‍ය මගපෙන්වීම සහ සහාය ලබා ගැනීමට මෙහිදී ශිෂ්‍යයින්ට හැකියාව ලැබිණ.

9 ප්‍රාදේශීය අධ්‍යාපන සේවා විසින් පවත්වනු ලබන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රජාව සහ ශිෂ්‍යයින් දැනුවත් කිරීමේ අරමුණ ඇතිව "OURESTalk"- ප්‍රදේශීය අධ්‍යාපන සේවාවෙහි විද්‍යුත් සඟරාවෙහි තෙවන නිකුතුව ප්‍රකාශයට පත් කරන ලදි.


6.2 පුස්තකාලය



ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය පුස්තකාල ජාලය පුස්තකාල 09කින් සමන්විත වේ. ප්‍රධාන පුස්තකාලය නාවල ප්‍රධාන විශ්වවිද්‍යාල පරිශ්‍රයේ පිහිටා ඇති අතර ප්‍රාදේශීය පුස්තකාල 08ක්, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය ප්‍රාදේශීය මධ්‍යස්ථාන වන අනුරාධපුරය, බදුල්ල, මඩකළපුව, යාපනය, මහනුවර, කුරුණෑගල, මාතර සහ රත්නපුර ප්‍රාදේශීය මධ්‍යස්ථානවල පිහිටා ඇත.


ප්‍රධාන පුස්තකාලයට අයත් ග්‍රන්ථ එකතුව 107,076ක් වන අතර 2023 වර්ෂය තුළ ප්‍රධාන පුස්තකාලයට මුද්‍රිත හා විද්‍යුත් ආකෘතියෙන් ග්‍රන්ථ 768ක් එක් කරන ලදි. මීට අමතරව, විදුලි ඉංජිනේරු විද්‍යුත් ග්‍රන්ථ 31කින් සමන්විත “Wiring Regulations BS7671 Digital” නමින් විද්‍යුත් පොත් එකතුවක් එක් කරන ලදි. මූළු වාර සඟරා සංඛ්‍යාව 04ක් වන අතර ශ්‍රව්‍ය- දෘශ්‍ය සම්පත් 2428ක් වේ.

UGC consortia හරහා Emerald සහ Oxford Academic ඉලෙක්ට්‍රොනික දත්ත ගබඩා 02 වෙත ප්‍රවේශය ලබා දෙන ලදි. SpringerLink, Springer Nature, Science Direct, British Medical Journals, Reaxys සහ APA PsycNet යන විද්‍යුත් දත්ත ගබඩා සඳහා ප්‍රවේශය ලබා ගන්නා ලදි. මීට අමතරව, විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩලයේ සහ ශිෂ්‍යයින්ගේ ඉගැන්වීම්, ඉගෙනීම් සහ පර්යේෂණ ක්‍රියාකාරකම් වෙත සහාය දක්වන නොමිලේ ප්‍රවේශ විය හැකි අන්තර්ජාලය පාදක කරගත් දත්ත ගබඩා කිහිපයක් ඇත. පසුගිය ප්‍රශ්න පත්‍රවල ඩිජිටල් එකතුවක්, පර්යේෂණ පත්‍රිකා ගබඩා, නිබන්ධන එකතුවක්, විශ්වවිද්‍යාල ප්‍රකාශන, විවෘත ප්‍රවේශයක් සහිත විද්‍යුත් සඟරා එකතුවක් සහ විවෘත අධ්‍යාපන සම්පත් මීට ඇතුළත් වේ. OUSL Web Portal (http://lib.ou.ac.lk/) හරහා මෙම සියළුම මාර්ගගත සම්පත් වෙත ප්‍රවේශ විය හැකි ය.





6.3 කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය



ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විශ්වවිද්‍යාලයේ සියළුම කාර්ය මණ්ඩල කාණ්ඩවල හැකියාවන් ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් අධ්‍යයන සහ පරිපාලන වැඩකටයුතු සඳහා සහාය ලබා දීම අරමුණු කරගෙන පිහිටුවන ලදි. විශේෂයෙන් කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් ඵලදායී සේවකයෙකු ලෙස රාජකාරී කටයුතු කිරීමට අවශ්‍ය කුසලතා සහ නිපුණතාව වැඩි දියුණු කිරීම සඳහා පුහුණු වැඩසටහන්, වැඩමුළු, දැනුවත් කිරීමේ සැසි සැලසුම් කිරීම සහ පහසුකම් සැලසීම සිදු කරනු ලබයි. රාජකාරී කටයුතුවලට අදාළ නිපුණතාවන්ට අමතරව මෙම වැඩසටහන් මඟින් ආකල්ප සහ පුද්ගල සංවර්ධනය ද ආවරණය කරනු ලබයි. වාර්ෂිකව, අප විසින් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයට අළුතින් බඳවාගනු ලබන පරිවාස කථිකාචාර්යවරුන් සඳහා උසස් අධ්‍යාපනය තුළ ඉගැන්වීම් පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව පවත්වනු ලබයි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් වැඩසටහනක් වන උසස් අධ්‍යාපනය තුළ ඉගැන්වීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව සියලුම පරිවාස කථිකාචාර්යවරුන් විසින් තම පත්වීම ස්ථිර කිරීම සඳහා සාර්ථකව සම්පූර්ණ කළ යුතු වේ. අලුතින් බඳවාගත් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් සඳහා කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් පවත්වනු ලබන ජ්‍යෙෂ්ඨ ප්‍රේරණ වැඩසටහන ශ්‍රී ලංකාවේ අනෙකුත් විශ්වවිද්‍යාල මගින් ද පිළිගත් තවත් ප්‍රධාන වැඩසටහනක් වේ. මීට අමතරව, වෙනත් කාර්ය මණ්ඩල කාණ්ඩ සඳහා අවශ්‍යතාවට අනුව අභිප්‍රේරණ වැඩසටහන්, තාක්ෂණික රචනා, මාර්ගගත පාඨමාලා සැලසුම් කිරීම සහ වැඩි දියුණු කිරීම, අභිප්‍රේරණ වැඩසටහන්, භාෂා සහ කුසලතා වැඩි දියුණු කිරීමේ වැඩසටහන් 2023 වර්ෂය තුළ පවත්වන ලදි.







6.4 වෘත්තීය උපදේශන ඒකකය

වෘත්තීය උපදේශන ඒකකයේ ප්‍රධාන පරමාර්ථය වනුයේ විවෘත විශ්වවිද්‍යාලයීය උපාධි අපේක්ෂකයින්ට අනාගත ශ්‍රම බලකාය තුළ සමාජීය වශයෙන් ප්‍රතිචාර දක්වන කාර්යක්ෂම සාමාජිකයෙකු වීමට පහසුකම් සැලසීමයි. රැකියාවල නිරත විය හැකි පරිදි විද්‍යාර්ථීන් ලෙස පුහුණු කිරීමට ශිෂ්‍යයින් සූදානම් කිරීම සහ රැකියාවල නියුතු විද්‍යාර්ථීන් ලෙස වෘත්තීය ප්‍රගතිය සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය ප්‍රධාන භූමිකාවක් නිරූපණය කරනු ලබයි. නාවල, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යලයීය කොළඹ ප්‍රාදේශීය මධ්‍යස්ථාන නව ගොඩනැගිල්ලෙහි මෙම ඒකකය පිහිටා තිබේ. රැකියා ක්ෂේත්‍රයේ අවශ්‍යතා සමඟ කටයුතු කිරීම සඳහා අවශ්‍ය කුසලතා සහ හැකියාවන් වැඩි දියුණු කිරීම සඳහා විද්‍යාර්ථීන්ට සහාය වීමට වැඩමුළු සහ සම්මන්ත්‍රණ පීඨවල සහයෝගීතාවය සහිතව වෘත්තීය උපදේශන ඒකකය විසින් සංවිධානය කිරීම කරනු ලබයි.

Talentlyft'23 – OUSL Career Fair (TalentLyft: Talent is the vehicle of innovation for Life; you are the focus of this timely opportunity)
ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් සාර්ථක වෘත්තීයක් කරා ගමන් කිරීමේ පළමු පියවර වශයෙන් නවෝත්පාදන සහ ශිෂ්‍ය කේන්ද්‍රීය රැකියා අවස්ථා සැලසීමේ වේදිකාවක් වන Talentlyft'23 වැඩසටහනට සමගාමීව 2023 මාර්තු 30 වන දින සාර්ථක රැකියා වෙළඳපොළක් පවත්වන ලදි. විද්‍යාර්ථීන් සහ නව උපාධිධාරීන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා විශේෂයෙන් සැලසුම් කරන ලද ප්‍රථම රැකියා වෙළඳපොළ මෙය වන බැවින් මෙම වැඩසටහන විශ්වවිද්‍යාලය සඳහා සුවිශේෂී සංධිස්ථානයක් සනිටුහන් කරන ලදි.

රට තුළ පවතින අර්බුධකාරී වාතාවරණය මධ්‍යයේ, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය Talentlyft'23 -රැකියා වෙළඳපොළ ශිෂ්‍යයයින්ට සීමාවාසික පුහුණුව සහ රැකියා අවස්ථා පිළිබඳ සොයා බැලීමට සහ තමන්ගේ වෘත්තීයයන් තුළින් ඉදිරියට යාම සඳහා සුවිශේෂී අවස්ථාවක් විය. මෙම වැඩසටහන සාර්ථකව සංවිධානය කිරීම තුළින් විශ්වවිද්‍යාලයීය වෘත්තීය උපදේශන ඒකකය තම සුවිශේෂතාව සනාථ කර ඇත.

MAS Holdings ආයතනය මෙහි පැලැටිනම් අනුග්‍රාහකයා වූ අතර, CR British Academy රන් අනුග්‍රාහකයා විය. ACCA මෙහි රිදී අනුග්‍රාහකයා විය. American Water මෙහි පානීය අනුග්‍රාහකයා වූ අතර ඊට British Council මෙන්ම Dilmah Ceylon Tea, Sampath Bank, Data Capture Experts, Union Assurance, Unilever (Pvt) Ltd, Green Building Council of Sri Lanka, Spa Ceylon, Sri Lanka Insurance, Amana Bank, Australian Migration Centre, Asiri Hospitals සහ Fairtrade International වැනි කර්මාන්ත ක්ෂේත්‍රයේ ප්‍රමුඛයින් ඇතුළත් විය.

Dilmah Ceylon Teaහි ප්‍රධාන විධායක නිලධාරී දිල්හාන් සී ප්‍රනාන්දු මහතා සහ උත්සවය අතරතුර විශ්වවිද්‍යාලයීය online job portal ආරම්භ කිරීම නිවේදනය කළ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය උපකුලපති මහාචාර්ය. පී.එම්.සී තිලකරත්න මහතා විසින් සමාරම්භක උත්සවය ආරම්භ කරන ලදි.


සම්මුඛ පරීක්ෂණ කුසලතා, ඉදිරිපත් කිරීමේ කුසලතා, නායකත්ව කුසලතා සහ කණ්ඩායම් ක්‍රියාකාරකම්, LinkedIn පිළිබඳ දැනුවත් කිරීම, වෘත්තීය ගවේෂණය, රැකියා ක්ෂේත්‍රය තුළ ප්‍රවණතා වැනි විවිධ මාතෘකා පිළිබඳ මණ්ඩල සාකච්ඡා සහ වැඩමුළු මෙහිදී පැවැත්විණ.





රැකියා අවස්ථා සඳහා වන ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවිය

රැකියා අවස්ථා සඳහා වන ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවිය ආරම්භ කිරීම
https://ou.ac.lk/jobportal/



වෘත්තීය උපදේශන ඒකකය මඟින් පවත්වන ලද වැඩමුළු

6.5 මුද්‍රණාලය සහ මධ්‍යම පොත් බෙදාහැරීමේ ඒකකය

මුද්‍රණාලය



හැඳින්වීම

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය මුද්‍රණාලය එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදලේ ව්‍යාපෘතියක් ලෙස 1982 වර්ෂයේදී පිහිටුවන ලදි. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය ලියපදිංචි ශිෂ්‍යයින් වෙත අවශ්‍ය පාඨ ග්‍රන්ථ සැපයීම සඳහා මෙය පිහිටුවන ලදි. අවම උපකරණ සහිතව තම කාර්යයන් ආරම්භ කරමින්, දුරස්ථ ඉගැන්වීම අධ්‍යාපනය වැඩි දියුණු කිරීමේ අරමුණින් ව්‍යාපෘතිය ADB – DEMP යටතේ ආසියානු සංවර්ධන බැංකුව විසින් වරින් වර සපයන ලද නවතම යන්ත්‍රෝපකරණවලින් සමන්විත අංගසම්පූර්ණ මුද්‍රණාලයක් බවට විශ්වවිද්‍යාලයීය ක්‍රමයෙන් සංවර්ධනය වී ඇත.

වර්තමාන රාජකාරී සහ ක්‍රියාකාරකම්: ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය මුද්‍රණාලය විසින් විශ්වවිද්‍යාලයීය පීඨ 6ම විවිධ අධ්‍යයන වැඩසටහන් හදාරනු ලබන 40,000කට අධික ශිෂ්‍යයින් සංඛ්‍යාවක් සඳහා පාඨ ග්‍රන්ථ සපයනු

ලබයි. ලියාපදිංචි ශිෂ්‍යයින්ට මුද්‍රිත පාඨ ග්‍රන්ථ සැපයීමට අමතරව මුද්‍රණාලය විසින් පහත සඳහන් සේවාවන් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය ප්‍රජාවට සපයනු ලබයි.

මුද්‍රණ වර්ගය

- **Digital duplicating.**
  Short Run and Quick Printing
  Photocopy, Colour Print out.
  Visiting Cards, Invitation cards

- **Offset printing.**

1. පාඨ ග්‍රන්ථ

- පාඨ ග්‍රන්ථ (Textbooks)
- ශිෂ්‍යය මාර්ගෝපදේශ ග්‍රන්ථය

2. ප්‍රවර්ධන සහ ප්‍රකාශන ද්‍රව්‍ය

- අත් පත්‍රිකා සහ පොස්ටර්
- Brochures, Flyers, Booklets, Newsletters

5. ඕනෑම ආකාරයක වාණිජ මුද්‍රණ

අධ්‍යයන කටයුතු හා අදාළ ක්‍රියාකාරකම් වන ඉහත සඳහන් මුද්‍රණ ක්‍රියාවලියට අමතරව විවිධ පරිපාලන අංශ සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ද විශ්වවිද්‍යාලයීය මුද්‍රණාලයේදී මුද්‍රණය කෙරේ.

විශ්වවිද්‍යාලයීය මුද්‍රණාලය මඟින් මුද්‍රණය කරන ලද ද්‍රව්‍ය - 2023

පීඨයේ නම	පාඨ ග්‍රන්ථ පිටපත් සංඛ්‍යාව
අධ්‍යාපන පීඨය	33416
සෞඛ්‍ය විද්‍යා පීඨය	61
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය	53681
කළමනාකරණ අධ්‍යයන පීඨය	56229
ස්වභාවික විද්‍යා පීඨය	74723
ඉංජිනේරු තාක්ෂණ පීඨය	70737
එකතුව	**288,847**

මාසය	වෙනත් ද්‍රව්‍ය පිටපත් සංඛ්‍යාව
ජනවාරි	667,444
පෙබරවාරි	86,238
මාර්තු	265,083
අප්‍රේල්	3,755
මැයි	13,630
ජුනි	26,874
ජූලි	115,235
අගෝස්තු	10,686
සැප්තැම්බර්	73,613
ඔක්තෝබර්	18,800
නොවැම්බර්	26,845
දෙසැම්බර්	311,026
එකතුව	**1,619,229**

මධ්‍යම පොත් බෙදාහැරීමේ ඒකකය

මධ්‍යම පොත් බෙදාහැරීමේ ඒකකය මඟින් නියමිත කාලයේදී ප්‍රදේශීය හා අධ්‍යයන මධ්‍යස්ථානවල ලියාපදිංචිකිරීම් පැවැත්වීමේදී පාඨමාලා ද්‍රව්‍ය ගබඩා කිරීම හා බෙදා හැරීම මෙන්ම පාඨමාලා ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා පහසුකම් සැලසීම හරහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය තුළ ප්‍රධාන භූමිකාවක් නිරූපණය කරයි. ලියාපදිංචි වූ සිසුන් වෙනුවෙන් පාඨමාලා ද්‍රව්‍ය ගබඩා කිරීම හා බෙදා හැරීම සඳහා සියලුම පීඨ වෙත සේවා සපයන්නා ලෙස මෙම ඒකකය කටයුතු කරයි. මධ්‍යම පොත් බෙදා හැරීමේ ඒකකය රාක්ක 576කින් සමන්විත වන අතර එක් රාක්කයක් 1.5 m^3 වේ. සෑම රාක්කයක් තුළම පාඨ ග්‍රන්ථ විධිමත්ව ගබඩා කළ හැකිය.

අරමුණු :

- මුද්‍රණ කටයුතු සම්පූර්ණ වූ වහාම ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය මුද්‍රණාලයෙන් සියලුම පාඨමාලා ග්‍රන්ථ එක් රැස් කර ගැනීම.
- ප්‍රාදේශීය මධ්‍යස්ථාන 9 හා අධ්‍යයන මධ්‍යස්ථාන 18 වෙත පාඨමාලා ග්‍රන්ථ බෙදා හැරීම.
- කාර්යභාරය: මධ්‍යම පොත් බෙදා හැරීමේ ඒකකය පහත කාර්යයන් සිදු කරනු ලැබේ.
  - සියලුම මුද්‍රිත පාඨමාලා ග්‍රන්ථ ගබඩා කිරීම.
  - කොන්ත්‍රාත් පදනම මත කුරියර් සේවා හරහා ලියාපදිංචි වූ ශිෂ්‍යයින් වෙත පාඨමාලා ද්‍රව්‍ය යැවීම.
  - අවශ්‍ය අවස්ථාවල ශිෂ්‍යයින්ට පාඨමාලා ද්‍රව්‍ය නිකුත් කිරීම
  - ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය ලොරි රථ සහ කොන්ත්‍රාත් පදනම මත කුරියර් සේවා හරහා දිවයින පුරා පිහිටා ඇති ප්‍රදේශීය හා අධ්‍යයන මධ්‍යස්ථාන වෙත පාඨමාලා ග්‍රන්ථ බෙදා හැරීම.
  - ප්‍රාදේශීය හා අධ්‍යයන මධ්‍යස්ථානවලින් ආපසු එවන ඕනෑම පාඨමාලා ග්‍රන්ථයක් බාර ගැනීම.
  - නව පාඨමාලා ග්‍රන්ථවල සෑම පිටපතක්ම ප්‍රධාන පුස්තකාලය වෙත සැපයීම.

පහසුකම්/ යටිතල පහසුකම්/ සම්පත්

- යහපත් වාතාවරණයක් සහිතව පාඨමාලා ග්‍රන්ථ ගබඩා කිරීම සඳහා 45x20 m^2 ක ඉඩ ප්‍රමාණයෙන් යුත් ගොඩනැගිල්ලක්
- ඉහත සඳහන් අරමුණු සාක්ශාත් කර ගැනීම සඳහා මධ්‍යම පොත් බෙදා හැරීමේ ඒකකයට අනුයුක්තව 12 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් සේවය කරයි.
- මධ්‍යම පොත් බෙදා හැරීමේ ඒකකය තුළ රාක්ක 576ක් ඇති අතර රාක්කයක ප්‍රමාණය 1.5 m^3 ක් වේ.
- මෙම ඒකකය ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය මුද්‍රණාලය වෙත සම්බන්ධ කර ඇත.
- ස්ථිර කාර්ය මණ්ඩල සාමාජිකයින් 3 දෙනෙකුගෙන් සමන්විත වේ. (කළමනාකරණ සහකාර - 03)
- කොන්ත්‍රාත් කාර්ය මණ්ඩල සාමාජිකයින් 09 දෙනෙකුගෙන් සමන්විත වේ. (ව්‍යාපෘති සහකාර 03දෙනෙක් හා මෙහෙයුම් සහකාර 06දෙනෙක්)

6.6 ජාතික මාර්ගගත දුරස්ථ අධ්‍යාපන සේවා මධ්‍යස්ථානය

උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ 2013 දුරස්ථ අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතියේ කොටසක් ලෙස ජාතික මාර්ගගත දුරස්ථ අධ්‍යාපන සේවා මධ්‍යස්ථානය පිහිටුවන ලදි. මෙය 2015 මාර්තු මස විශ්වවිද්‍යාලයට පවරන ලදි. අපගේ දැක්ම වන්නේ ශ්‍රී ලංකාවේ දුරස්ථ අධ්‍යාපනයේ සහ දිවයිනෙන් පිටත ප්‍රමුඛපෙලේ පහසුකම් සපයන්නා බවට පත් වීමයි.

එම දැක්ම සමඟ, මාර්ගගත අධ්‍යාපනයට සහය දැක්වීමට ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලීය ජාතික මාර්ගගත දුරස්ථ අධ්‍යාපන සේවය පහත සඳහන් පහසුකම්වලින් සමන්විත වේ.

- අපගේ සම්පත් සමඟින් ඔවුන්ගේ අවශ්‍යතා අනුව භෞතිකව/ මාර්ගගත ක්‍රමවේදය හරහා වැඩමුළු/ පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- භෞතිකව/ මාර්ගගත ක්‍රමවේදය හරහා භෞතික විභාග පැවැත්වීම සඳහා පහසුකම් සැපයීම හා සංවිධානය කිරීම.
- ඉගෙනුම ලබන්නන් ඇගයීමේ ක්‍රම සහ ඇගයීම හා මාර්ගගත විභාග පැවැත්වීමේ ක්‍රම පිළිබඳ පුහුණුව ලබා දීම.
- අපගේ servers හරහා මාර්ගගත පාඨ ග්‍රන්ථ සංවර්ධනය/ පාඨ ග්‍රන්ථ මාර්ගගත ක්‍රමවේදයට පරිවර්තනය කිරීම මෙන්ම සත්කාරකත්වය දැරීම.
- බාහිර ආයතන සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය දේශන ශාලා සහ විභාග ශාලා සැපයීම.
- ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මඟින් ලබා දිය හැකි, බාහිර ආයතන සඳහා අවශ්‍ය වෙනත් ඕනෑම සේවා අවශ්‍යතාවයක් ලබා දීම

6.7 ජාත්‍යන්තර සබඳතා ඒකකය

ජාත්‍යන්තර සබඳතා ඒකකය 2013 ඔක්තෝබර් මස ස්ථාපිත කරන ලදී. එය සංශෝධිත 1990 අංක 01 දරන විවෘත විශ්වවිද්‍යාල ආඥාපනතේ 19 වන කොටස සමඟ කියවිය යුතු 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 135 කොටස යටතේ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාල සභාව විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ 2016 අංක 9 දරන අතුරු ව්‍යවස්ථාව යටතේ ක්‍රියාත්මක වේ.

ජාත්‍යන්තර සබඳතා අංශය උපකුලපතිගේ සෘජු අධීක්ෂණය යටතේ අධ්‍යක්ෂවරයෙකුගේ මෙහෙයවීම මත ක්‍රියාත්මක වේ. එහි පරිපාලන සහ මූල්‍ය කටයුතු කළමනාකරණ මණ්ඩලයක් විසින් ක්‍රියාත්මක කරනු ලබයි. ජාත්‍යන්තර සබඳතා අංශයේ අධ්‍යක්ෂ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෙකු වන අතර උපකුලපතිගේ නිර්දේශය මත ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ අනුමැතිය මත පත් කරනු ලබයි.

ජාත්‍යන්තර සබඳතා උපායමාර්ග සකස් කර ගැනීමේ දී සහ ලෝකයේ ඇති වෙනත් විශ්වවිද්‍යාල හෝ අනෙකුත් ආයතන සමඟ විධිමත් සබඳතා පාර්ශ්වකාරිත්වයන් ඇතිකර ගැනීමේදී ජාත්‍යන්තර සබඳතා අංශය විශිෂ්ට උපදෙස් සැපයීම සහ මගපෙන්වීම සිදු කරයි.

ජාත්‍යන්තර සබඳතා අංශයේ අරමුණු පහත සඳහන් වේ.

(අ) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය ආයතන, පීඨ, සනාථන සභාව හා පාලක සභාව සඳහා උපාය මාර්ග හා විශේෂිත නිර්දේශ සකස් කිරීම.

(ආ) විදේශීය ආයතන සමඟ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් ඇතිකරගත් විධිමත් ද්වීපාර්ශ්වික හා බහුපාර්ශ්වික ගිවිසුම් සහ අවබෝධතා ගිවිසුම් වැඩි දියුණු කිරීම හා සමාලෝචනය කිරීමට පහසුකම් සැලසීම.

(ඇ) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩලය සහ ශිෂ්‍යයින් සඳහා ජාත්‍යන්තර සහයෝගිතා පර්යේෂණ සහ අධ්‍යයන වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම හා ප්‍රවර්ධනය කිරීම.

(ඈ) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩලය සඳහා ජාත්‍යන්තරව පිළිගත් පර්යේෂකයින් හා ගුරුවරුන් ලෙස තම හැකියාවන් වැඩි දියුණු කර ගැනීම සඳහා අවස්ථා සැලසීම.

(ඉ) ජාත්‍යන්තර ව්‍යාපෘති හා වෙනත් ක්‍රියාකාරකම්වලට සම්බන්ධ වෙමින් ශ්‍රී ලංකාවේ සංවර්ධනය සඳහා දායක වීමට ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩලයට සහාය වීම.

(ඊ) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩලය හා ශිෂ්‍යයින් සඳහා සහයෝගයෙන් කටයුතු කිරීමට, තොරතුරු බෙදා හැරීම හා ගෝලීයව දායකත්වයක් සැපයීම සඳහා අවස්ථාවන් ලබා දීම.

(උ) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය උපාධිධාරීන් වෙත විදේශීය වෘත්තීය අවස්ථාවන් ගවේෂණය කිරීම සඳහා පහසුකම් සැලසීම.

(ඌ) විදේශීය ශිෂ්‍යයින්, ගුරුවරුන් හා වෙනත් අමුත්තන් වෙත ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය තුළ රැඳී සිටින කාල සීමාව අතරතුර අවශ්‍ය සහයෝගය ලබා දීම.

(එ) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ වැඩසටහන් විදේශවල ප්‍රවර්ධනය කිරීම සහ සබඳතා ගොඩනගා ගැනීම.

(ඒ) ශ්‍රී ලංකාව තුළ පවතින ප්‍රධාන රාජ්‍ය සහ රාජ්‍ය නොවන නියෝජිතායතන සහ රාජ්‍ය තාන්ත්‍රික දූත කණ්ඩායම් සහ විදේශ වල සිටින ලාංකීය දූත කණ්ඩායම් සමඟ සබඳතා සම්බන්ධීකරණය කිරීම.

ඉහත අරමුණු සාක්ෂාත් කර ගැනීමේදී ජාත්‍යන්තර සබඳතා අංශය 2013 සිට 2022 දක්වා පසුගිය වසර නවයක කාල සීමාව තුළ ක්‍රියාකාරකම් බොහෝමයක් සඳහා සක්‍රීය ලෙස දායක විය. පහත සඳහන් වන්නේ එම ක්‍රියාකාරකම්වල කෙටි සාරාංශයකි.

1. ද්විපාර්ශ්වික හා බහුපාර්ශ්වික සබඳතා සඳහා පහසුකම් සැලසීම

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම්

අනු අංක	ආයතනයේ නම	රට	වලංගු කාල සීමාව
01	University of Essex	එක්සත් රාජධානිය	වසර 5
02	Shanghai Open University	චීනය	වසර 5
03	Workforce Europe GMBH	ජර්මනිය	වසර 5

එක්සත් රාජධානියේ, එසෙක්ස් විශ්වවිද්‍යාලය සමඟ ඇති කරගත් ගිවිසුම

එක්සත් රාජධානියේ, එසෙක්ස් විශ්වවිද්‍යාලයේ උසස් නියෝජිත මණ්ඩලයක් 2023 ඔක්තෝබර් 23වන දින චාරිකාවක් සිදු කරන ලදි. ආචාර්ය. ඇනෙසි ලැක්ස්, සහයෝගීතා පීඨාධිපති (අධ්‍යාපන), වැනේසා පෝටර් මෙය, ගෝලීය උප සභාපති, සන්දීප් ශර්මා මහතා, අධ්‍යක්ෂ- ඉන්දීය උපමහද්වීප කලාපය සහ ශ්‍රී ලංකාව සහ මොරිෂස් සඳහා තනූජා රවීන්ද්‍රන් මෙය යන සාමාජිකයින්ගෙන් එසෙක්ස් නියෝජිත මණ්ඩලය සමන්විත විය. මහාචාර්ය. ඇන්තනි ෆෝස්ටර්, එසෙක්ස් විශ්වවිද්‍යාලයේ උපකුලපති විසින් මාර්ගගත ක්‍රමවේදය හරහා ඔවුන් ඇමතීම සිදු කරන ලදි. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය සහ එසෙක්ස් විශ්වවිද්‍යාලය විසින් පුළුල් සහයෝගීතාවයක් සඳහා අනාගත සැලසුම් පිළිබඳ සාකච්ඡා කිරීමට සහ කළමනාකරණ අධ්‍යයනවේදී උපාධිය හා සම්බන්ධ ගිවිසුම දීර්ඝ කිරීම සිදු කරන ලදි.

විද්‍යාවේදී උපාධිය සහ කළමනාකරණ අධ්‍යයනවේදී උපාධිවල ඉගෙනුම් විෂය ක්ෂේත්‍ර සහ විශේෂිකරණ ක්ෂේත්‍ර පුළුල් කරමින් සම්බන්ධ කිරීමට එක්සත් රාජධානියේ එසෙක්ස් විශ්වවිද්‍යාලය සමඟ ගිවිසුමක් ඇති කර ගැනීම ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් සිදු කරන ලදි. මෙම වැඩසටහන මඟින් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය තුළ තෙවන සහ සිව් වන වසරවල අධ්‍යාපනය සම්පූර්ණ කර ඇති ශිෂ්‍යයින්ට එසෙක්ස් විශ්වවිද්‍යාලයේ උපාධි සහ පශ්චාත් උපාධි සඳහා ඇතුළත් වීමට අවස්ථාව හිමි වේ. විවෘත විශ්වවිද්‍යාලයේ විද්‍යාවේදී සහ කළමනාකරණ අධ්‍යයන වැඩසටහන් එසෙක්ස් විශ්වවිද්‍යාලයේ අදාළ වැඩසටහන් උපාධි සහ පශ්චාත් උපාධි හා සම්බන්ධ කර ඇත. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාල ශිෂ්‍යයින්ට පහත සඳහන් දිරිගැන්වීම් පිරිනමනු ලැබේ.

- ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය ශිෂ්‍යයින්ට එසෙස්ක්ස් විශ්වවිද්‍යාලයේ 4 වන මට්ටමට ඇතුළත් වීමේදී 20%ක ශිෂ්‍යත්වයක් පිරිනැමීම.
- එසෙක්ස් විශ්වවිද්‍යාලයට ඇතුළත් වීම සඳහා අවශ්‍ය GPA අගය 2.7 දක්වා අඩු කිරීම.
- එසෙක්ස් විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධිවලට ඇතුළත් වන ශිෂ්‍යයින් සඳහා IELTS අවශ්‍ය නොවීම.

ජාත්‍යන්තර සබඳතා ඒකකය විසින් අනාගත ශිෂ්‍යයින්ට අවශ්‍ය තොරතුරු ලබා ගැනීම සඳහා බාගත කළ හැකි තොරතුරු පත්‍රිකා සහිතව විද්‍යාවේදී සහ කළමනාකරණ අධ්‍යනවේදී උපාධි වැඩසටහන් සඳහා වෙබ් පිටුවක් වැඩි දියුණු කරන ලදි.

ශ්‍රී ලංකා කොමර්ෂල් බැංකුව සමඟ ඇති කරගත් විශේෂ අධ්‍යාපන ණය යෝජනා ක්‍රමය

- ශ්‍රී ලංකා කොමර්ෂල් බැංකුව සමඟ ඇතිකරගත් විශේෂ අධ්‍යාපන ණය යෝජනා ක්‍රමය සඳහා වන අවබෝධතා ගිවිසුම අත්සන් කිරීමේ උත්සවය 2023 ඔක්තෝබර් 23 වන දින සිදු කරන ලදි. සෙල්ලතුරෙ ප්‍රභාගර් මහතා, ප්‍රධාන මෙහෙයුම් නිලධාරී සහ දෙලක්ශාන් හෙට්ටිආරච්චි මහතා, කොමර්ෂල් බැංකුවෙහි පුද්ගලික බැංකු කටයුතු නියෝජ්‍ය ප්‍රධාන කළමනාකරු විසින් අවබෝධතා ගිවිසුම අත්සන් කරන ලදි.

- ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය ශිෂ්‍යයින් සඳහා විශේෂ අධ්‍යාපන ණය පහසුකම සඳහා වන වෙබ් අඩවිය ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය උපකුලපති විසින් මෙම අවස්ථාවේදී ආරම්භ කරන ලදි. මඟින් මෙම වෙබ් අඩවිය https://ou.ac.lk/educational-loans/ වෙත පිවිසිය හැකි ය.

ෂැංහයි විවෘත විශ්වවිද්‍යාලය, චීනය

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් චීනයේ ෂැංහයි විවෘත විශ්වවිද්‍යාලය සහ Bank of China Ltd සමඟ 2023 දෙසැම්බර් 12 වන දින තෙක් පාර්ශවීය ගිවිසුමක් අත්සන් තබන ලදි. මෙහි අරමුණ වනුයේ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය තුළ චීන භාෂා මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම වේ. ෂැංහයි විවෘත විශ්වවිද්‍යාලයේ උප සභාපති ශැං ජින් මෙයගේ ප්‍රධානත්වයෙන් ෂැංහයි විවෘත විශ්වවිද්‍යාලයේ නියෝජිත මණ්ඩලයේ සහභාගීත්වයෙන් 2023 ජූලි 07 වන දින නිල වශයෙන් ස්ථාපිත කරන ලදි. භාෂා අධ්‍යයන අධ්‍යනාංශය විසින් ෂැංහයි විවෘත විශ්වවිද්‍යාලය සමඟ සහයෝගීතාවයෙන් ශ්‍රී ලංකාවට චීන භාෂා පාඨමාලා හඳුන්වා දීමට සැලසුම් කර ඇත.
එසේම, චීනය තුළ සිංහල භාෂාව ඉගැන්වීමට ෂැංහයි විවෘත විශ්වවිද්‍යාලය සැලසුම් කරමින් පවතී.

- **Workforce Europe GMBH, Germany සමඟ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය සහයෝගීතාව**
  පහත සඳහන් අරමුණු ඇතිව Workforce Europe GMBH, Germany සමඟ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදි.

  - ශ්‍රී ලංකාව තුළ හෙද අධ්‍යයන කාර්ය මණ්ඩලයක් නිර්මාණය කිරීම තුළින් හෙද අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම. 'German Recognition of Sri Lankan Nurses' වැඩසටහන හරහා මෙය සාක්ෂාත් කරගනු ලැබේ.
  - ජර්මානු වෙළඳපොළ සඳහා යෝග්‍ය වන පරිදි හෙදියන්ට සුදුසුකම් ලබා දීම සඳහා ජර්මානු භාෂා පාඨමාලා පිරිනැමීම සහ පිළිගැනීමේ ක්‍රියාවලියේදී ඔවුන්ට මග පෙන්වීම.
  - ජර්මානු රැකියා වෙළඳපොළ සඳහා ශ්‍රී ලාංකික හෙද සුදුසුකම් ප්‍රතීතනය කිරීම (accreditation) සඳහා කටයුතු කිරීම.
  - 2023 වර්ෂයේදී, මෙම වැඩසටහන යටතේ පවත්වන ලද ජර්මානු භාෂා පාඨමාලාව සඳහා හෙදියන් 100කින් සමන්විත කණ්ඩායම් 5ක් ලියාපදිංචි කරන ලදි.

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් අත්සන් කරන ලද අභිප්‍රාය ලිපි

අනු අංක	ආයතනයේ නම	රට	වලංගු කාල සීමාව
01	End of Life Care Nursing Education Consortium (ELNEC)	ඉන්දියාව	වසර 3
02	CNNC London Private Limited	එක්සත් රාජධානිය	වසර 3

- **End-of-Life Nursing Education Consortium, India සමඟ සහයෝගීතාව**

  උපාධි අපේක්ෂක හෙදියන් සඳහා palliative care nursing පාඨමාලා පිරිනැමීමට American Association of College of Nursing (AACN)ට අනුබද්ධ End of Life Care Nursing Education Consortium (ELNEC), India මඟින් පිරිනමනු ලබයි.

- **CNNC London Private Limited, UK සමඟ සහයෝගීතාව**

  විදෙස් රටවල සත්කාරක සේවා රැකියා ලබා ගැනීමට බලාපොරොත්තු වන අය සඳහා සත්කාරක සේවා පිළිබඳ කෙටි පාඨමාලාවක් වැඩි දියුණු කිරීමට 2023 මැයි 27 වන දින CNCC London Private Limited, UK සමඟ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් අභිප්‍රාය ලිපි අත්සන් තබන ලදි. 2023 වර්ෂයේදී, ශිෂ්‍යයින් 121 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායම් 3ක් මෙම වැඩසටහන සඳහා ලියාපදිංචි වන ලදි.

අනුමැතිය අපේක්ෂිත අවබෝධතා ගිවිසුම්

අනු අංක	ආයතනයේ නම	රට	වලංගු කාල සීමාව
01	National Science Foundation	ශ්‍රී ලංකාව	
02	Innopolis University	රුසියාව	වසර 5
03	Tomorrow Technology Education Services Centre	චීනය	වසර 5
04	RMIT	ඕස්ට්‍රේලියාව	

- **ජාතික විද්‍යා පදනම**

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයෙහි අධ්‍යයන විෂය ක්ෂේත්‍රය උසස් තත්වයකට රැගෙන යාමට සහ පුළුල් කිරීම සඳහා ජාතික විද්‍යා පදනමෙහි Global Digital Platform භාවිතය වැඩි දියුණු කිරීමට විවෘත විශ්වවිද්‍යාලයීය උපකුලපති සහ ජාතික විද්‍යා පදනමෙහි සභාපති සමඟ පැවති රැස්වීමේදී ආරම්භ අකරන ලදි. මේ යටතේ ඇතැම් වැඩසටහන් දැනටමත් පවත්වා ඇත. විදෙස්ගත ශ්‍රී ලාංකික විද්‍යාඥයින් විසින් පවත්වන ලද රැස්වීම් සහ ආරාධිත දේශනද මෙයට ඇතුළත් වේ. ජාතික විද්‍යා පදනම සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹීම සඳහා කටයුතු සම්පූර්ණ කර ඇති අතර එය අත්සන් කිරීමට අපේක්ෂා කෙරේ. ජාතික විද්‍යා පදනමේ Global Digital Platformහි ලියාපදිංචි විදෙස්ගත විද්‍යාඥයින්ගේ සක්‍රීය සහභාගීත්වය හරහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය අධ්‍යයන කටයුතු වැඩි දියුණු කිරීම අපේක්ෂා කෙරේ.

- **ඉනොපොලිස් විශ්වවිද්‍යාලය, රුසියාව**

රුසියානු සමූහාණ්ඩුවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ තානාපති හරහා ඉනොපොලිස් විශ්වවිද්‍යාලයේ සහයෝගීතාවය සඳහා යෝජනාවක් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය වෙත ලැබිණ. ඉනොපොලිස් විශ්වවිද්‍යාලය යනු තොරතුරු තාක්ෂණය සඳහා වන රුසියානු විශේෂ ආර්ථික කලාපයක් වන ඉනොපොලිස් නගරයේ පිහිටා ඇති ස්වාධීන, ලාබ අරමුණු කර නොගත් උසස් අධ්‍යාපන ආයතනයකි. තොරතුරු තාක්ෂණය සහ රොබෝ විද්‍යාව යන ක්ෂේත්‍රවල අධ්‍යාපනය සහ පර්යේෂණ විශේෂීකරණය ඉනොපොලිස් විශ්වවිද්‍යාලය විසින් සිදු කරයි.

මරියා ඔබ්‍රස්ටිසෝවා මෙය, හි අධ්‍යක්ෂ සහ ඉස්කන්දර් බරියෙව්, නියෝජ්‍ය අධ්‍යක්ෂ යන ඉනොපොලිස් විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 2023 ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාල පර්යේෂණ සැසියෙහි ප්‍රධාන කථිකයෙක් සහ සම්පත්දායකයෙක් වශයෙන් පූර්ව සම්මන්ත්‍රණ වැඩමුළු සඳහා දායකත්වය සපයන ලදි. සහයෝගී ව්‍යාපෘති කිහිපයක් ඉනොපොලිස් විශ්වවිද්‍යාලය සමඟ සිදු කෙරෙමින් පවතින අතර අවබෝධතා ගිවිසුම ඉක්මනින් අත්සන් කරනු ලැබේ.

- **Tomorrow Technology Education Service Center (TTESC), China සමඟ සහයෝගීතාව**

Tomorrow Technology Education Service Center (TTESC) විසින් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ නම් කරනු ලබන වැඩසටහන් ප්‍රවර්ධනය කිරීමට විවෘත විශ්වවිද්‍යාලය සමඟ හවුල්කාරීත්වයෙන් කටයුතු කරනු ලබයි. චීන ශිෂ්‍යයින්ගේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අදාළ බඳවාගැනීම්, උපදේශනය, අයදුම්පත් සහාය සහ වෙනත් උපකාරක සේවා පිළිබඳ සහයෝගීතා ආයතනය වශයෙන් කටයුතු කරනු ලබයි.

මෙම අරමුණු සහිතව ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය සහ Tomorrow Technology Education Service Center (TTESC) අතර අවබෝධතා ගිවිසුමක් සහ ගිවිසුමක කටයුතු සිදු කෙරෙමින් පවතී. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ හෙද විද්‍යාපති උපාධි වැඩසටහන් සඳහා චීන අයදුම්කරුවන්ගේ සුදුසුකම් ඇගයීමට ලක් කිරීම විශ්වවිද්‍යාලය මඟින් සිදු කරනු ලබයි.

2. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩලය සහ ශිෂ්‍යයින් සඳහා ජාත්‍යන්තර සහයෝගීතා පර්යේෂණ සහ අධ්‍යයන වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.

- **ඕස්ට්‍රේලියාවේ RMIT විශ්වවිද්‍යාලය සමඟ අවබෝධතා ගිවිසුම සහ විෂය ඒකක ගිවිසුම**

විවෘත විශ්වවිද්‍යාලය විසින් RMIT විශ්වවිද්‍යාලය සමඟ 2022 වර්ෂයේ මුල් භාගයේ සිට ඵලදායී හවුල්කාරීත්වයකින් කටයුතු කරනු ලබයි. ඉංජිනේරු විද්‍යාව සහ සෞඛ්‍ය විද්‍යා ක්ෂේත්‍රවල අධ්‍යයන වැඩසටහන් එකිනෙකට සම්බන්ධ කිරීම සඳහා පුළුල් යෝජනාවක් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් යවන ලදි. යෝජිත අධ්‍යයන වැඩසටහන්වලින් දෙකක් 2023 මැද භාගය වන විට RMIT වැඩසටහන් හා සම්බන්ධ කිරීම සිදු කරන ලදි.

එසේම, කාර්ය මණ්ඩලය විසින් පවත්වන ලද රැස්වීම් සහ සිදු කරන ලද චාරිකා මඟින් ආයතන දෙක අතර ඉතා හොඳ අවබෝධතාවයක් ඇති විය. මහාචාර්ය. සුජීව සේතුංග, නියෝජ්‍ය උපකුලපති, පර්යේෂණ හා නවෝත්පාදන සහ මහාචාර්ය. කෙවින් සැන්ග්, සිවිල් ඉංජිනේරු අංශ ප්‍රධානී යන නියෝජිතයින්ගෙන් සැදුම් ලත් කණ්ඩායමක් අනාගත සහයෝගීතාව පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා නොවැම්බර් මස 28 වන දින ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයට පැමිණීමට නියමිත වේ. අවබෝධතා ගිවිසුම සහ අදාළ විෂය ඒකක ගිවිසුම් සමාලෝචනය කිරීමේ අවසන් අදියරෙහි සිදු කෙරෙමින් පවතී.

3. සහයෝගිතා පර්යේෂණ සහ අධ්‍යයන වැඩසටහන් සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩලය වෙනුවෙන් අවස්ථා ලබා දීම

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩලය සඳහා විදේශීය සහයෝගීතා ක්‍රියාකාරකම් සිදු කිරීම වෙනුවෙන් පහසුකම් සැලසීමට ජාත්‍යන්තර සබඳතා ඒකකය විසින් පියවර ගෙන ඇත.

- **ආසියානු විවෘත විශ්වවිද්‍යාල සංගමයේ අන්තර් විශ්වවිද්‍යාල හුවමාරු මිත්‍රත්වය 2023**

	හවුල්කාරී විදේශ විශ්වවිද්‍යාලය	රට	ආසියානු විවෘත විශ්වවිද්‍යාල සංගමයේ ශිෂ්‍යත්වලාභියා	ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය තුළ ගත කරන කාල සීමාව
01	Allama Iqbal Open University	පකිස්තානය	මහාචාර්ය. මුනාසා ජබීන්	මාස 1 (නොවැම්බර්-දෙසැම්බර් 2023)
02	Shanghai Open University	චීනය	මහාචාර්ය. සන් චෞන්යුආන්	මාස 1 (නොවැම්බර්-දෙසැම්බර් 2023)

- **ජීව විද්‍යා පර්යේෂකයින් හමුවීම**

ජාත්‍යන්තර සබඳතා ඒකකය විසින් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය සහ එක්සත් රාජධානියේ එසෙක්ස් විශ්වවිද්‍යාලයීය පර්යේෂකයින් අතර හමුවක් 2023 ඔක්තෝබර් 17 වන දින සංවිධානය කරන ලදි. මෙහිදී ස්වභාවික විද්‍යා පීඨයේ පීඨ සමාජිකයින් සහ එසෙක්ස් හි සාමාජිකයින් අතර ඔවුන්ගේ පර්යේෂණ අභිරුචිය පිළිබඳ අදහස් හුවමාරු කර ගැනීම සිදු විය.

- **එක්සත් රාජධානියේ කීල් විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තරකරණයේ පීඨාධිපති ආචාර්ය. අනීටා හයේස් හමුවීම**

එක්සත් රාජධානියේ කීල් විශ්වවිද්‍යාලයේ ආචාර්ය. අනිටා හයේස් 2023 නොවැම්බර් 27 වන දින ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය වෙත පැමිණියා ය. අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඒකාබද්ධ පශ්චාත් උපාධි වැඩසටහනක් සහ ශිෂ්‍ය සංචලතා වැඩසටහන හඳුන්වාදීම ඇතුළු අනාගත සහයෝගීතාව පිළිබඳ සාකච්ඡා අධ්‍යාපන පීඨය විසින් පවත්වන ලදි.

4. ගෝලීය වශයෙන් සහයෝගයෙන් කටයුතු කිරීමට, දැනුම බෙදා හැරීමට සහ දායක වීමට අවස්ථාව ඇති ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩලය සහ ශිෂ්‍යයින් දැනුවත් කිරීම

- **අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා රාජ්‍යතාන්ත්‍රික කුසලතා**

“Diplomatic Skills Programme for Academics” මැයෙන් දෙදින වැඩමුළුවක් ජූනි 06-07 දිනවලදී බණ්ඩාරනායක ජාත්‍යන්තර රාජ්‍යතාන්ත්‍රික පුහුණු ආයතනයේදී පවත්වන ලදි. මෙම වැඩසටහන බණ්ඩාරනායක ජාත්‍යන්තර රාජ්‍යතාන්ත්‍රික පුහුණු ආයතනය සමඟ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර සබඳතාඒකකය සහ කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය එක්ව සැලසුම් කර වැඩි දියුණු කරන ලදි. කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය සියළුම පීඨවලට සහ ඒකක කිහිපයකට ආරාධනා පත්‍ර යවන ලදි. ජාත්‍යන්තර සබඳතා ඒකකය විසින් රාජ්‍ය විශ්වවිද්‍යාල අතර සහයෝගීතාව පවත්වා ගැනීමේ පියවරක් වශයෙන් අනෙකුත් විශ්වවිද්‍යාල වෙත සීමිත ආසන සංඛ්‍යාවක් පිරිනමමින් ආරාධනා පත්‍ර යවන ලදි. කැළණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, මොරටුව විශ්වවිද්‍යාලය සහ වයඹ විශ්වවිද්‍යාලය යන විශ්වවිද්‍යාලවලින් ආරාධිතයින් 5 දෙනෙක් ඇතුළුව ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය නියෝජනය කරන අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 28 දෙනෙකු මේ සඳහා සහභාගී විය.

විදෙස් දූත මණ්ඩලවල සේවය කළ කාර්යමණ්ඩල සාමාජිකයින්, තානාපතිවරුන් සහ දූතමණ්ඩල ප්‍රධානීන්, ශ්‍රී ලංකාවේ ද්වීපාර්ශ්වික සහ බහුපාර්ශ්වික ගිවිසුම්වල ප්‍රධාන ගනුදෙනුකරුවන් සහ සහයෝගී නායකයින් මෙම වැඩසටහනෙහි සම්පත්දායකයින් විය.

දෙදින වැඩමුළු වෙනුවෙන් තම කාලය කැප කර සහභාගි වූ 28 දෙනාටම සහතික පත්‍ර පිරිනමන ලදි. දෙදින වැඩමුළු වෙනුවෙන් තම කාලය කැප කර සහභාගි වූ 28 දෙනා සඳහා සහතික පත්‍ර පිරිනමන ලදි. බණ්ඩාරනායක ජාත්‍යන්තර රාජ්‍යතාන්ත්‍රික පුහුණු ආයතනයේදී විශ්වවිද්‍යාලයීය අධ්‍යයන කාර්ය මණ්ඩලය වෙනුවෙන් එවැනි වැඩසටහනක් පැවැත්වූ ප්‍රථම අවස්ථාව මෙය වූ අතර එම වැඩසටහන අතරතුර විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ ක්‍රියාකලාපය ඔවුන් විශේෂයෙන් අගය කළහ.

- **ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ පවත්වන ලද සම්මන්ත්‍රණ සඳහා පහසුකම් සැලසීම**

වැඩමුළුවේ/ සම්මන්ත්‍රණයේ නම	**නියෝජිතයා**	**අනුබද්ධ ආයතනය**
විවෘත විශ්වවිද්‍යාලයීය පර්යේෂණ සැසි 2023	ඉස්කන්දර් බරියෙව් මහතා, ප්‍රථම උප විදුහල්පති, නියෝජ්‍ය අධ්‍යක්ෂ - පූර්ව සම්මන්ත්‍රණ වැඩමුළුව සඳහා සම්පත්දායකයෙකු ලෙස සහ ප්‍රධාන දේශකයෙකු ලෙස මරියා ඔබ්‍රස්ට්සෝවා මෙය, Institute of Additional Educationහි අධ්‍යක්ෂ	ඉනොපොලිස් විශ්වවිද්‍යාලය, රුසියාව

- **ජාත්‍යන්තර සබඳතා ඒකකය විසින් සංවිධානය කරන ලද වෙබ් සම්මන්ත්‍රණ**

වෙබ් සම්මන්ත්‍රණයේ මාතෘකාව	**නියෝජිතයා**	**අනුබද්ධ ආයතනය**
දැනුවත් කිරීමේ සැසිය 1 - එසෙක්ස් විශ්වවිද්‍යාලය, එක්සත් රාජධානිය දිනය: 2023.07.19	තනූජා රවීන්ද්‍රන් මෙය (ජ්‍යෙෂ්ඨ බඳවාගැනීමේ සහ හවුල්කාරිත්ව උපදේශක, ශ්‍රී ලංකාව, මොරිෂස් සහ නේපාලය	එසෙක්ස් විශ්වවිද්‍යාලය, එක්සත් රාජධානිය

4. වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම සහ හවුල්කාරිත්වයන් ඇති කිරීම.

CSCSE විසින් පිළිගත් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

ජාත්‍යන්තර සබඳතා ඒකකය විසින් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය සඳහා චීනය තුළ පිළිගැනීම ලබා ගැනීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ Chinese Service Centre for Scholarly Exchangeහි වෙබ් අඩවිය වෙත අයදුම්පත්‍රයක් සාර්ථකව ඉදිරිපත් කරන ලදි.

Overseas ready වැඩසටහන්

overseas ready මාර්ගෝපදේශ යටතේ, සත්ත්ව විද්‍යා අධ්‍යනාංශය විසින් “Tropical Biodiversity and Ecotourism Field Course”නමින් කෙටි පාඨමාලාවක් විදෙස් ශිෂ්‍යයින්ට පිරිනැමීම සඳහා වැඩි දියුණු කරන ලදි. ශ්‍රී ලංකාවේ ඉංජිනේරු තාක්ෂණය සහ ස්වභාවික උරුමය නමින් සමගාමී වැඩසටහනක් පාරිසරික සහ තිරසාර සංවර්ධන මධ්‍යස්ථානය විසින් දැනටමත් වැඩි දියුණු කරන ලදි. මෙම වැඩසටහන් දෙකම 2024 මැද භාගයේදී දියත් කෙරේ.

5. විදේශීය වෘත්තිය අභිවෘද්ධිය ගවේශණය කිරීම සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය ශිෂ්‍යයින් වෙත පහසුකම් සැලසීම

- **Travel to Farm, ඩෙන්මාර්ක්**

Travel to Farm (T2F) 1912 දී ඩෙන්මාක්වලදී ආරම්භ කරන ලදි. එය ඩෙන්මාර්ක්හි තරුණ විදේශීය ගොවීන් සහ වෙනත් රටවල තරුණ ඩෙන්මාර්ක් ගොවීන් සඳහා කෘෂිකර්මාන්තය තුළ ප්‍රායෝගික පුහුණුවක් ලබා දෙනු ලබයි. T2F සඳහා ලෝකයේ සෑම ප්‍රදේශයකම විවිධ රටවල් 30කට වැඩි සංඛ්‍යාවක විවිධ සහයෝගීතා හවුල්කරුවන් 40ක් පමණ ඇත. Travel to Farmහි කාර්යාලය කෝපන්හේගන්හි ඩෙන්මාර්ක් කෘෂිකර්ම සහ ආහාර කවුන්සිලයේ (ගොවි සංවිධානය) ලේකම් කාර්යාලයේ පිහිටා ඇත.

T2F සමඟ පැවති සාර්ථක සාකච්ඡා කිහිපයකින් පසුව, ශිෂ්‍ය හුවමාරුව සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් අවබෝධතා ගිවිසුමක් සහ ගිවිසුමක් අත්සන් තබන ලදි. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් ඩෙන්මාර්කය වෙත ශිෂ්‍යය සංචලතා වැඩසටහනක් ආරම්භ කරන ලද අතර එහිදී ශිෂ්‍යයින් සඳහා ප්‍රධාන වශයෙන් සීමාවාසික පුහුණුවක් ලබා දෙනු ලබයි.





6. ප්‍රධාන ජාත්‍යන්තර රාජ්‍ය හා රාජ්‍ය නොවන නියෝජිත ආයතන, ශ්‍රී ලංකාවේ රාජ්‍යතාන්ත්‍රික මෙහෙයුම් සහ විදෙස් රටවල ශ්‍රී ලංකාවේ මෙහෙයුම් සමඟ සබඳතා සම්බන්ධීකරණය කිරීම.

- **රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල සමඟ රැස්වීම්:**
  - රුසියානු විශ්වවිද්‍යාල සමඟ අධ්‍යයන සහයෝගීතාව සඳහා රුසියාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සමඟ රැස්වීම් කිහිපයක් පවත්වන ලදි.
  - චීන භාෂා මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම සහ ඒ සඳහා හැකි සහාය ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ චීන තානාපති කාර්යාලයේ සංස්කෘතික නිලධාරීන් සමඟ හමුවක් පැවැත්විණ.

7. සහයෝගීතා ව්‍යාපෘති

ගොවීන් සඳහා පොදුරාජ්‍ය මණ්ඩලීය යාවජ්ව ඉගෙනුම්:

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සමඟ විද්‍යුත් විසඳුමක් මත ඉදිරිපත් කරන ලද ඒකබද්ධ ව්‍යාපෘති යෝජනාවක් සාර්ථක වූ අතර පොදු රාජ්‍ය මණ්ඩලීය යාවජ්ව ඉගෙනුම් විසින් ව්‍යාපෘතියේ පළමු අදියර සඳහා අරමුදල් අනුමත කරන ලදි.

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් සහ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකාවේ අපනයන කෘෂිකර්මාන්තයේ ගොවීන් සඳහා ජීවිත කාලය පුරාම අධ්‍යාපනය ලැබීමේ ව්‍යාපෘතියක් ලෙස නම් කර ඇති මෙම ව්‍යාපෘතිය ආදායම් වැඩි දියුණු කිරීම සඳහා ගොවි පවුල් වෙත ඔවුන්ගේ ප්‍රවේශය වැඩි දියුණු කිරීමට අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට හැකි වන පරිදි තිරසාර ආකෘතියක් ගොඩනැගීම සහ අපනයන භෝගවල ගුණාත්මකභාවය සහ ප්‍රමාණය මෙහෙයුම් විශිෂ්ටත්වය ළඟා කර ගැනීමට සහ පරිසරය සුරැකීමට අරමුණු කරයි. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් L3Fහි තිරසාර ආකෘතිය ගොඩනැගීම සඳහා අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට සහාය වීම සඳහා ප්‍රධාන කාර්ය භාරයක් ඉටු කරනු ඇත. මෙහි පළමු අදියර සාර්ථකව නිම කළ අතර දෙවන අතියර සඳහා මූල්‍ය ප්‍රතිපාදන අනුමත කරන ලදි.

8. විදේශීය විශ්වවිද්‍යාල සහ ආයතන සමඟ හවුල්කාරිත්වය වර්ධනය කිරීම

(අ) 2023 - ජාත්‍යන්තර සබඳතා ඒකකය විසින් පහසුකම් සපයන ලද විදෙස් පර්යේෂණ ශිෂ්‍යයින්

අනු අංකය	රට	ශිෂ්‍යයා	පර්යේෂණ මාතෘකාව	අනුබද්ධිත ආයතනය
01	බෙල්ජියම	එලන් ඇලර්ට්ස් මෙය	Developing a sustainable & responsible tourism project	ලියුවන් හා ලිම්බර්ග් විශ්වවිද්‍යාල විදුහල (UCLL)
02	බෙල්ජියම	එස්මී ස්ටෙර්ක්ස් මෙය	Health education	ලියුවන් හා ලිම්බර්ග් විශ්වවිද්‍යාල විදුහල (UCLL)
03	බෙල්ජියම	ෆියෙන් ස්මෙට්ස් මෙය	Nutritional education – local products	ලියුවන් හා ලිම්බර්ග් විශ්වවිද්‍යාල විදුහල (UCLL)
04	බෙල්ජියම	හෙලේනා ටෝර්ෆ්ස් මෙය	Focus on improving nutrition, and possibly agriculture	ලියුවන් හා ලිම්බර්ග් විශ්වවිද්‍යාල විදුහල (UCLL)
05	බෙල්ජියම	ජේඩ් එයිජ්ක්මන්ස් මෙය	Behavioral guidance for children in the probation system	ලියුවන් හා ලිම්බර්ග් විශ්වවිද්‍යාල විදුහල (UCLL)
06	බෙල්ජියම	ජේඩ් ට්‍රසෙග්නී	Possibilities regarding inclusive education	ලියුවන් හා ලිම්බර්ග් විශ්වවිද්‍යාල විදුහල (UCLL)
07	බෙල්ජියම	ජොරේන් රේසින්ඩර්ස් මහතා	A psycho-social approach to labour market integration of vulnerable groups	ලියුවන් හා ලිම්බර්ග් විශ්වවිද්‍යාල විදුහල (UCLL)
08	බෙල්ජියම	ලියන් ද බ්‍රයන් මෙය	Socio-medical care & gender-based violence	ලියුවන් හා ලිම්බර්ග් විශ්වවිද්‍යාල විදුහල (UCLL)
09	නෙදර්ලන්තය	හියුගෝ තියරි ද රෙම්බෝ මහතා	Changes and prospects of sustainable rice farming in Sri Lanka	උට්‍රෙච්ට් විශ්වවිද්‍යාලය



ලියුවන් හා ලිම්බර්ග් විශ්වවිද්‍යාල විදුහලෙහි විදේශීය පර්යේෂණ ශිෂ්‍යයින්ගේ 7 වන කණ්ඩායම ලියාපදිංචි කිරීම සහ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය අධීක්ෂකවරුන් හමුවීම.

(ආ) 2023 සංවිධානය කරන ලද ජනප්‍රිය දේශන (මෙම සියළුම දේශන ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියෙන් නැරඹිය හැකි ය)

අනු අංකය	දේශන මාතෘකාව	ඉදිරිපත් කරන්නා	විශ්වවිද්‍යාලය
01	Transformation from Manual Operations to Digitalization at Allama Iqbal Open University Pakistan: A success story with the highlights of the research project on Accessing Quality Assurance Dimensions of ICT Technology in Online Library Services: A Distance Learning Perspective	මහාචාර්ය. මුනාසා ජබීන්	අල්ලාමා ඉක්බාල් විවෘත විශ්වවිද්‍යාලය - පකිස්ථානය
02	A Brief Introduction about MOOCs in China Shanghai Open University as an example	මහාචාර්ය. සුන් චයුන්යාන්	ශැංහයි විවෘත විශ්වවිද්‍යාලය චීනය



මහාචාර්ය. මුනාසා ජබීන් විසින් පවත්වන ලද “Accessing Quality Assurance Dimensions of ICT Technology in Online Library Services: A Distance Learning Perspective in Asian Open Universities පිළිබඳ දේශනය



මහාචාර්ය. සුන් චයුන්යාන් විසින් පවත්වන ලද “A Brief Introduction about MOOCs in China; Shanghai Open University as an example පිළිබඳ දේශනය



AAOU අන්තර් විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩල හුවමාරු වැඩසටහන 2023

6.8 ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය

(1) බුද්ධිමය දේපළ ආරක්ෂණය

ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය විසින් පහත සඳහන් වෙළඳ ලකුණු, ව්‍යාපාර සැලසුම් සහ පේටන්ට් අයදුම්පත් ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය වෙත ඉදිරිපත් කරන ලදි.

වගුව 1 - බුද්ධිමය දේපළ ආරක්ෂණය පිළිබඳ සාරාංශය

අං.	මාතෘකාව	තත්ත්වය		
		ගොනු කළ	සංශෝධනය කළ	ප්‍රදානය කළ
වෙළඳ ලකුණු				
1	“ImFirst” - the logo designed to use in electronic game show buzzer system	✓		
2	“Neo” - the logo designed to use in the electronic demonstration kit	✓		
3	“NEOMAC-Next Level Machinery” - the logo designed to use in the products designed in NeoSpace Lab.	✓		
4	“STEMbox-Joy of Learning” - the logo designed to be used in the educational experiment kit designed for kids to make learning fun, engaging and memorable.	✓		
ව්‍යාපාර සැලසුම්				
1	Game Show Buzzer System	✓		
පේටන්ට්				
1	Canistel Ice Cream Sundae	✓		

2. නිෂ්පාදන වාණිජකරණය

ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය විසින් ව්‍යාපාර සමඟ 2023 වර්ෂය තුළ පහත සඳහන් වාණිජකරණ ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා මුලපිරීම සිදු කරන ලදි.

වගුව 2 - වාණිජකරණ ක්‍රියාකාරකම්

නිමැවුම	නිමැවුම්කරු	වාණිජකරණ හවුල්කරු	වර්තමාන තත්ත්වය
Gameshow Buzzer system	NeoSpace team of the Department of Physics	Telimac (Pvt) Ltd.	Commercialized
Sticker Labelling Machine	NeoSpace team of the Department of Physics	Telimac (Pvt) Ltd.	Commercialized
Fruit Flap	Dr. Nimsha Weerakkody	Growthex Marketing	Commercialized

2.1 Telimac Private Limited සමඟ බලපත්‍ර ගිවිසුම්



ශ්‍රී ලංකාවේ සංවර්ධනය සඳහා ස්වයංක්‍රීය යන්ත්‍රෝපකරණ විසඳුම් සහ පද්ධති සැපයීම වෙනුවෙන් සහයෝගීතාවයෙන් කටයුතු කිරීම සඳහා විවෘත විශ්වවිද්‍යාලය විසින් Telimac Private Limited සමඟ අවබෝධතා ගිවිසුමක් 2023 පෙබරවාරි 27 වන දින අත්සන් කරන ලදි.

රූපසටහන 2 - 1 Telimac Private Limited සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම

මෙම අවබෝධතා ගිවිසුම යටතේ තාක්ෂණ හුවමාරු ගිවිසුම් දෙකක් අත්සන් කරන ලදි.

"ImFirst" Gameshow Buzzer system

භෞතික විද්‍යා අධ්‍යනාංශයේ NeoSpace කණ්ඩායම විසින් "ImFirst '' නමින් විශ්වාසනීය සහ දැරිය හැකි මිලකට ලබාගත හැකි game show buzzer system වැඩි දියුණු කරන ලදි.

මෙම උපාංගය වේගවත් සහ විශ්වාසනීය අද්විතීය පරිපථයකින් සමන්විත වේ. මෙම නිෂ්පාදනය භාවිත කරන්නන්ට ගැළපෙන ආකාරයට නිර්මාණය කර ඇති අතර ගැනුම්කරුවන්ගේ අභිරුචියට අනුව වෙනස් කළ හැකි පරිදි සාමාජිකයින් 8ක් හෝ 16 දෙනෙකුට සම්බන්ධ විය හැකි ඒකක ආකෘතිවලින් සමන්විත වේ.

NeoSpace කණ්ඩායම විසින් වැඩි දියුණු කරන ලද *Sticker Labelling Machine*

මෙම ස්ටිකර් ලේබල් කිරීමේ යන්ත්‍රය මගින් බෝතල් කිරීමේ සහ ඇසුරුම් කිරීමේ කර්මාන්තය තුළ අලෙවි කිරීමට නියමිත නිෂ්පාදන ලේබල් කිරීමට සහ හඳුනා ගැනීමට භාවිත කළ හැකි අතර මෙය සහනදායී මිලකට ලබා ගත හැකි, එහා මෙහා රැගෙන යා හැකි, මල නොබැඳෙන වානේවලින් සාදන ලද රවුම් වීදුරු සහ PET බෝතල්වල ස්ටිකර් ඇලවීම සහ ලේබල් කිරීමට භාවිත කළ හැකි වේ. මෙම නිෂ්පාදනය මඟින් මුද්‍රණය කිරීම සහ ලේබල් කැපීම මෙන්ම එක් බෝතලයකට ලේබල් 2ක් ඇලවීමේ හැකියාව පවතී.



NeoSpace කණ්ඩායම විසින් වැඩි දියුණු කරන ලද ස්ටිකර් ලේබල් කිරීමේ යන්ත්‍රය 2023 ජනවාරි 16 වන දින ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය විසින් හඳුන්වා දෙන ලදි. සිලින්ඩරාකාර වීදුරු සහ පෙට් බෝතල්වල ස්ටිකර් හෝ ලේබල් ඇලවීම සඳහා මෙම යන්ත්‍රය භාවිත කළ හැකි ය. සිලින්ඩරාකාර වීදුරු සහ පෙට් බෝතල්වල ස්ටිකර් හෝ ලේබල් ඇලවීම සඳහා මෙම යන්ත්‍රය භාවිත කළ හැකි ය. මෙම යන්ත්‍රය කුඩා හා මධ්‍යම පරිමාණයේ කර්මාන්තවල අලෙවිය සඳහා ඇති නිෂ්පාදන ලේබල් කිරීමට සහ හඳුනා ගැනීමට නිර්මාණය කර ඇත.

රූපසටහන 2-2 ස්ටිකර් ලේබල් කිරීමේ යන්ත්‍රයේ වැඩ කටයුතු ආරම්භ කිරීම

2.2 Growthex Ceylon Private Limited සමඟ බලපත්‍ර ගිවිසුම්



ආචාර්ය. නිමිෂා වීරක්කොඩි සහ කණ්ඩායම විසින් වැඩි දියුණු කරන ලද ස්වභාවික පළතුරුවලින් සකස් කරන ලද කෙටි ආහාරයක් වන Fruit Flap සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් Growthex Marketing සමඟ තාක්ෂණය හුවමාරු කර ගැනීමේ ගිවිසුමක් අත්සන් කරන ලදි.

රූපසටහන 2-3 Growthex Ceylon Private Limited සමඟ තාක්ෂණය හුවමාරු කර ගැනීමේ ගිවිසුමක් අත්සන් කිරීම

3. පර්යේෂණ සහ සංවර්ධනය

ව්‍යාපාර සබඳතා මධ්‍යස්ථානය විසින් සමාජයට ප්‍රයෝජනවත් නිෂ්පාදන සහ සේවා බවට පත් කළ හැකි නවෝත්පාදන පර්යේෂණ ප්‍රතිඵල නිර්මාණය කිරීමටත් ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කරමින් රටේ ආර්ථික වර්ධනයටත් ප්‍රතිලාභ සැලසීමටත් කටයුතු කරයි. ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය විසින් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය ශිෂ්‍යයින් භාවිත කරනු ලබන startups නිර්මාණය කිරීමට හැකියාව ඇති නවෝත්පාදන නිෂ්පාදන වැඩි දියුණු කිරීම හෝ මෙම නිෂ්පාදන වෙළඳපොල වෙත ලබා දීම සඳහා වෙනත් සමාගම් හවුල්කරුවෙකු වෙත වාණිජකරණය කිරීම සඳහා පියවර ගෙන ඇත.

කාර්ය මණ්ඩල සාමාජිකයින් සහ ශිෂ්‍යයින් විසින් 2023 වර්ෂයේදී සිදු කරන ලද පර්යේෂණ සහ නවෝත්පාදනවල සාරාංශය පහත සඳහන් පරිදි වේ.

වගුව 3 : මෙම ව්‍යාපෘතිවල විවිධ අදියර වැඩි දියුණු කෙරෙමින් පවතී.

පර්යේෂණ ප්‍රතිඵලය	පීඨය	තත්ත්වය		
		මූලාකෘතිය	වැඩි දියුණු කළ	වාණිජකරණය කළ
Fruit leather	ස්වභාවික විද්‍යා	✓	✓	✓
Sticker Labelling Machine	ස්වභාවික විද්‍යා	✓	✓	✓
Gameshow Buzzer System	ස්වභාවික විද්‍යා	✓	✓	✓
Herbal Tea from Vernonia cinerea as an immunity Enhancer	ස්වභාවික විද්‍යා	✓	✓	
Encapsulated ready to use Prebiotic and Probiotic Pearls	ස්වභාවික විද්‍යා	✓	✓	
Banana fibre-based materials	පාරිසරික හා තිරසාර සංවර්ධන මධ්‍යස්ථානය	✓		
Laulu Ice Cream	පාරිසරික හා තිරසාර සංවර්ධන මධ්‍යස්ථානය	✓	✓	
Hybrid cleaning machine	ස්වභාවික විද්‍යා	✓		
Natural Weedicide	ස්වභාවික විද්‍යා	✓		
Low-cost Multi-purpose Colorimeter	ස්වභාවික විද්‍යා	✓		
Energy-saving Iron mat	ස්වභාවික විද්‍යා	✓		
Attachment to Rice cooker	ස්වභාවික විද්‍යා	✓		

Computerised Telescope Mount	ස්වභාවික විද්‍යා	✓		
Eco-friendly packaging material	ඉංජිනේරු තාක්ෂණ	✓		
STEM Science kit	ස්වභාවික විද්‍යා	✓		
Green Pepper Ketchup	පාරිසරික හා තිරසාර සංවර්ධන මධ්‍යස්ථානය	✓		
AI-based Tea processing system	ඉංජිනේරු තාක්ෂණ	✓		
Animal tracking system	ස්වභාවික විද්‍යා	✓		


3.1 පළතුරු සම් සහ පළතුරු පෙති



"Fruit Flap" යනු සෘතුමය පළතුරු (seasonal fruits) ආරක්ෂා කරගැනීමේ ඵලදායී ක්‍රමවේදයක් ලෙස කිසිදු ආහාර කල් තබා ගැනීමේ ද්‍රව්‍යයක් භාවිත නොකර 100%ක් ස්වභාවික, රසවත් සෞඛ්‍ය සම්පන්න පළතුරුවලින් සකස් කරන ලද කෙටි ආහාරයක් වේ. මෙය නොඇලවෙන මතුපිටක පිසින සහ වේලන ලද වෙනත් ද්‍රව්‍ය සමඟ ස්වභාවික පළතුරු යුෂ සාන්ද්‍රණයක් භාවිතයෙන් සකස් කරනු ලැබේ. මෙම නිෂ්පාදනය පෝෂණ අතිරේකයක් වන අතර වෙළඳපොළේ ඇති කෘතිම රසකැවිලි වෙනුවට ස්වභාවික පළතුරු ආදේශකයක් ලෙස භාවිත කළ හැකි වේ.

රූපසටහන 3-1 Fruit Flap


3.2 *"ImFirst"* Gameshow Buzzer System



භෞතික විද්‍යා අධ්‍යනාංශයේ NeoSpace කණ්ඩායම විසින් "ImFirst " නමින් විශ්වාසනීය සහ දැරිය හැකි මිලකට ලබාගත හැකි game show buzzer system වැඩි දියුණු කරන ලදි. මෙම උපාංගය වේගවත් සහ විශ්වාසනීය අද්විතීය පරිපථයකින් සමන්විත වේ. මෙම නිෂ්පාදනය භාවිත කරන්නන්ට ගැළපෙන ආකාරයට නිර්මාණය කර ඇති අතර ගැනුම්කරුවන්ගේ අභිරුචියට අනුව වෙනස් කළ හැකි පරිදි සාමාජිකයින් 8ක් හෝ 16 දෙනෙකුට සම්බන්ධ විය හැකි ඒකක ආකෘතිවලින් සමන්විත වේ.

රූපසටහන 3-2 GameShow Buzzer System

3.3 Sticker Labelling Machine ස්ටිකර් ලේබල් කිරීමේ යන්ත්‍රය



මෙම ස්ටිකර් ලේබල් කිරීමේ යන්ත්‍රය මගින් බෝතල් කිරීමේ සහ ඇසුරුම් කිරීමේ කර්මාන්තය තුළ අලෙවි කිරීමට නියමිත නිෂ්පාදන ලේබල් කිරීමට සහ හඳුනා ගැනීමට භාවිත කළ හැකි අතර මෙය සහනදායී මිලකට ලබා ගත හැකි, එහා මෙහා රැගෙන යා හැකි, මල නොබැඳෙන වානේවලින් සාදන ලද රවුම් වීදුරු සහ PET බෝතල්වල ස්ටිකර් ඇලවීම සහ ලේබල් කිරීමට භාවිත කළ හැකි වේ. මෙම නිෂ්පාදනය මගින් මුද්‍රණය කිරීම සහ ලේබල් කැපීම මෙන්ම එක් බෝතලයකට ලේබල් 2ක් ඇලවීමේ හැකියාව පවතී.

රූපසටහන 3-3 ස්ටිකර් ලේබල් කිරීමේ යන්ත්‍රය

3.4 Herbal Tea from *Vernonia cinerea* as an Immunity Enhancer

කැඳ සඳහා භාවිත කරන ඖෂධීය ශාකවලින්, *Vernonia cinerea* ශ්‍රී ලංකාවේ ගම් මට්ටමේ විවිධ රෝග සඳහා ප්‍රතිකාර කිරීමට භාවිත කෙරේ. *Vernonia cinerea* යනු දියවැඩියා වළක්වන, ප්‍රතිඔක්සිකාරක, ක්ෂුද්‍ර ජීවී නාශක,

ඉදිමුම වළක්වන සහ පිළිකා නාශක යන රෝග නිවාරණ ස්වභාවික ගුණයන්ගෙන් සමන්විත වන අතර එම නිස ඖෂධීය තේ පානයක් හෝ වෙළඳපොළේ අගය එකතු කළ නිෂ්පාදනයක් ලෙස වැඩි දියුණු කළ හැකි ය. වර්තමාන අධ්‍යයනය මඟින් පැහැදිලි කරන පරිදි *Vernonia cinerea*හි ශාක කොටස්වල සැලකිය යුතු ලෙස ඉහළ ප්‍රතිඔක්සිකාරක ක්‍රියාකාරීත්වයක් අන්තර්ගත වේ.

එම නිසා, *Vernonia cinerea* ශාක කොටස්වල ප්‍රතිඔක්සිකාරක ක්‍රියාකාරකම්වල වර්ධනය සඳහා ක්‍රියාකාරී සංයෝග දැනට පවතින සෞඛ්‍ය සම්පන්න පාන වර්ගවලට විකල්පයක් ලෙස භාවිත කළ හැකි අතර *Vernonia cinerea* භාවිතයෙන් සකස් කරන ඖෂධීය පාන ඇතුළු වාණිජකරණ නිෂ්පාදන වැඩි දියුණු කිරීමට මෙම ව්‍යාපෘතියෙන් අපේක්ෂා කෙරේ.

3.5 Encapsulated ready-to-use Prebiotic and Probiotic Pearls

මෙය ලොව පුරා කිරි තේ හෝ බීම වර්ග සමඟ පරිභෝජනය කළ හැකි මඤ්ඤොක්කා පිෂ්ඨය භාවිතයෙන් සකසන ලද ආහාරයක් (Bubbles or pearls) වන අතර ඉහළ මට්ටමේ වෙළඳපොළ තුළ ඉහළ ඉල්ලුමක් අත් පත් කරගෙන ඇත. මඤ්ඤොක්කාවල පිෂ්ඨය 90%ක් වියළි වශයෙන් අඩංගු වේ. එම නිසා, prebiotic and probiotic එකතු කිරීමෙන් ජෙව උපයෝගීතාව සහ පෝෂණ ගුණයෙන් උසස් කිරීමට අපේක්ෂා කෙරේ. මීට අමතරව, මෙහි (pearls) ව්‍යූහය සහ ගුණාංග විවිධ යෙදුම් කිහිපයකට ගැළපෙන පරිදි නවීකරණය කෙරේ. වැඩි දියුණු කරන ලද pearls බීම වර්ගවලට වඩා අතුරුපසක් ලෙස හෝ අතුරුපසක රස ගැන්වීම සඳහා ඉසීමට භාවිත කළ හැකි ය.

3.6 කෙසෙල් කෙඳි ආශ්‍රිත ද්‍රව්‍ය



කෙසෙල් කෙඳි ආශ්‍රිත සනීපාරක්ෂක තුවා සහ තේ බෑග් වැඩි දියුණු කිරීමේ අරමුණ වන්නේ අස්වනු නෙලන කාල සීමාව තුළ එකතු වන කෙසෙල් කඳේ කෘෂිකාර්මික අපද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් ප්‍රතිචක්‍රීකරණය කිරීම මඟින් පහසු මිලකට මිලදී ගත හැකි, පරිසර හිතකාමී නිෂ්පාදන නිර්මාණය කිරීමයි. ක්ෂුද්‍ර ජීවීන් නිසා විනාශයට පත් නොවන හා ගොඩ කළ බිම්වල එකතු වී ඇති කෘතිම කෙඳි වර්ග අඩංගු වාණිජ නිෂ්පාදන මෙන් නොව මෙම නව නිෂ්පාදන කොම්පොස්ට් කළ හැකි අතර රසායනික ද්‍රව්‍යවලින් තොර බැවින් බැහැර කිරීමේදී කිසිඳු දූෂණයක් සිදු නොවේ.

රූපසටහන 3-4 කෙසෙල් කෙඳිවලින් සකසන ලද පරිසර හිතකාමී පත්‍රිකා

3.7 ලාවුළු අයිස් ක්‍රීම්

මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ ලාවුළු පළතුර භාවිතයෙන් පළතුරු ආශ්‍රිත අයිස් ක්‍රීම් සකස් කිරීමයි. ලාවුළු යනු බීටා කැරොටීන් ඇතුළත් ඉහළ පෝෂණ අගයකින් සමන්විත අවම වශයෙන් භාවිතා වන පළතුරක් වේ. එය එතරම් රසවත් නොවන බැවින් බොහෝ දෙනා ආහාරයට ගැනීමට මැලි බවක් දක්වයි. අපගේ ඉලක්කය වන්නේ හොඳ රසයක්, ආකර්ෂණීය පැහැයක් සහ ඉහළ පෝෂණ අගයකින් සමන්විත ලාවුළු ආශ්‍රිත අයිස් ක්‍රීම් සකස් කිරීමයි.

3.8 දෙමුහුන් පිරිසිදු කිරීමේ යන්ත්‍රය

මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ දූවිලි, වැලි සහ ගම්මිරිස්වලින් ඉවත ලන අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා වාතය සහ කම්පනය භාවිතයෙන් දෙමුහුන් පිරිසිදු කිරීමේ යාන්ත්‍රණයක් සැලසුම් කර වැඩි දියුණු කිරීමයි. මෙම යන්ත්‍රය මඟින් කාලය සහ ශ්‍රමය වැඩි වශයෙන් වැයවන සාම්ප්‍රදායික ගම්මිරිස් පිරිසිදු කිරීමේ ක්‍රියාවලිය ප්‍රතිස්ථාපනය කෙරේ. දෙමුහුන් පිරිසිදු කිරීමේ යන්ත්‍රය ක්‍රියා කරවීමට සහ අළුත්වැඩියා කිරීමට පහසු, බලශක්ති කාර්යක්ෂම වන අතර කල් පවතින ද්‍රව්‍යවලින් නිෂ්පාදනය කර ඇත. මෙම යන්ත්‍රය ආරක්ෂක ප්‍රමිතීන්ට අනුව නිර්මාණය කර ඇති අතර නවීන පෙනුමකින් සමන්විත වේ.

3.9 ස්වභාවික වල්නාශක

මෙය ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය තුළ වසර 3ක් පුරා සිදු කරන ලද පර්යේෂණ ව්‍යාපෘතියක ප්‍රතිඵලයක් වේ. මෙම පර්යේෂණ ව්‍යාපෘතිය මඟින් සහල් වගාවේදී භාවිත කළ යුතු රසායනික වල්නාශක වෙනුවට විකල්පයක් ලෙස ශාකවලින් ලබා ගන්නා වල්නාශක පිළිබඳව විමර්ශනය කරන ලදි. රසායනාගාර සහ අර්ධ ක්ෂේත්‍ර මට්ටමින්

සිදු කරන ලද පරීක්ෂණවලින් සනාථ වූයේ යහපත් ප්‍රතිඵල සහිත අපේක්ෂකයින් දෙදෙනෙකු සිටින බවයි. මේ වන විට සම්පූර්ණ ක්ෂේත්‍ර අතහදා බැලීමක් සිදු කෙරෙමින් පවතී. මින් එක් පරීක්ෂණයක් කැපී පෙනෙන අතර වාණිජකරණ ක්‍රියාවලිය ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ. එසේම, බුද්ධිමය දේපළ සඳහා මෙය සලකා බැලීමට කටයුතු කෙරේ. මේ සඳහා අවශ්‍ය අරමුදල් වෙන් කිරීමට ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානයෙන් ඉල්ලුම් කිරීමට අපේක්ෂා කෙරේ.

3.10 වියදම් අවම බහු කාර්ය වර්ණමාපකය

ශ්‍රී ලංකාව තුළ දියවැඩියා රෝගීන් සංඛ්‍යාව ශීඝ්‍රයෙන් වැඩි වන බව පැහැදිලි වන කරුණක් වේ. මෙම රෝගය වැළැක්වීමට හෝ පාලනය කිරීමට නම් එය මූලික අදියරේදී හඳුනා ගැනීම වැදගත් වේ. LED (wavelength)හි පැහැය වෙනස් කිරීම මඟින් මෙම උපකරණය ලිපිඩ් ප්‍රොෆයිල් (lipid profiles) වැනි වෙනත් සායනික පරීක්ෂණ සඳහා භාවිත කිරීමට යොදා ගත හැකි වේ. ග්ලූකෝමීටර් ආනයනය කරනු ලබන අතර එහි රුධිර සාම්පල එකතුකිරීම සඳහා භාවිත කරන බැහැර කළ හැකි ස්ට්‍රිප් මිල අධික බැවින් විශේෂයෙන් ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ප්‍රදේශවල වෙසෙන ජනතාවට පහසු මිලට ලබා ගත නොහැකි වේ. මෙම ව්‍යාපෘතිය මඟින් ග්ලූකෝමීටර් වෙනුවට සායනික පරීක්ෂණ සඳහා භාවිත කළ හැකි වියදම් අවම බහු කාර්ය වර්ණමාපකයක් නිර්මාණය කිරීම යෝජනා කෙරේ.

3.11 බලශක්තිය ඉතිරි කළ හැකි Iron mat

මෙය කාර්යක්ෂමව රෙදි මැදීම සිදු කරමින් බලශක්තිය ඉතුරු කිරීම සඳහා නිර්මාණය කෙරුනු විප්ලවීය විසඳුමක් වේ. මෙම නවෝත්පාදන iron mat මඟින් මැදීමේ කාර්යසාධනය වැඩි කිරීම, බලශක්ති පරිභෝජනය අවම කර මුදල් ඉතුරු කිරීම සඳහා තාපය රඳවා තබා ගැනීමේ තාක්ෂණය භාවිත කරනු ලබයි. මෙම නිෂ්පාදනයේ ප්‍රථම ආකෘතිය සම්පූර්ණ කරන ලදි. මෙම iron matහි සැලසුම් කිරීම සිදු වෙමින් පවතී.

3.12 Attachment to වලට Rice Cooker) සම්බන්ධ කරන උපකරණයක්

ආහාර පිසීමේ ක්‍රියාවලිය තුළ උණුසුම් ජලය ඉවත් කිරීමට සහ උදුනට අළුතෙන් උණුසුම් ජලය නැවත පිරවීමට මෙම උපකරණය නිර්මාණය කර ඇත. මෙම නිර්මාණය මඟින් පිසින ලද බත් සහ ධාන්‍යවල අපද්‍රව්‍ය ඉවත් කරමින් සෞඛ්‍යසම්පන්න බව ඉහළ නැංවීමට අපේක්ෂා කෙරේ.

නිර්මාණය කරන ලද ඇමුණුමට එහි පියන වෙනුවට උදුනට ගැළපෙන වතුර ටැංකියක්, මෝටරයක් සහ සෙලෙනොයිඩ් වෑල්වයක් ඇතුළත් වේ. මෙම නිර්මාණය කරන ලද ඇමුණුම ප්‍රධාන මූලාකෘති 2කට සකස් කිරීමට ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානයට තම විෂේශඥ දැනුම යොදා ගත හැකි නම් සහ මෙම නිෂ්පාදනය ප්‍රශස්තකරණය සඳහා අවශ්‍යය ඇගයීම් සිදු කරන්නේ නම් මෙම නව නිපැයුම ශබ්ද වාණිජ නිෂ්පාදනයක් බවට පත් කිරීමට බෙහෙවින් උපකාරී වනු ඇත. මේ සඳහා ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය වෙතින් අරමුදල් හා අධාර ද අවශ්‍ය වේ.

3.13 පරිගණකගත දුරේක්ෂ ආධාරක (Telescope Mount)

තාරකා විද්‍යාව යනු පැරණිතම හා විනෝදජනක විද්‍යාවකි. කෙසේ වෙතත්, ආකාශ වස්තුවක් වෙත දුරේක්ෂයක් යොමු කිරීම ආමේචර තාරකා විද්‍යාඥයින්ට අපහසු වේ. පෘථිවිය භ්‍රමණයට අනුව ස්ථානය ද කාලයත් සමඟ වෙනස් වේ. මෙම ගැටළුව විසඳන පරිගණකගත දුරේක්ෂ ආධාරක (Telescope Mount) තිබේ. නමුත් ඒවා මිලෙන් අධික වන අතර බොහෝ ශ්‍රී ලාංකිකයින්ට ලබා ගත නොහැකි වේ. අපගේ අරමුණ වන්නේ පහසු මිලකට ලබා ගත හැකි දුරේක්ෂ ආධාරකයක් ලබා ගැනීමයි. අප විසින් මේ සඳහා Institute of Astronomy සමඟ අවබෝධතා ගිවිසුමක් සහ තාක්ෂණික හුවමාරු ලේඛන දැනටමත් අත්සන් කර ඇත.

3.14 පරිසර හිතකාමී ඇසුරුම්කරණ ද්‍රව්‍ය



පරිසර හිතකාමී ඇසුරුම්කරණ ද්‍රව්‍ය වෙන් වී ඇත්තේ ජපන් ජබර (Eichhornia crassipes) සහ ගීනියා තෘණ (Megathyrsus maximus) වැනි නිර්මාණාත්මක සංකලනයකින් වේ. ජපන් ජබර සහ ගීනියා තෘණ යන දෙවර්ගයම ශ්‍රීඝ්‍රයෙන් වර්ධනය වන සහ ප්‍රතිජනනය සඳහා ප්‍රවණතාවයක් පෙන්නුම් කරන බැවින් ඇසුරුම් ද්‍රව්‍ය සඳහා මෙම ශාක වගා කිරීම ස්වභාවික වාසස්ථානවල පීඩනය අවම කිරීම සහ තිරසාර කෘෂිකාර්මික චක්‍රයක් සඳහා සහාය දක්වනු ලබයි. මෙම සංයෝජනය මඟින් ජපන් ජබර සහ ගීනියා තෘණ ශීඝ්‍රයෙන් වර්ධනය වන අතර එය සාම්ප්‍රදායික ඇසුරුම් ද්‍රව්‍ය වෙනුවට පරිසර හිතකාමී විකල්පයක් බවට පත් කරයි. එසේම, මෙම කැපී පෙනෙන සංයෝජනය පරිසරය ආරක්ෂා කිරීම සඳහා පමණක්

නොව වැසූ ආහාර ද්‍රව්‍යවල පවිත්‍රතාව සහ නැවුම් බව සහතික කරන සුවිශේෂී කාබනික ආහාර සුරක්ෂිතතා ඇසුරුම් නිර්මාණය කරයි.

රූපසටහන 3-5 ජපන් ජබරවලින් ලබා ගත් කෙඳිවලින් සකසන ලද පරිසර හිතකාමී ඇසුරුම්කරණ ද්‍රව්‍ය

3.15 STEM Box Science kit

විද්‍යා තාක්ෂණ අධ්‍යාපනය සහ ගණිතය ප්‍රායෝගික අත්දැකීමෙන් ඉගෙනීම කළයුතු විෂයයන් වේ. නමුත් ලංකාවේ ඒවා වැඩි වශයෙන් කටපාඩම් කර උගනවනු ලබයි. මේ සඳහා එක් හේතුවක් වන්නේ දැනුම නොමැතිකම හේතුවෙන් සම්පත්වල හිඟබවයි. ශිෂ්‍යයින් සඳහා find-it-yourself kit නිර්මාණය මඟින් මෙම තත්ත්වය වෙනස් කිරීමට අපි අපේක්ෂා කරන්නෙමු. අධ්‍යාපනය වඩාත් විනෝදජනක සහ ආකර්ශනීය කරමින් අතහදා බැලීම් මාලාවක් සිදු කිරීම සඳහා සාමාන්‍ය ගෘහාශ්‍රිත අයිතම හැර අනෙකුත් සියලුම අවශ්‍ය මෙවලම් සහ සංරචක STEM boxහි අඩංගු වේ.

3.16 Gel electrophoresis

මෙහි පරමාර්ථය වන්නේ ලාභදායී ස්වයංක්‍රීය gel electrophoresis උපාංගයක් වැඩි දියුණු කිරීමයි. අවබෝධතා ගිවිසුම සහ තාක්ෂණික හුවමාරු ලේඛන දැනටමත් e gravity solutions Pvt Ltd. සමඟ අත්සන් කර ඇත.

3.17 Green Pepper Ketchup

මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ පිරිසිදු සහ නැවුම් අමු ගම්මිරිස් සහ සුදු එෑණුවලින් සාදන ලද කුළුබඩු සහිත කෙචප් සකස් කිරීමයි. මෙම කෙචප් දූර්වර්ණයෙන් තොර, රසයෙන් තොර, කල් තබා ගන්න ද්‍රව්‍යවලින් තොර වන අතර පැණි රස හා කෙටි කෑම, බර්ගර් සහ වෙනත් බේකරි නිෂ්පාදන සමඟ පරිභෝජනය කළ හැකි පෝෂ්‍යදායී ආහාර අතිරේකයක් සමඟ මිශ්‍ර වූ ගම්මිරිස් සැර සහ සුදුළූණු රස මෙයට ඇතුළත් වේ.

3.18 AI-based Tea Processing System

මෙය තේ කර්මාන්තශාලා සඳහා එහි නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සහ නිෂ්පාදන පිරිවැය අවම කිරීම සඳහා අන්තර්ජාලය සහ කෘතිම බුද්ධිය පාදක කරගත් තේ සැකසීම අධීක්ෂණය කිරීමේ පද්ධතියක් වේ. මෙම පද්ධතිය මඟින් කර්මාන්තශාලා පරිපාලනයට සහ නිලධාරීන්ට පරිසර තත්ත්ව සහ තේ සැකසීමේ සියලුම පියවර ස්වයංක්‍රීයකරණය කිරීම සහ දත්ත එකතු කිරීම සිදු කරනු ලබයි. පද්ධතිය ඔක්සිකරණ මට්ටම් විශ්ලේෂණය කිරීමට තේවල ගුණාත්මකභාවය තක්සේරු කිරීමට සහ පරාමිතීන් සාමාන්‍ය පරාසයන්ගෙන් බැහැර වුවහොත් අනතුරු ඇඟවීමේ සංඥා නිකුත් කිරීමට කෘතිම බුද්ධි ඇල්ගොරිතම භාවිත කරනු ලබයි. එය දුරස්ථ අධීක්ෂණය සහ පාලනය සක්‍රීය කරනු ලබන අතර දත්ත විශ්ලේෂණය හරහා සොයා ගැනීමේ හැකියාව සහතික කරනු ලබයි. මෙම පද්ධතියේ ඉලක්කගත වෙළඳපොළ වන්නේ නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සහ නිෂ්පාදන පිරිවැය අවම කිරීම කේන්ද්‍ර කරගත් දිවයින පුරා ස්ථාපිත කර ඇති සියළුම වර්ගයේ තේ කර්මාන්තශාලා වේ. මෙම ක්‍රමය තේ කම්හලක ක්‍රියාත්මක කිරීමට පෙර පව විසින් සම්පූර්ණ කර්මාන්ත ක්‍රියාවලිය පරීක්ෂා කර පාරිභෝගික අවශ්‍යතා මත අප විසි නිර්මාණය කළ මූලාකෘතියට අවශ්‍ය අභිරුචිකරණය සිදු කරනු ලබයි.

3.19 Animal tracking system

ශ්‍රී ලංකාවේ ගම්බද ප්‍රදේශවල, උදෑසන කාලයේදී එළදෙනුන්, එළුවන් සහ වෙනත් සතුන් ආසන්නතම තණ බිම් වෙත නිදහස් කොට සන්ධ්‍යාවේදී ගාල් කිරීම සිදු කරනු ලබයි. කෙසේ වෙතත්, මෙම හිමිකරුවන්ට සතුන් සිටින ස්ථානය හඳුනා ගැනීමට හැකියාවක් නොමැත. මෙහි අරමුණ මෙම සතුන් සොයාගැනීම සඳහා පද්ධතියක් වැඩි දියුණු කිරීම අරමුණ වේ.

4. සහයෝගීතා වැඩසටහන්

වෙනත් ආයතන සමඟ ඇතිකරගත් සහයෝගීතා පහත සඳහන් වගුවෙන් දැක්වේ.

වගුව 4: බාහිර සංවිධාන සමඟ සහයෝගීතාව

No.	Collaborator	Collaboration
1	Ceylona Green Natural Foods Private Limited	MOU and two Technology Transfer agreements signed
2	MAS Innovations	NDA (Pending)
3	Rancrisp Marketing Private Limited	Negotiations in progress

4.1 Ceylona Green Natural Foods Private Limited

නිෂ්පාදන ක්‍රියාවලියේ වැඩි දියුණු කිරීම සඳහා ස්වයංක්‍රීය යන්ත්‍රෝපකරණ විසඳුම් සහ පද්ධති සැපයීම පිළිබඳ සහයෝගීතාවයක් ඇති කර ගැනීම වෙනුවෙන් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය සමඟ අවබෝධතා ගිවිසුමක් 2023 අප්‍රේල් 26 වන දින අත්සන් තබන ලදි.



මෙම අවබෝධතා ගිවිසුම යටතේ ප්‍රථම තාක්ෂණික හුවමාරු ගිවිසුම 2023 නොවැම්බර් 24 වන දින අත්සන් කරන ලදි. “Hybrid cleaning mechanism using air and vibration for removing dust, sand and other impurities from pepper” තාක්ෂණය සඳහා රු. 375,000.00ක මුදලක් විශ්වවිද්‍යාලය වෙත ලැබිණ.

රූපසටහන 4-1 Ceylona Green Natural Foods Private Limited සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් තැබීම

4.2 MAS Innovations



ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය විසින් නවෝත්පාදන සඳහා සහයෝගී හවුල්කාරිත්වයක් වැඩි දියුණු කරගැනීම සහ විසඳුම් සෙවීමට සහ සමාජයට ධනාත්මකව බලපාන MAS Innovations සමඟ සාකච්ඡා සඳහා මුල පිරීම් සිදු කරන ලදි.

රූපසටහන 4-2 MAS Innovation සමඟ සාකච්ඡා සඳහා මුල පිරීම

4.3 Rancrisp Marketing Private Limited



ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය විසින් වැවිලි ඉංජිනේරු අධ්‍යනාංශයේ ආචාර්ය. නිමේෂා වීරක්කොඩි විසින් නිපදවන ලද Probiotic pearls වාණිජකරණය කිරීම සඳහා Rancrisp Marketing සමඟ සාකච්ඡා ආරම්භ කරන ලදි. නිෂ්පාදනය විශ්ලේෂණය සඳහා සමාගම් නියෝජිතයින් 2024 ජනවාරි 5 වන දින ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය වෙත පැමිණියහ.

රූපසටහන 4-3 Rancrisp Marketing සමඟ සාකච්ඡා සඳහා මුල පිරීම

5. ක්ෂේත්‍ර චාරිකා

වගුව 5: 2023 වර්ෂය තුළ ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය විසින් සිදු කරන ලද ක්ෂේත්‍ර චාරිකාවල සාරාංශය

No	Company Name	Participants	Faculty
1	Beam Hela Osu Lanka (Pvt) Ltd	Dr Dusantha Alwis and the team	Department of Chemistry

2	Island Food Expo (Pvt) Ltd	Dr. Nimsha Weerakkody Dr. Dusantha Alwis	Departments of Chemistry & Plantation Engineering
3	Ceylon Paper Pottery (Pvt) Ltd	Dr. Chamila Dias and the team	CESSED

5.1 Beam Hela Osu Lanka Private Limited ක්ෂේත්‍ර චාරිකා

ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය විසින් ඖෂධීය තේ ව්‍යාපෘතියේ කොටසක් ලෙස වෛද්‍ය දුසාන්ත අල්විස් සහ කණ්ඩායම සමඟ එක්ව Beam Hela Osu Lanka Private Limited වෙත පැමිණියේ ඖෂධීය නිෂ්පාදන ක්‍රියාවලිය පිළිබඳ සවිස්තරාත්මක දළ විශ්ලේෂණයක් ලබා ගැනීමට සහ නව නිපැයුම වාණිජකරණය කිරීම ආරම්භ කරන ලදි. ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය විසින් සමඟ අනාගත සහයෝගීතා සහ අන්‍යෝන්‍යව කටයුතු කිරීමේ හැකියාව පිළිබඳ සාකච්ඡා කිරීම ආරම්භ කරන ලදි.

5.2 Island Food Expo (Pvt) Ltd ක්ෂේත්‍ර චාරිකා

අපනයනය කිරීම සඳහා සූදානම් කර ඇති කරපිංචා කල් තබා ගැනීමේ ක්‍රම පිළිබඳ තාක්ෂණික උපදේශන සැපයීම සඳහා ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය විසින් හෝමාගම වෙත ක්ෂේත්‍ර චාරිකාවක් සංවිධානය කරන ලදි. මෙම සංචාරයට වැවිලි ඉංජිනේරු අධ්‍යනාංශයේ ආචාර්ය. නිම්ෂා වීරක්කොඩි සහ රසායන විද්‍යා අධ්‍යනාංශයේ ආචාර්ය. දුසන්ත අල්විස් මහතා මේ සඳහා සහභාගී විය.

5.3 Ceylon Paper Pottery Private Limited ක්ෂේත්‍ර චාරිකා

කෙසෙල් කෙදි කඩදාසිවල වාණිජ මූලාකෘතියක් වැඩි දියුණු කිරීම සඳහා පර්යේෂණ කණ්ඩායම වත්තල පිහිටි Ceylon Paper Pottery Private Limited වෙත ක්ෂේත්‍ර චාරිකාවක නිරත විය. කෙසෙල් ෆයිබර් කඩදාසි වැඩි දියුණු කිරීම සඳහා ඇති අවස්ථා ගවේෂණය කරන ලදි. කණ්ඩායම PVC පැනල ආදේශ කිරීම අරමුණු කරගත් සංයුක්ත කෙසෙල් තන්තු පත්‍රයක් මූලාකෘති කර ඇත. මෙම නිෂ්පාදනය වැඩි දියුණු කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී.

වගුව 5: ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය විසින් සිදු කරන ලද දැනුම හුවමාරු කර ගැනීමේ සහ ප්‍රචාරක වැඩසටහන්වල සාරාංශය

No	Event/Activity
1	ILC Website Launch
2	Participated in Ruhuna Invention and Innovation Exhibition (RIIE) 2023
3	Participated in “Innovation Arena” National Industry Exhibition
4	Participated in Profood/Propack 2023 Exhibition
5	Conduct Guest Lectures
6	Launch OUSL Mobile Innovation Laboratory
7	Draft Start-up Policy
8	Conduct mini-Exhibition at SLASS annual scientific sessions

6.1 වෙබ් අඩවිය

ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානයේ නව වෙබ් අඩවිය ආරම්භ කර ඇති අතර විශ්වවිද්‍යාල ප්‍රධාන වෙබ් අඩවිය හරහා ප්‍රවේශ විය හැකි ය.

6.2 2023- රුහුණු නව නිපැයුම් සහ නවෝත්පාදන ප්‍රදර්ශනය

ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය විසින් 2023 ජූනි 5 වන දින රුහුණු විශ්වවිද්‍යාලයේ පැවති රුහුණු නව නිපැයුම් සහ නවෝත්පාදන ප්‍රදර්ශනයේ විවෘත විශ්වවිද්‍යාල නිෂ්පාදන ප්‍රදර්ශනය කරන ලදි. දකුණු පළාත් කාර්මික සංවර්ධන අධිකාරිය, දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ සහයෝගීතාවයෙන් රුහුණු විශ්වවිද්‍යාලය විසින් මෙම ප්‍රදර්ශනය සංවිධානය කර ඇත. තරුණ සිත් තුළ නිර්මාණශීලීත්වය සහ නවොත්පාදන දිරිගැන්වීම සඳහා දකුණු පළාතේ සියලුම විශ්වවිද්‍යාල, පාසල් සහ අනෙකුත් නව නිපැයුම්කරුවන් සඳහා ප්‍රදර්ශනය විවෘත කෙරිණ. ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය විසින් වැනි නිෂ්පාදන ප්‍රදර්ශනය කළ අතර ඒ සඳහා අමුත්තන්ගෙන් සහ ඇගයීම් කමිටුවෙන් ධනාත්මක ප්‍රතිචාර ලැබිණ.




රූපසටහන 6-1 Ruhuna Invention and Innovation Exhibition

6.3 ජාතික කර්මාන්ත ප්‍රදර්ශනය

2023 ජූනි මස 22 සහ 25 වන දිනවල බණ්ඩාරනායක ජාත්‍යන්තර සමාන්තුණ ශාලාවේදී පැවති ජාතික කර්මාන්ත ප්‍රදර්ශනය තුළ ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය විසින් විවෘත විශ්වවිද්‍යාලයීය නිෂ්පාදන ප්‍රදර්ශනය කරන ලදී. මෙම ප්‍රදර්ශනය කර්මාන්ත අමාත්‍යාංශයේ කර්මාන්ත සංවර්ධන මණ්ඩලය විසින් සංවිධානය කරන ලදී. ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය විසින් electronic demonstration kit, Buzzer, labelling machine, food products: fruit flap & Pepper ketchup ප්‍රදර්ශනය කරන ලදී. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය ජංගම නවෝත්පාදන රසායනාගාරය ද ප්‍රදර්ශනය කරන ලද අතර තිමාණ අකෘතිකරණයට අනුව රසායනාගාරය ඇතුළත වැඩමුළු සැසි කිහිපයක් පවත්වන ලදී. භෞතික විද්‍යා අධ්‍යනාංශයේ NeoSpace රසායනාගාරය විසින් ත්‍රිමාණ ආකෘතිකරණය හඳුන්වාදීමේ සැසි සඳහා සහභාගී වීමට පාසල් ශිෂ්‍යයින්ට සහ ළමුන්ට අවස්ථාව හිමි විය.

රූපසටහන 6-2 ජාතික කර්මාන්ත ප්‍රදර්ශනය





6.4 Profood/Propack 2023



ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය 2023 අගෝස්තු 4 සහ 6 වන දිනවල බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේ පැවති ප්‍රදර්ශනයේදී තම නවෝත්පාදන ආහාර නිෂ්පාදන ප්‍රදර්ශනය කරන ලදී. Sri Lanka Food Processors Association විසින් මෙම ප්‍රදර්ශනය සංවිධානය කරන ලදී. නවෝත්පාදන නිෂ්පාදන ආරම්භ කිරීමට සහ එහි අවසාන පාරිභෝගිකයින් හමුවීමට මෙන්ම වෙළඳපොළෙන් ප්‍රතිචාර ලබා ගැනීමටත් මෙම අවස්ථාව ආහාර කර්මාන්තකරුවන් විසින් සබඳතා ගොඩනගා ගැනීම සඳහා යොදා ගනී.

රූපසටහන 6-3 Profood/Propack 2023 ප්‍රදර්ශනය

මෙම වර්ෂයේදී වැවිලි ඉංජිනේරු අධ්‍යනාංශය විසින් මහජන සබඳතා ඒකකය සහ ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය හා එක්ව විවෘත විශ්වවිද්‍යාල වෙළඳ කුටි සංවිධානය කිරීමේදී ප්‍රධාන භූමිකාවක් නිරූපණය කරන ලදී.

විවෘත විශ්වවිද්‍යාලය විසින් වැඩි දියුණු කරන ලද නවෝත්පාදන ආහාර නිෂ්පාදන: TomoTiny Greens, O-calorie concentrate, Coco whey iced coffee, packaging materials; Cogon-Hyacinth sheet, food processing technologies; AI-powered IoT based app for tea processing

6.5 ආරාධිත දේශනය

ස්වභාවික විද්‍යා පීඨයේ ව්‍යාපාර සම්බන්ධීකරණ කමිටුව විසින් ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය සමඟ එක්ව "Bridging the Gap between University and Industry through Innovations from Biotechnology" පිළිබඳ ආරාධිත දේශනයක් 2023 සැප්තැම්බර් 08 වන දින මාර්ගගත ක්‍රමවේදය හරහා පවත්වන ලදි.

කැන්ඩාවේ ටොරොන්ටෝහි SETASහි Centennial Collegeහි මහාචාර්යවරයෙකු සහ WIMTACHහි පර්යේෂණ නායකයෙකු වන ආචාර්ය.සියාම් සුබෙයාර් විසින් සාර්ථක සහ තොරතුරු සහිත දේශනයක් පවත්වන ලදි.

6.6 ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය ජංගම නවොත්පාදන රසායනාගාරය ආරම්භ කිරීම

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය ජංගම නවෝත්පාදන රසායනාගාරය 2023 ජුනි 09 වන දින ස්වභාවික විද්‍යා පීඨ පරිශ්‍රයේදී ආරම්භ කරන ලදි. ව්‍යාපෘතිය යථාර්තයක් බවට පත් කිරීම සඳහා පුරෝගාමී වූ භෞතික විද්‍යා අධ්‍යානංශයේ ආචාර්ය. ගයාන් ඉලේපෙරුම සහ මහාචාර්ය. සුසිර පෙරේරා විසින් සම්බන්ධීකරණය කරන ලද මෙම රසායනාගාරය AHEAD RIC ප්‍රදානයේ කොටසක් වශයෙන් සැලසුම් කර වැඩි දියුණු කරන ලදි. මෙම රසායනාගාරය දුරස්ථ ස්ථානවල සිට පර්යේෂණ සහ ප්‍රායෝගික පරීක්ෂණ සිදු කිරීම සඳහා නිර්මාණය කරන ලද ලංකාවේ ප්‍රථම සහ එකම ජංගම නවෝත්පාදන රසයනාගරය වන අතර මධ්‍යයම මණ්ඩපය හැර දුරස්ථව විද්‍යා ඉගැන්වීම සහ ඉගෙනීම සිදු කිරීමට පහසුකම් සලසනු ලබයි. ව්‍යාපෘති කණ්ඩායම විසින් විශේෂ අමුත්තන් ඉදිරිපිට ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය උපකුලපති වෙත රසායනාගාරය බාර දෙන ලදි.





රූපසටහන 6-4 ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය ජංගම නවොත්පාදන රසායනාගාරය ආරම්භ කිරීම

6.7 ප්‍රතිපත්තිය කෙටුම්පත් කිරීම

විශ්වවිද්‍යාලයේ පර්යේෂණ ව්‍යාපෘති ක්‍රියාකාරකම් මත පදනම්ව Start-up පිහිටුවීමට සහ විශ්වවිද්‍යාලය තුළ නවෝත්පාදන සහ ස්ටර්ටුප් සඳහා ව්‍යවසායක්වය වර්ධනය කිරීමට ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයෙහි කාර්ය මණ්ඩලයට සහ ශිෂ්‍යයින්ට සහාය දැක්වීම සඳහා විවෘත විශ්වවිද්‍යාලයෙහි Start-up ප්‍රතිපත්තිය කෙටුම්පත් කිරීම ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය විසින් ආරම්භ කර ඇත.

6.8 SLASS විද්‍යාත්මක සැසිවලදී ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය නිෂ්පාදන ප්‍රදර්ශනය කිරීම.



ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය විසින් 2023 දෙසැම්බර් 11 සිට 15 දක්වා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයෙහි පැවති SLAASහි 79වන විද්‍යාත්මක සැසියේදී විවෘත විශ්වවිද්‍යාල නව නිපැයුම් ප්‍රදර්ශනය කරන ලද අතර සහභාගිවූවන්ගෙන් යහපත් ප්‍රතිචාර ලැබිණ.

රූපසටහන 6-5 ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයෙහි නව සෞඛ්‍ය විද්‍යා පීඨ සංකීර්ණයේ SLASS විද්‍යාත්මක සැසිවල කුඩා ප්‍රදර්ශනය.

7. වෙනත් ක්‍රියාකාරකම්

වගුව 7: 2023 වර්ෂය තුළ ජාත්‍යන්තර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය විසින් සිදු කරන ලද වෙනත් ක්‍රියාකාරකම්වල සාරාංශය.

No	Event/Activity
1	UBL Phase 4 evaluation.
2	A modified version of my SMART FAUCET”
3	CLDP Consultation Programme for UBL Directors.
4	AHEAD concluding ceremony.

7.1 UBL Phase 4 evaluation.

ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය විසින් UBL Phase 4 ක්‍රියාකාරකම් සම්පූර්ණ කර 2023.08.11 දින උපකුලපති, AHEAD අධ්‍යක්ෂවරුන් සහ පුද්ගලික අංශයේ නියෝජිතයින් ඇතුළු සම්භාවනීය අමුත්තන් ඉදිරියේ ඇගයීමට ඉදිරිපත් වන ලදි. මෙම අවස්ථාවට ඇගයුම්කරුවන්, කර්මාන්ත හවුල්කරුවන්, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය පරිපාලන සහ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් ඇතුළු 50 දෙනෙකු සහභාගී විය. සම්පූර්ණ කිරීමෙන් UBL ක්‍රියාකාරකම් අඛණ්ඩව සිදු කරගෙන යාම සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයට මිලියන 7ක් අරමුදල් වශයෙන් ලැබිණ. ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය වෙත ලැබී ඇති අයදුම්පත් අනුව තාක්ෂණික සූදානම් බව, වාණිජකරණ විභවය, නවෝත්පාදනය සහ යෝජිත ව්‍යාපෘතිවල විභව බලපෑම සැලකිල්ලට ගනිමින් පර්යේෂණ ව්‍යාපෘති 12ක් AHEAD අරමුදල් සහාය සඳහා අනුමත කර ඇත.



රූපසටහන 7-1 UBL Phase 04 Evaluation / Mini-Exhibition

7.2 My SMART FAUCET හි නවීකරණය කරන ලද අනුවාදයක්

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යලයේ යාපනය ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ අවසන් වසරේ ශිෂ්‍යයෙකු වන හරිස්චන්ද්‍ර කාලිංගරාජා මහතා විසින් නිර්මාණය කරන ලද My SMART FAUCETහි නවීකරණය කරන ලද අනුවාදයක් 2023 අගෝස්තු 26වන දින කැනඩාවේ ටොරොන්ටෝහි පැවති 8 වන ජාත්‍යන්තර නව නිපැයුම් නවෝත්පාදන තරඟයේදී (iCAN 2023) ජාත්‍යන්තර සම්මාන තුනක් ලබා ඇත. මෙම තරඟය Toronto International Society of Innovation & Advanced Skills (TISIAS) විසින් පවත්වන ලද අතර Innovation Initiative Co-operative Inc., International Federation of Inventors' Associations (IFIA), and World Invention Intellectual Property Associations (WIIPA) යන සංගම් විසින් සහාය දක්වන ලදි.

එම සම්මාන 3 වන්නේ,
Toronto International Society of Innovation & Advanced Skills (TISIAS) විසින් පිරිනමනු ලබන රන් පදක්කම
First Institute of Inventors and Researchers in I.R. IRAN (FIRI) විසින් FIRI, International special award for best Invention සඳහා පිරිනමනු ලබන රන් පදක්කම
Canadian special award – TISIAS

7.3 UBL අධ්‍යක්ෂවරුන් සඳහා CLDP උපදේශන වැඩසටහන

ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ විසින් දෙසැම්බර් 5 සිට 16 වන දින දක්වා වොෂින්ටන්, ඉතාකා, නිව් යෝර්ක් සහ ඈන් ආබර්, මිචිගන්හි එක්සත් ජනපද වාණිජ දෙපාර්තමේන්තුවේ වාණිජ නීති සංවර්ධන වැඩසටහන් විසින් සංවිධානය කරන ලද තාක්ෂණ හුවමාරුව සහ සහභාගී විය. වාණිජකරණය පිළිබඳ එක්සත් ජනපද උපදේශනයට සහභාගී විය.




රූපසටහන 7-2 එක්සත් රාජධානියේ උපදේශන වැඩසටහන

7.4 AHEAD සමාප්ති උත්සවය

විශ්වවිද්‍යාලවල පර්යේෂණ සහ නව නිපැයුම් ඇගයීම කඩිනම් කිරීම සම්බන්ධයෙන් 2023 දෙසැම්බර් 15 වන දින කොළඹ කිංස්බරි හෝටලයේදී පැවති උත්සවයේදී ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය තම කැපී පෙනෙන සාර්ථකත්වය සහ ජයග්‍රහණ සඳහා පිළිගැනීමට පාත්‍ර විය.






රූපසටහන 7-3 **AHEAD සමාප්ති උත්සවය**

6.9 අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍යය මධ්‍යස්ථානය



අධ්‍යාපනික තාක්ෂණික අංශය (2011 සිට අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍යය මධ්‍යස්ථානය) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ඉතා වැදගත් අංශයක් වන අතර විශ්වවිද්‍යාලයට විවෘත හා දුරස්ථ ඉගෙනුම් ක්‍රමවේදය හරහා අධ්‍යයන වැඩසටහන් පිරිනැමීමට පහසුකම් සපයනු ලබයි. සාම්ප්‍රදායික විශ්වවිද්‍යාලවලට පැමිණ සහභාගි වන සාම්ප්‍රදායික දේශන මෙන් නොව ස්වයං අධ්‍යයන ද්‍රව්‍ය මෙහි ප්‍රධාන ඉගෙනුම් ක්‍රමවේදයක් වේ. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය සියළුම අධ්‍යයන වැඩසටහන්වල ගුණාත්මක ප්‍රමිතීන් පවත්වාගෙන යමින් ඉගෙනුම ලබන්නන් වෙත අධ්‍යයන ද්‍රව්‍ය/ ඉගෙනුම් සම්පත් නිර්මාණය කිරීම, සංවර්ධනය කිරීම/ නිෂ්පාදනය කිරීම හරහා මධ්‍යස්ථානය ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය අධ්‍යයන ද්‍රව්‍ය/ ඉගෙනුම් සම්පත් (මුද්‍රණය කිරීම, ශ්‍රව්‍ය- දෘෂ්‍ය සහ මාර්ගගත) සඳහා තත්ත්ව පාලන මාර්ගෝපදේශ සහ ප්‍රමිතීන් නිර්මාණය කිරීම සහ මාර්ගගත පඨමාලා ඇතුළුව සියළුම අධ්‍යයන වැඩසටහන් අධීක්ෂණය කිරීම සඳහා මධ්‍යස්ථානය වගකීම දරනු ලබයි. තවද, දිවයින පුරා විසිරී සිටින විවිධ ඉගෙනුම ලබන්නන් සඳහා උසස් තත්ත්වයේ ඉගෙනුම් සම්පත් සංවර්ධනය කරමින් විශේෂයෙන් දුරස්ථව ඉගෙනුම ලබන්නන්ට ගැළපෙන පරිදි ඉගෙනුම් සම්පත් රචනය/ නිර්මාණය කිරීම/ නිෂ්පාදනය කිරීමට අදාළව විවෘත හා දුරස්ථ ඉගෙනුම් ක්‍රමවේදය භාවිතයෙන් අධ්‍යයන වැඩසටහන් පිරිනැමීම සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩලයේ හැකියාවන් වැඩි දියුණු කිරීම වෙනුවෙන් පහසුකම් සැලසීම සඳහා ද වගකීමෙන් කටයුතු කරයි. අධ්‍යයන ද්‍රව්‍ය/ ඉගෙනුම් සම්පත සහ මාර්ගගත පාඨමාලා සංවර්ධනය කිරීම හරහා පීඨ 6 සඳහාම සේවාවන් සපයනු ලබයි.

1980 දී ශ්‍රව්‍ය දෘශ්‍ය කුටියක් ලෙස ආරම්භ කර 2011 දී අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍ය මධ්‍යස්ථානය දක්වා පුළුල් කිරීම රූපසටහන 1 මඟින් දැක්වේ.



රූපසටහන 1 - 1980 දී ශ්‍රව්‍ය දෘශ්‍ය කුටියක සිට 2011 දී මධ්‍යස්ථානයක් දක්වා ශක්තිමත් කිරීම

2023 වර්ෂය තුළ අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍ය මධ්‍යස්ථානය විසින් සිදු කළ මුල පිරීම්, ජයග්‍රහණ සහ ක්‍රියාකාරකම් පිළිබඳ මීළඟ පරිච්ඡේදයෙන් සාකච්ඡා කෙරේ.

1. 2023 වර්ෂය තුළ ආරම්භ කළ කටයුතු

- මධ්‍යස්ථානය මඟින් කෙටි පාඨමාලා පිරිනැමීම ආරම්භ කළ අතර ඒ සඳහා සනාතන සභාවේ අනුමැතිය ලබා ගන්නා ලදි.

පහත සඳහන් කෙටි පාඨමාලා දැනටමත් ආරම්භ කර ඇත.

- Short Course in Video Production (ආචාර්ය. සන්ධ්‍යා දොලුවීර) විසින් ආරම්භ කරන ලදි) පළමු වටය සම්පූර්ණ කර ඇති අතර 2 වන වටය දැනට සිදු කෙරෙමින් පවතී.
- Short Course in News and Feature Article Writing (දිනිති රණසිංහ විසින් මෙය විසින් ආරම්භ කරන ලදි) – 1 වන වටය දැනට සිදු කෙරෙමින් පවතී.
- Short Course in Screen Performance (ආචාර්ය. සමීර තිලකවර්ධන) – 1st cycle is ongoing.

- අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍ය මධ්‍යස්ථානය නව මාධ්‍ය යුගයකින් සීමාරහිත මාධ්‍ය අවකාශයක් කරා ඉදිරියට යාම යථාර්ථයක් බවට පත් කිරීමේ සිහිනය සැබෑ කිරීමේ අරමුණ ඇතිව ''ප්‍රිස්මාවලෝකනය'' වැඩසටහන නිෂ්පාදනය කරන ලදි. අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍ය මධ්‍යස්ථානය විසින් ආරම්භ කරන ලද YouTube නාලිකාව වන OUSL Lifeහි සමාරම්භක වැඩසටහන් මාලාවෙහි කොටසක් ලෙස එය සජීවීව විකාශය විය. අධ්‍යාපනික වැඩසටහන් නිෂ්පාදනය කිරීම සඳහා උනන්දුවක් දක්වන වෙනත් ආයතන අතර අධ්‍යාපනික තාක්ෂණික හා මාධ්‍ය මධ්‍යස්ථානයේ තාක්ෂණික සහ මානව සම්පත් ප්‍රවර්ධනය කිරීම කෙරෙහි ප්‍රිස්මාවලෝකනය මං පෙත් විවර කරන ලදි. මෙම වැඩසටහන ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩලය වෙත දැනුම, විනෝදාස්වාදය සහ නව අත්දැකීමක් ලබා දෙන ලදි.

2. 2023 වර්ෂය තුළ ලද ජයග්‍රහණ

මධ්‍යස්ථානයේ නිෂ්පාදන ඒකකය විසින් පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කරන ලදි.

- විශ්වවිද්‍යාලයේ සියළුම පීඨ 6 සඳහා ප්‍රවර්ධන වීඩියෝ නිර්මාණය කර නිෂ්පාදනය කරන ලදි. එම වීඩියෝ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය යූටියුබ් නාලිකාවට ඇතුළත් කර ඇති අතර වෙනත් සමාජ මාධ්‍යය ජාලවල හුවමාරු වෙමින් පවතී.
- අධ්‍යනාංශ සහ අධ්‍යයන වැඩසටහන් කිහිපයක් සඳහා ප්‍රවර්ධන වීඩියෝ නිර්මාණය කර නිෂ්පාදනය කරන ලදි.
- 2023 වර්ෂයේදී ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් සත්කාරකත්වය දරන ලද ප්‍රධාන පර්යේෂණ සම්මන්ත්‍රණ (ජාත්‍යන්තර 01 සහ දේශීය 01) සජීවීව වීඩියෝ ආවරණය සිදු කරන ලදි.

    - කළමනාකරණය සහ ව්‍යවසායකත්වය පිළිබඳ 2වන ජාත්‍යන්තර සම්මන්ත්‍රණය (ICOME 2023) 2023 මැයි 15 වන දින පැවැත්විණ. බැනර්, අත්පත්‍රිකා, ආරාධනා පත්‍ර, සම්මන්ත්‍රණ වාර්තා සටහන්වල ඉදිරි පිටුව, සජීවීකරණය, වීඩියෝ ආවරණය සඳහා අදාළ සියළුම ඉල්ලීම් උපරිමයෙන් ඉටු කරමින් අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍ය මධ්‍යස්ථානය මේ සඳහා සහාය දක්වන ලදි.

    - 2023 විවෘත විශ්වවිද්‍යාලයීය පර්යේෂණ සැසි 2023 නොවැම්බර් 09 සහ 10 දිනවල ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේදී පැවැත්විණ. බැනර්, අත්පත්‍රිකා, ආරාධනා පත්‍ර, සම්මන්ත්‍රණ වාර්තා සටහන්වල ඉදිරි පිටුව, සජීවීකරණය, වීඩියෝ ආවරණය සඳහා අදාළ සියළුම ඉල්ලීම් උපරිමයෙන් ඉටු කරමින් අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍ය මධ්‍යස්ථානය මේ සඳහා සහාය දක්වන ලදි. මේ සඳහා නිදසුන් පහත දැක්වේ.



රූපසටහන 4(අ): අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍ය මධ්‍යස්ථානයේ නිරූපණකරු එස්. දළදාවත්ත මහතා විසින් නිර්මාණය කළ 2023 විවෘත විශ්වවිද්‍යාල පර්යේෂණ සැසියෙහි අත්පත්‍රිකා



රූපසටහන 4(ආ): අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍ය මධ්‍යස්ථානයේ නිරූපණකරු එස්.දළදාවත්ත මහතා විසින් නිර්මාණය කළ ආරාධනා පත්‍රය

3. අධ්‍යයන සහ පර්යේෂණ ඒකකය විසින් පවත්වන ලද ක්‍රියාකාරකම්


ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය අධ්‍යයන කාර්ය මණ්ඩලයට එලදායී විවෘත හා දුරස්ථ ඉගෙනුම් වෘත්තිකයින් බවට පරිවර්තනය වෙමින් එලදායී ලෙස ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය අධ්‍යයන වැඩසටහන් ලබා දීමට ඇති හැකියාව වර්ධනය කිරීම සඳහා ශක්‍යතා ගොඩ නැංවීමේ පුහුණු වැඩසටහන් පැවැත්වීම අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍ය මධ්‍යස්ථානයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ වගකීමක් වේ. මෙම පුහුණු වැඩසටහන් වන්නේ විවෘත හා දුරස්ථ ඉගෙනුම් පිළිබඳ හැඳින්වීම, ස්වයං- අධ්‍යයන ද්‍රව්‍ය රචනා කිරීම, ශ්‍රව්‍ය- දෘශ්‍ය ඉගෙනුම් සම්පත් නිෂ්පාදනය කිරීම, මාර්ගගත ඉගෙනුම් ආදිය වේ.

මීට අමතරව, අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 2023 වර්ෂය සඳහා කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් පවත්වන ලද පහත සඳහන් අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් සඳහා සම්පත්දායකයින් ලෙස තම සේවාවන් ලබා දෙන ලදි. (වගුව 2)

- විවෘත හා දුරස්ථ ඉගෙනුම් පිළිබඳ නම්නීකරණය - ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයට අළුතෙන් බඳවාගත් අධ්‍යයන/ අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා පවත්වන ලදි.
- උසස් අධ්‍යාපනය ඉගැන්වීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව - විවෘත හා දුරස්ථ ඉගෙනුම් පිළිබඳ දැනුවත් කිරීම, පාඨමාලා රචනය, මාර්ගගත පාඨමාලා වැඩි දියුණු කිරීම ආදිය. අධ්‍යාපනික තාක්ෂණය සහ පාඨමාලා සැලසුම් කිරීම සහ වැඩි දියුණු කිරීම පිළිබඳ මොඩියුල සඳහා මොඩියුල සම්බන්ධීකාරකවරුන් ලෙස අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙක් සේවය කරන ලදි.
- ජ්‍යෙෂ්ඨ නම්නීකරණ වැඩසටහන - විවෘත හා දුරස්ථ ඉගෙනුම් පිළිබඳ දැනුවත් කිරීම, පාඨමාලා රචනය, මාර්ගගත පාඨමාලා වැඩි දියුණු කිරීම ආදිය.
- සන්නිවේදන කුසලතා වැඩසටහන - ඉංග්‍රීසි (උසස් පෙළ)

4. භාෂාව සහ පිටපත් සංස්කරණය

වර්තමානයේ, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය පාඨ ග්‍රන්ථ සහ ප්‍රකාශනවල භාෂාව සහ පිටපත් සංස්කරණය සඳහා අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍ය මධ්‍යස්ථානයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකු විසින් වගකීම් දරනු ලබයි. (රූපසටහන 5අ සහ 5ආ). 1 සහ 2 වගු මගින් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාල පාඨමාලා ද්‍රව්‍යවල පිටපත් සංස්කරණය කරන ලද සැසි සංඛ්‍යාව පිළිවෙලින් ඉංග්‍රීසි සහ සිංහල භාෂාවෙන් දැක්වේ.



රූපසටහන 5අ - මයන්ති කුලතුංග ජයකොඩි මෙය විසින් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය ඉංග්‍රීසි පාඨ ග්‍රන්ථවල භාෂාව සහ පිටපත් සංස්කරණය කිරීම.



රූපසටහන 5ආ - දිනෙති රණසිංහ මෙය විසින් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය සිංහල පාඨ ග්‍රන්ථවල භාෂාව සහ පිටපත් සංස්කරණය කිරීම.

1 වගුව: 2023 වර්ෂයේදී ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය පාඨ ග්‍රන්ථවල (ඉංග්‍රීසි) පිටපත් සංස්කරණ සැසි

පීඨය	සැසි සංඛ්‍යාව
මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨය	සැසි 29
අධ්‍යාපන පීඨය	සැසි 24
කළමනාකරණ අධ්‍යයන පීඨය	සැසි 31
සෞඛ්‍ය විද්‍යා පීඨය	සැසි 126 සහ වෙනත්

2 වගුව මඟින් සිංහල පිටපත් සංස්කරණ සැසි සංඛ්‍යාව දැක්වේ.

2 වගුව: 2023 වර්ෂයේදී ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය පාඨ ග්‍රන්ථවල (සිංහල) පිටපත් සංස්කරණ සැසි

පීඨය	සැසි සංඛ්‍යාව
අධ්‍යාපන පීඨය	70

5. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය පාඨ ග්‍රන්ථවල (මුද්‍රිත) තත්ත්ව පරිපාලනය

3 වගුව: 2023 වර්ෂය සඳහා ISBN ලබාගෙන ඇති ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය පාඨ ග්‍රන්ථ ලැයිස්තු.

	පීඨය සහ අධ්‍යනාංශය	පාඨමාලාවේ නම සහ කේතය	අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍යය මධ්‍යස්ථානයේ අධ්‍යයන කටයුතු භාර නිලධාරීන්	ISBN ලබාගත් දිනය
1	මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ සමාජ විද්‍යා අධ්‍යනාංශය	Contemporary Issues in Youth Development – Block I (DSU4566)	මයන්ති ජයකොඩි මෙය	2023.03.02
2	මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ සමාජ විද්‍යා අධ්‍යනාංශය	Contemporary Issues in Youth Development – Block II (DSU4566)	මයන්ති ජයකොඩි මෙය	2023.03.08
3	මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ සමාජ විද්‍යා අධ්‍යනාංශය	Conflict Resolution: Strategic and Skills	මයන්ති ජයකොඩි මෙය	2023.03.08
4	මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ සමාජ විද්‍යා අධ්‍යනාංශය	Promoting Enterprise and Economic Development (DSU4561)	මයන්ති ජයකොඩි මෙය	2023.04.03
5	මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ නීති අධ්‍යනාංශය	Equity and Trusts Law (LLU3505)	මහාචාර්ය.බී.ජී ජයතිලක	2023.04.17
6	ස්වභාවික විද්‍යා පීඨයේ උද්භිද විද්‍යාව අධ්‍යනාංශය	Advanced Ecology (BYU6308) Unit II	මහාචාර්ය.බී.ජී ජයතිලක	2023.05.11
7	මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ සමාජ විද්‍යා අධ්‍යනාංශය	Promoting Enterprise and Economic Development -Unit II (DSU4561)	මයන්ති ජයකොඩි මෙය	2023.05.11
8	මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ සමාජ විද්‍යා අධ්‍යනාංශය	Youth Governance and participation – I(DSU4368)	මයන්ති ජයකොඩි මෙය	2023.05.17
9	මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ සමාජ විද්‍යා අධ්‍යනාංශය	Project Planning, Monitoring & Evaluation -II (DSU4562)	මයන්ති ජයකොඩි මෙය	2023.05.25
10	මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ සමාජ විද්‍යා අධ්‍යනාංශය	New directions in the Humanities and social sciences	මයන්ති ජයකොඩි මෙය	2023.08.10
11	මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ ඉංග්‍රීසි භාෂාව හා ඉගැන්වීම් අධ්‍යනාංශය	English for academic purposes – elementary	මයන්ති ජයකොඩි මෙය	2023.11.13
12	ස්වභාවික විද්‍යා පීඨයේ උද්භිද විද්‍යා අධ්‍යනාංශය	Laboratory Manual (FND 3606)	මයන්ති ජයකොඩි මෙය	2023.12.06

ISBN ලබා ගැනීමට පෙර ඉහත පාඨ ග්‍රන්ථ සමාලෝචනය කරන ලද අතර ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය පාඨ ග්‍රන්ථ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය ප්‍රමිතියට අනුකූල වන බවට සහතික කිරීම.

6. මාර්ගගත පාඨමාලා සැලසුම් කිරීම, වැඩි දියුණු කිරීම, තත්ත්ව පරිපාලනය සහ "LearnOUSL" වෙත ඇතුළත් කිරීම

2007 සිට සියළුම මාර්ගගත පාඨමාලා වැඩසටහන් සම්බන්ධීකරණය, මාර්ගගත පාඨමාලා සැලසුම් කිරීම, වැඩි දියුණු කිරීම, තත්ත්ව පරිපාලනය සහ ("LearnOUSL") නිල මාර්ගගත වේදිකාව වෙත පාඨමාලා ඇතුළත් කිරීම වැනි ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය මාර්ගගත පාඨමාලා වැඩි දියුණු කිරීමට අදාළ සියළුම කටයුතු අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍යය මධ්‍යස්ථානය විසින් සිදු කරනු ලබයි. අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍යය මධ්‍යස්ථානයට අනුයුක්ත ප්‍රදර්ශකවරුන් 10 දෙනෙකුගේ සහාය ඇතිව තම මාර්ගගත පාඨමාලා වැඩි දියුණු කිරීම සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩලයට සහාය දැක්වීම අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍යය මධ්‍යස්ථානය විසින් සිදු කරනු ලබයි.

2022 වර්ෂය සඳහා සැලසුම්කරණය, වැඩි දියුණු කිරීම සහ තත්ත්ව පරිපාලන ක්‍රියාවලියෙන් පසුව "LearnOUSL" වෙත ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය මාර්ගගත පාඨමාලාවල ප්‍රගතිය 4 වගුවෙන් දැක්වේ.

4 වගුව: අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍යය මධ්‍යස්ථානයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් සමාලෝචනය කිරීමෙන් පසුව "LearnOUSL" වෙත ඇතුළත් කළ මාර්ගගත පාඨමාලාවල ප්‍රගති වාර්තාව.

අධ්‍යයන වර්ෂය	2023 නොවැම්බර් 30 වන විට පිරිනමන ලද පාඨමාලා සංඛ්‍යාව	2023 දෙසැම්බර් 31 වන විට පිරිනමන ලද පාඨමාලා සංඛ්‍යාව
2023/2024	380	406
2022/2023	760	764
2021/2022	690	690
2020/2021	707	707
2019/2020	586	586

පර්යේෂණ ඉදිරිපත් කිරීම/ ප්‍රකාශන

නිෂ්පාදන ඒකකය විසින් පවත්වන ලද ක්‍රියාකාරකම්

පීඨ 6 සඳහා ශ්‍රව්‍ය- දෘශ්‍ය පාඨ ග්‍රන්ථ/ ඉගෙනුම් සම්පත් මෙන්ම පීඨ/ අධ්‍යනාංශ/ අධ්‍යයන වැඩසටහන් සඳහා ප්‍රවර්ධන වීඩියෝ නිෂ්පාදනය කිරීම, වාර්ෂික උපාධි ප්‍රදානෝත්සවය සහ සහතිකපත්‍ර ප්‍රදානෝත්සවය ඇතුළු ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ උත්සවවල ශ්‍රව්‍ය දෘශ්‍ය ආවරණය සිදු කිරීම අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍ය මධ්‍යස්ථානයේ නිෂ්පාදන ඒකකය විසින් සිදු කරනු ලබයි. (රූපසටහන 6අ සහ 6ආ)



6අ රූපසටහන: මැදිරි සංකීර්ණය තුළ පටිගත කිරීම



6ආ රූපසටහන: පාලන මැදිරිය තුළ පටිගත කිරීම

මීට අමතරව, මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍යය සඳහා ග්‍රැෆික්/ නිරූපණය සහ සජීවීකරණය අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍ය මධ්‍යස්ථානයේ දෘශ්‍ය කලා අංශය විසින් සිදු කරනු ලබයි. වීඩියෝ නිෂ්පාදනය සඳහා ආධාරක නිර්මාණය ද සිදු කරනු ලබයි.

7. ආදායම් උත්පාදනය කළ ව්‍යාපෘති

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය සඳහා ආදායම් උත්පාදනය

- SLT Mobitel Video Documentary
- CVCD Excellence Award 2022
- Technical College Final Examination 2022
- Technical College Final Examination 2023

8. අනාගත දිශානතිය

අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍ය මධ්‍යස්ථානය විසින් තම සේවාවන්වල සමස්ත එදායීතාව ඉහළ නැංවීම සඳහා ගෙන ඇති වර්තමාන මුලපිරීම්වල ධනාත්මක බලපෑම පැහැදිලිව ඉස්මතු වීමට යම් කාල සීමාවක් ගතවනු ඇත. කෙසේ වෙතත්, තම ශක්තිමත් පදනම සහ අතීත ජයග්‍රහණ මෙන්ම වර්තමානයේ ගෙන ඇති නව මුලපිරීම් මත පදනම්ව ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය පාඨ ග්‍රන්ථ/ ඉගෙනුම් සම්පත් හරහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය සන්නාමය ඉහළ නැංවීම සඳහා මාර්ගොපදේශ සහ පහසුකම් ලබා දීම අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍ය මධ්‍යස්ථානය විසින් සිදු කරනු ලබයි. ''යාව-ජීව ඉගෙනුම් හරහා සෑම දෙනාටම අධ්‍යාපනය'' යන එහි දැක්මට අනුකූලව ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය සියළුම පාර්ශවකරුවන්ගේ සහයෝගීතාව හරහා මෙම මෙහෙවර සාක්ශාත් කරගනු ඇත.

6.10 ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වන මධ්‍යස්ථානය

2023 ජූලි 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වන මධ්‍යස්ථානයෙහි අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක කළ දින සිට බලපැවැත්වෙන පරිදි උපදේශන හා බාහිර සම්පත් මධ්‍යස්ථානය සහ ස්වයං අරමුදල් අධ්‍යයන වැඩසටහන්වල අරමුදල් ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වන මධ්‍යස්ථානයට මාරු කරනු ලැබේ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 4/2016ට අනුව ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වන මධ්‍යස්ථානය විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලාංකික සමාජය අතර සහයෝගීතාව වර්ධනය කරගැනීමට පහසුකම් සැළසීම සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිහිටුවන ලද අංශයක් වේ. ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වන මධ්‍යස්ථානයෙහි මෙහෙයවනු ලබන්නේ උපකුලපති තුමා සභාපතිත්වය දරන අධ්‍යක්ෂ සභ අධ්‍යයන, අනධ්‍යයන යන කාර්ය මණ්ඩල දෙකේම නම්කරන ලද සාමාජිකයන්ගෙන් සමන්විත වන කළමනාකරණ මණ්ඩලයක් විසින් වේ.

ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වන මධ්‍යස්ථානය පර්යේෂණ වැඩසටහන්, කෙටි පාඨමාලා, උපදේශන සේවා, දිගු පාඨමාලා, පුහුණු සහ අඛණ්ඩ වෘත්තීමය සංවර්ධන පාඨමාලා පවත්වයි. අදාළ අධ්‍යයන දෙපාර්තමේන්තුවල කාර්ය මණ්ඩලයට එවන් පැවරුම් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ කලින් යොදාගත් වැඩකටයුතුවලට බාධාවක් නොවන ආකාරයට මේ කටයුතුවලට සම්බන්ධ විය හැකිය. උපදේශන සහ බාහිර සම්පත් මධ්‍යස්ථානයේ පැවරුම් සකස් කර තිබෙන්නේ අධ්‍යයන කාර්ය මණ්ඩල විසින් වන අතර ඒවා වර්තමාන ප්‍රවණතාවන් සහ සමාජ අවශ්‍යතා පිළිබඳ විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව සකස් කර තිබේ. යම් කිසි බාහිර ආයතනයක් වන සේවාලාභියෙකුට ගැළපෙන ආකාරයට විශේෂයෙන් සැකසූ වැඩසටහන්ද තිබේ. ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වන මධ්‍යස්ථානයේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සනාතන සභාවේ අනුමැතිය ලද පසු සිදු කළ හැකි ය. මෙම පැවරුම් සාර්ථකව සම්පූර්ණ කිරීමට අවශ්‍ය භෞතික සහ මානව සම්පත් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් ලබා දෙයි.

ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වන මධ්‍යස්ථානය නිරන්තරයෙන්ම ශ්‍රී ලාංකික ප්‍රජාව , විශේෂයෙන්ම රාජ්‍ය අංශය සහ පෞද්ගලික අංශය, රජයේ බලධාරීන්, සමාන අධ්‍යයන ආයතන ආදිය සමඟ තම අරමුණු ඉටු කර ගැනීම සඳහා තම විස්තීරණ මානව සහ භෞතික සම්පත් භාවිත කිරීම සම්බන්ධයෙන් කටයුතු කරන අතර උපදේශන සහ බාහිර සම්පත් මධ්‍යස්ථානයේ පැවරුම්වලට ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය සම්බන්ධ කර ගැනීම සහ ඔවුන්ගේ සක්‍රීය දායකත්වය ලබා ගැනීම සඳහා තම උපරිම සහාය ලබා දෙයි.

2023 වර්ෂයේදී, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් රජයේ හා පෞද්ගලික ආයතන සඳහා උපදේශන සේවා සහ අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පාඨමාලා පිරිනමන ලද අතර සියළුම පීඨ විසින් අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පාඨමාලා ආරම්භ කරනු ලැබේ. තවදුරටත්, ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වන මධ්‍යස්ථානය විසින් ඉංජිනේරු, ස්වභාවික විද්‍යා, කළමනාකරණ, භාෂා අධ්‍යයන, සමාජ අධ්‍යයන, සෞඛ්‍ය විද්‍යා හා අධ්‍යාපන ක්ෂේත්‍රවල ශ්‍රී ලංකාව පුරා විහිදී සිටින ශිෂ්‍යයින් දහස් ගණනක් වෙත දැනට පිරිනමනු ලබන කෙටි පාඨමාලා සංඛ්‍යාව 40 කට අධික වේ.

6.11 පර්යේෂණ අංශය

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය තම පර්යේෂණ කටයුතු මෙහෙයවීම සඳහා 2014 පෙබරවාරි මස පර්යේෂණ අංශය පිහිටුවන ලදි. මෙම අංශය මෙහෙයවනු ලබන්නේ පර්යේෂණ අධ්‍යක්ෂ විසිනි.

විශිෂ්ට සේවාවක්, විනිවිදභාවයක්, සහයෝගීතාවයක් මෙන්ම නවෝත්පාදන ප්‍රවර්ධනය කරමින් පර්යේෂණ අංශය විසින් විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා පර්යේෂණ මෙහෙවර ඉදිරියට පවත්වාගෙන යනු ලැබේ.

පර්යේෂණ අංශය විසින් සාමූහික සහ නවෝත්පාදන පර්යේෂණ, ශිෂ්‍යත්ව සහ නිර්මාණාත්මක ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැලසීමෙන් පීඨ, කාර්ය මණ්ඩල සහ ශිෂ්‍යයින්ගේ සාර්ථකත්වය වෙනුවෙන් අනුග්‍රහය දක්වනු ලබයි. පර්යේෂණය හා ජාතික සංවර්ධනය පුළුල් කිරීම, උපදේශනය, රාජ්‍ය සේවය හා විනය, සහයෝගීතාවය වර්ධනය කරමින් පර්යේෂණ ඒකාබද්ධ කිරීමට මෙම අංශය කටයුතු කරනු ලබයි.

පහත සඳහන් ක්‍රියාකරකම්/ කාර්යයන් 2023 වර්ෂය තුළ සම්පූර්ණ කරන ලදි.

1. 2023 නොවැම්බර් 09 සිට 10 වන දින දක්වා 2023 විවෘත විශ්වවිද්‍යාලයීය පර්යේෂණ සැසි විශ්වවිද්‍යාලය තුළ සහ මාර්ගගත ක්‍රමවේදය හරහා සංවිධානය කිරීම.

2. තාක්ෂණික සැසි හා සමගාමීව විවෘත විශ්වවිද්‍යාලයීය පර්යේෂණ සැසි 2023හී දී මණ්ඩල සාකච්ඡා 06ක් සංවිධානය කෙරිණ.

   සාකච්ඡා මාතෘකා:

   Sustainable utilization of Natural Resources to reinforce the Sri Lankan Economy

   Advocating STEM Education: Significance, Challenges and Lessons Learnt

   Empowering tomorrow: cost effective, innovative and integrated engineering solutions

   Multidisciplinary Approach to the Health of the Nation

   Financial Literacy Landscape in Sri Lanka : Issues, Challenges, and Way Forward

   Story of Plastics: Past, Present and Future trends

3. 2023 නොවැම්බර් 07 සහ 08 වන දිනවල සංවිධානය කරන ලද පූර්ව සම්මන්ත්‍රණ දේශන.

   වැඩමුළුව - *Artificial Intelligence for Academic Research*

   වැඩමුළුව - *The experience of using artificial intelligence technologies in Russian agro-industrial enterprises*

   වැඩමුළුව - *Exploring Natural Sciences Through Data - Introduction to R for Statistical Data Analysis*

   වැඩමුළුව - *How to complete a PhD successfully*

   දේශනය - *How to become an effective academic*

   දේශනය - *Mental Health and Suicide Prevention*

   දේශනය - *How Artificial Intelligence can be used for Open Distance Learning*

   දේශනය - *Innovative/sustainable technologies in building Construction*

   දේශනය - *Narrative Inquiry*

4. පහත සඳහන් පරිදි මාසිකව වෙබ් සම්මන්ත්‍රණ 11ක් සංවිධානය කරන ලදි.

   මහාචාර්ය නලීන් අබේසේකර විසින් පවත්වන ලද *Relationship Marketing Model for Academic Partners* පිළිබඳ වෙබ් සම්මන්ත්‍රණය

මහාචාර්ය මෙතික විතානගේ විසින් පවත්වන ලද *Tips to write a High Impact research Paper* පිළිබඳ වෙබ් සම්මන්ත්‍රණය

ආචාර්ය. හසරැලි ප්‍රනාන්දු විසින් පවත්වන ලද *Prevention and Early Detection of Cancer* පිළිබඳ වෙබ් සම්මන්ත්‍රණය

මහාචාර්ය නිල්වලා කෝට්ටේගොඩ විසින් පවත්වන ලද *Winning back the lost Paradise* පිළිබඳ වෙබ් සම්මන්ත්‍රණය

ආචාර්ය. අමිල අබේනායක විසින් පවත්වන ලද *How to bring Research Evidence into Policy?* පිළිබඳ වෙබ් සම්මන්ත්‍රණය

ආර්.ජී. පෙරේරා මහතා විසින් පවත්වන ලද *Measurement Assurance* පිළිබඳ වෙබ් සම්මන්ත්‍රණය

මහාචාර්ය. මොහිඩ් මාහ්සන් බින් අවැන්ග් විසින් පවත්වන ලද *Development of Instruments for Measuring Social Capital in Higher* Education පිළිබඳ වෙබ් සම්මන්ත්‍රණය

ආචාර්ය. බෘක් ආර්. ශ්‍රෙයිබර් විසින් පවත්වන ලද *Insights into the process of international publication in linguistic* පිළිබඳ ප්‍රශ්න සහ පිළිතුරු සැසිය

යූ.ඩී හිරුණි කාන්චනා විසින් පවත්වන ලද *Citing and Referencing with MENDELEY Reference Management Tool* පිළිබඳ වෙබ් සම්මන්ත්‍රණය

මහාචාර්ය. සම්පත් සෙනෙවිරත්න විසින් පවත්වන ලද *Our Blue Future a 550,000 sqkm^2 of Opportunity* පිළිබඳ වෙබ් සම්මන්ත්‍රණය

මහාචාර්ය. කමීනා ගුණරත්න විසින් පවත්වන ලද *The Legal and Illegal Trade in Wildlife – Legal and Policy Issues* පිළිබඳ වෙබ් සම්මන්ත්‍රණය

5. 2022 ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩල දත්ත සමුදාය සඳහා පර්යේෂණ ප්‍රකාශන සම්පාදනය කිරීම.
6. 2022 ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩල දත්ත සමුදාය සඳහා පර්යේෂණ ප්‍රතිපාදන සම්පාදනය කිරීම.
7. දර්ශනපති සහ දර්ශනසූරි උපාධි හදාරන ශිෂ්‍යයින්ට පිරිනමනු ලබන "Short Course in Research Methodology and Scientific/Scholarly Writing" කෙටි පාඨමාලාවේ විෂය මාලාව වැඩි දියුණු කිරීම. සනාතන සභාවේ අනුමැතිය ලබා ගන්නා ලදි.
8. 2023 පීඨ පර්යේෂණ ප්‍රදාන සඳහා වෙන් කළ රු. මිලියන 15ක අරමුදල තෝරාගත් පර්යේෂණ යෝජනාවල අයදුම්කරුවන් අතර බෙදා හැරීම.
9. තරඟකාරී පර්යේෂණ ප්‍රදාන 3ක් සඳහා වෙන් කළ රු. මිලියන 2.8ක අරමුදල් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් තිදෙනෙකුගේ තෝරාගත් පර්යේෂණ යෝජනා සඳහා බෙදා හැරීම.
10. අනුමැතිය ලබා ගැනීම සඳහා ආචාරධර්ම සම්මාලෝචන කමිටුව වෙත ලැබුණු පහත සඳහන් අයදුම්පත් ඇගයීමට ලක් කිරීම.
    පශ්චාත් උපාධි/ පර්යේෂණ - 06
    අධ්‍යාපන පීඨය - 20 (අධ්‍යාපන පීඨයෙහි ආචාර ධර්ම උප කමිටුව මඟින්)
    සෞඛ්‍ය විද්‍යා පීඨය - 65 (සෞඛ්‍ය විද්‍යා පීඨයෙහි ආචාර ධර්ම උප කමිටුව මඟින්)
    ඉංග්‍රීසි පශ්චාත් උපාධි ආයතනය – 12 (ඉංග්‍රීසි පශ්චාත් උපාධි ආයතනය ආචාර ධර්ම උප කමිටුව මඟින්)

11. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍යය මධ්‍යස්ථානය, පාරිසරික අධ්‍යයනය හා තිරසාර සංවර්ධන මධ්‍යස්ථානය, ප්‍රාදේශීය අධ්‍යාපන සේවා, පුස්තකාල සහ පරිපාලන අංශවල සුදුසුකම්ලත් කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් එවන ලද 2023 පර්යේෂණ දීමනා අයදුම්පත් 29ක් ඇගයීමට ලක් කරන ලදි.

2023 විවෘත විශ්වවිද්‍යාල පර්යේෂණ සැසි
2023 විවෘත විශ්වවිද්‍යාල පර්යේෂණ සැසියෙහි වැදගත් සිදුවීම්







අධ්‍යක්ෂ/ පර්යේෂණ විසින් පවත්වන ලද පිළිගැනීමේ කතාව



උපකුලපතිගේ කථාව




ප්‍රධාන ආරාධිත අමුත්තා - මහාචාර්ය. ආර්. එම්. ජී රාජපක්ෂ

මාතෘකාව - Sustainable Development Through Responsible Utilization of Natural Resource



ප්‍රධාන ආරාධිත අමුත්තා - මහාචාර්ය. එන්. සොර්නරාජා

මාතෘකාව - Sri Lanka as a Battlefield of International Law



ප්‍රධාන ආරාධිත අමුත්තා - මහාචාර්ය. මරියා ඔබ්‍රස්තෝවා

මාතෘකාව - Methodology of Distance Learning. Increase in Quantity Without Loss of Quality. The Experience of Innopolis University



ප්‍රධාන ආරාධිත අමුත්තා - මහාචාර්ය. ගුන්තර් පෝල්

මාතෘකාව - Digital Transformation in Ergonomics through Digital Human Modelling to the Digital Twin

6.12 පාරිසරික අධ්‍යයන සහ තිරසාර සංවර්ධන මධ්‍යස්ථානය

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ පාරිසරික අධ්‍යයන සහ තිරසාර සංවර්ධන මධ්‍යස්ථානය (CESSD) ශ්‍රී ලංකාව තුළ පාරිසරික දැනුවත්භාවය, පර්යේෂණ සහ තිරසාර සංවර්ධන භාවිතයන් ප්‍රවර්ධනය කිරීම සඳහා කැපවී සිටී. හරිත හා වඩා තිරසාර අනාගතයක් නිර්මාණය කිරීමේ දැක්මක් ඇතිව පිහිටුවන ලද පාරිසරික අධ්‍යයන සහ තිරසාර සංවර්ධන මධ්‍යස්ථානය පාරිසරික අධ්‍යාපනයේ සහ පර්යේෂණවල විශිෂ්ටත්වයේ මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කරයි. පාරිසරික අධ්‍යයන සහ තිරසාර සංවර්ධන මධ්‍යස්ථානයෙහි ප්‍රධාන පරමාර්ථය වන්නේ ශ්‍රී ලංකාවේ පාරිසරික ගැටලු විසඳීම සඳහා තාක්ෂණ සංවර්ධනය සහ ධාරිතා සංවර්ධනය සඳහා මඟ පෙන්වන ඉගැන්වීම්, පර්යේෂණ සහ ශිෂ්‍යත්ව පිළිබඳ පුළුල් වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමයි. එසේම, පාරිසරික අධ්‍යයන සහ තිරසාර සංවර්ධන මධ්‍යස්ථානයහි මූලික පරමාර්ථය වන්නේ පාරිසරික ගැටළු පිළිබඳ ගැඹුරු අවබෝධයක් ඇති කිරීම මෙන්ම පාරිසරික අභියෝග විසඳීමට සහ අවම කිරීමට අවශ්‍ය දැනුම හා කුසලතාවලින් පුද්ගලයින් සන්නද්ධ කිරීමයි.

තවද, පාරිසරික අධ්‍යයන සහ තිරසාර සංවර්ධන මධ්‍යස්ථානය විසින් විශ්ව විද්‍යාල ප්‍රජාව අතර පරිසර සංරක්ෂණය සහ තිරසාර භාවිතයන් පිළිබඳව දැනුවත් කිරීම අරමුණු කරගනිමින් ප්‍රජා සත්කාර වැඩසටහන් වල නිරත වේ. මෙම මුලපිරීම් හරහා, පාරිසරික අධ්‍යයන සහ තිරසාර සංවර්ධන මධ්‍යස්ථානය පාරිසරික භාරකාරත්වය ප්‍රවර්ධනය කිරීමට, තිරසාර ජීවන රටාවන් දිරිමත් කිරීමට සහ ඔවුන්ගේ වටපිටාව කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කිරීමට පුද්ගලයින් බල ගැන්වීමට උත්සාහ කරයි.

ප්ලාස්ටික්වලින් තොර ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයක්

ප්ලාස්ටික් අපද්‍රව්‍ය අවම කිරීම සහ තිරසාරභාවය ප්‍රවර්ධනය කිරීමේ ප්‍රයත්නයක් ලෙස “Plastic Free OUSL” වැඩසටහන 2023 පෙබරවාරි 23 වන දින ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේදී පවත්වන ලදි. පාරිසරික අධ්‍යයන සහ තිරසාර සංවර්ධන මධ්‍යස්ථානය සමඟ සහයෝගීතාවයෙන් විශ්වවිද්‍යාල හරිත කමිටුව විසින් මෙම වැඩසටහන සංවිධානය කරන ලදි. මෙම වැඩසටහනෙහි අරමුණ වනුයේ ප්ලාස්ටික් භාවිත කිරීමෙන් පරිසරයට සිදුවන අහිතකර බලපෑම පිළිබඳ දැනුවත් කිරීම සහ පරිසර හිතකාමී පුරුදු අනුගමනය කිරීමට දෛර්යමත් කිරීම වේ. සහන මල්ල වැඩසටහනෙහි පියවරක් ලෙස පිරිසිදු කිරීමේ කාර්ය මණ්ඩලය වෙනුවෙන් පරිභෝජනය සඳහා අත්‍යවශ්‍ය භාණ්ඩ ලබා දීම සිදු කරන ලදි.





සහන මල්ල වැඩසටහන

සහන මල්ල වැඩසටහන යනු අපගේ වටපිටාව පිරිසිදුව සහ සනීපාරක්ෂාව සහිතව පවත්වාගෙන යාමට වෙහෙස නොබලා කැපවන පිරිසිදු කිරීමේ කාර්ය මණ්ඩලයට සහාය දැක්වීම සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය පාරිසරික අධ්‍යයන සහ තිරසාර සංවර්ධන මධ්‍යස්ථානය විසින් සංවිධානය කළ විශේෂ මුල පිරීමක් වේ. සහන මල්ල වැඩසටහනෙහි පියවරක් ලෙස පිරිසිදු කිරීමේ කාර්ය මණ්ඩලය වෙනුවෙන් පරිභෝජනය සඳහා අත්‍යවශ්‍ය භාණ්ඩ ලබා දීම සිදු කරන ලදි.





Less Plastic Movement National Campaign 2023 අදියර I

“Less Plastic Movement National Campaign 2023” වැඩසටහන ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය පාරිසරික අධ්‍යයන සහ තිරසාර සංවර්ධන මධ්‍යස්ථානය විසින් පරිසර අමාත්‍යාංශය, මධ්‍යම පරිසර අධිකාරිය, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය සමඟ සහයෝගීතාවයෙන් පවත්වන ලදි. මෙම ආයතනවලින් ලද සහයෝගයත් සමඟ මැයි 10 සිට ජුනි 05 දක්වා මෙම වැඩසටහන සාර්ථකව සම්පූර්ණ කරන ලදි.

මෙම වැඩසටහනෙහි ප්‍රථම අදියරයේදී 2023 මැයි 10 සිට ජුනි 04 දක්වා දිවයින පුරා අධ්‍යාපන සහ දැනුවත් කිරීමේ ව්‍යාපාරයක් පැවැත්විණ. පසුව, දෙවන අදියරේදී, ජුනි 05 වන දින ලෝක පරිසර දිනයට සමගාමීව ක්‍රියාකාරකම් දිනයක් සැලසුම් කරන ලදි. පසුව, දෙවන අදියරේදී, ජුනි 05 වන දින ලෝක පරිසර දිනයට සමගාමීව ක්‍රියාකාරකම් දිනයක් සැලසුම් කරන ලදි. ක්‍රියාකාරකම් දිනයේදී, සමස්ත දිවයින පුරා ප්ලාස්ටික් අපද්‍රව්‍ය එකතු කිරීම සිදු කරන ලදි.





සොබා සේයා චිත්‍ර සහ ඡායාරූප ප්‍රදර්ශනය

Young Zoologist Association සහ මධ්‍යම පරිසර අධිකාරිය සහයෝගීතාවයෙන් විශ්වවිද්‍යාල දිනයට සමගාමීව විශ්වවිද්‍යාල හරිත දිනය සැමරීම සඳහා දිවයින පුරා 2023 ජූලි මස චිත්‍ර සහ ඡායාරූප ප්‍රදර්ශනයක් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය පාරිසරික අධ්‍යයන සහ තිරසාර සංවර්ධන මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලදි. පාසල් ළමුන් සහ විවෘත යන කාණ්ඩ දෙක යටතේ මහජනතාව වෙනුවෙන් මෙම ප්‍රදර්ශනය කොළඹ සහ වෙනත් ප්‍රාදේශීය මධ්‍යස්ථානවලදී පවත්වන ලදි.





Sri Lanka Counter Wildlife Trafficking Awareness, Capacity & Empowerment වැඩසටහන

Environmental Foundation Limited (EFL) සමඟ සහයෝගීතාවයෙන් වැඩමුළු මාලාවක් සංවිධානය කරන ලදි. පළමු වැඩමුළුව 2023 ජූනි 19 සහ 23 යන දිනවල කොළඹ ගෝල් ෆේස් හෝටලයේදී පැවැත්විණ. නීති වෘත්තිකයින්ට වනජීවී ජාවාරම් නඩු සඳහා චෝදනා ඉදිරිපත් කිරීමට සහ අපරාදවලට එරෙහිව සටන් කිරීම වෙනුවෙන් අවශ්‍ය දැනුම සහ කුසලතා ලබා දීම මෙම වැඩමුළු මඟින් සිදු කෙරේ.

මෙම වැඩසටහනෙහි දෙවන වැඩමුළුව 2023 ජූලි 01 සහ 03 වන දිනවල මීගමුව Heritance හෝටලයේදී පැවැත්විණ. තිරසාර සංවර්ධනය සඳහා බලපාන බරපතල ගැටළු නිරාකරණය කිරීමට සහ ඵලදායී උපායමාර්ග පිළිබඳ සොයා බැලීම අරමුණු කරගනිමින් පරිසර සංරක්ෂණය සහ වන ජීවී ආරක්ෂණය හා සම්බන්ධ ප්‍රධාන ක්ෂේත්‍ර කෙරෙහි මෙම වැඩමුළුවේ දී අවධානය යොමු කරන ලදි.



Sri Lanka Counter Wildlife Trafficking Awareness, Capacity & Empowerment
වැඩසටහනෙහි දෙවන වැඩමුළුව

මෙම වැඩසටහනෙහි තෙවන වැඩමුළුව 2023 සැප්තැම්බර් 02 වන දින Cinnamon Grand හෝටලයේදී පැවැත්විණ. මෙම වැඩමුළුව මහාධිකරණ විනිසුරුවරුන් සඳහා Awareness & Sensitization පිළිබඳ එක් දින වැඩමුළුවක් වේ. මෙම වැඩසටහන අපරාධ ක්‍රියාවලට එරෙහිව සටන් කිරීම, දැනුවත්කිරීම, දැනුම හුවමාරු කිරීම, නීති රාමු ශක්තිමත් කිරීම, ශක්‍යතා වැඩි දියුණු කිරීම සහ පාර්ශවකරුවන් අතර සහයෝගීතාව ඇති කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදි.



Sri Lanka Counter Wildlife Trafficking Awareness, Capacity & Empowerment
වැඩසටහනෙහි තෙවන වැඩමුළුව

Mangrove for Ecological and Economic Sustainability පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය

Mangroves for Ecological & Economic Sustainability පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය යනු තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ශාත් කර ගැනීමේදී කඩොලානවලින් සිදුවන වැදගත් භූමිකාව පිළිබඳ අවධානය යොමු කිරීමේ අරමුණින් පවත්වන ලද වැදගත් සම්මන්ත්‍රණයක් වේ.

මඟින් දේශගුණික විපර්යාස අවම කිරීම, වෙරළාශ්‍රිත පරිසරය පවත්වා ගැනීම සඳහා කඩොලාන සහ ජෛවවිවිධත්වය, ආර්ථික සංවර්ධනය සඳහා කඩොලාන, කඩොලාන සංරක්ෂණය, පුනරුත්ථාපනය, සංරක්ෂණය සහ කඩොලාන හා පරිසර සංචාරක ව්‍යාපාරය ඇතුළුව කඩොලාන පරිසර පද්ධති සහ පාරිසරික සහ ආර්ථික තිරසාරභාවය සඳහා එහි ඇති වාසි පිළිබඳ විවිධ ක්ෂේත්‍රයන් මෙම සම්මන්ත්‍රණය මඟින් ආවරණය කෙරේ. මෙම සම්මන්ත්‍රණය 2023 ජූලි 26 වන දින ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේදී පැවැත්විණ.





I am Eco- smart වැඩසටහන

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ සේවය කරන (අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල) දෙමව්පියන්ගේ ළමුන් සඳහා අගෝස්තු පාසල් නිවාඩුව අතරතුර තිරසාර සංවර්ධනය පිළිබඳ ක්‍රියාකාරකම් පදනම් කරගත් එක් දින වැඩසටහනක් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය පාරිසරික අධ්‍යයන සහ තිරසාර සංවර්ධන මධ්‍යස්ථානය විසින් පවත්වන ලදි. ස්වභාවික පරිසරය, ජල සංරක්ෂණය, පාරිසරික බලපෑම් සහ දූෂණය, කොම්පෝස්ට් කිරීම සහ ගෙවතු වගාව, විකල්ප බලශක්ති, ආහාරවල වටිනාකම, නැවත භාවිත කිරීම සහ ප්‍රතිචක්‍රීකරණය, සම්පත් කාර්යක්ෂමතාව සහ ස්වේච්ඡා සේවයේ යෙදීමේ වැදගත්කම පිළිබඳ ළමුන්ගේ දැනුම සහ කුසලතා වැඩි දියුණු කිරීම මෙම වැඩසටහනෙහි අරමුණ වේ. 2023 අගෝස්තු 23 වන දින මෙම වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කරන ලදි.

Science & Technology Research for Science Teachers in Western Province පිළිබඳ ගුරු පුහුණු වැඩමුළුව

Sri Lanka Association for the Advancement of Science (SLAAS) සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ සහයෝගීතාව ඇතිව පාරිසරික අධ්‍යයන සහ තිරසාර සංවර්ධන මධ්‍යස්ථානය විසින් ගුරු පුහුණු වැඩමුළුවක් සාර්ථකව සංවිධානය කරන ලදි. "Inculcating Science and Technology Research in School Education" තේමාව යටතේ සැප්තැම්බර් 14 සහ 15 දිනවල මෙම වැඩමුළුව පවත්වන ලදි. මේ සඳහා බස්නාහිර පළාතේ ගුරුවරුන් බොහෝ දෙනෙක් සක්‍රීයව දායක විය.

Less Plastic Movement (LPM) National Campaign 2023 අදියර II

ආරම්භයක් ලෙස වෛද්‍ය අනිල් ජාසිංහ - පරිසර අමාත්‍යාංශ ලේකම්, මහාචාර්ය.පී.එම්.සී තිලකරත්න - ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය උපකුලපති, මහාචාර්ය. බන්දුනී අතපත්තු - අධ්‍යක්ෂ/ පාරිසරික අධ්‍යයන සහ තිරසාර සංවර්ධන මධ්‍යස්ථානය, මහාචාර්ය. රන්ගිකා බණ්ඩාර (Conceptualizer of LPM) - සහ ආචාර්ය. යොහාන් මහගමගේ - ජාතික සම්බන්ධීකාරක LPM යන අයගේ සහභාගීත්වයෙන් මාධ්‍ය සාකච්ඡාවක් 2023 නොවැම්බර් 10 වන දින සනාථන සභාවේදී පවත්වන ලදි.

Portrait Unveiling Ceramony චායාරූප නිරාවරණය කිරීමේ උත්සවයක්

මධ්‍යස්ථානයට විශේෂ දායකත්වයක් දැක්වූ හිටපු අධ්‍යක්ෂවරුන්ට ගෞරව කිරීමක් වශයෙන් චායාරූප නිරාවරණය කිරීමේ උත්සවයක් පාරිසරික අධ්‍යයන සහ තිරසාර සංවර්ධන මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලදි. 2023 දෙසැම්බර් 08 වන දින පැවැත්වුණු මෙම උත්සවය විශාල සාර්ථකත්වයක් අත් කරගන්නා ලදි.

UI Greenmetrics World ranking

තවද, 2023 UI Green Metric World University Rankings සඳහා අයදුම් කිරීම පාරිසරික අධ්‍යයන සහ තිරසාර සංවර්ධන මධ්‍යස්ථානය විසින් සිදු කරන ලදි. ලකුණු 5760ක් ලබා ගනිමින් විශ්වවිද්‍යාල 1183කින් 651වන ස්ථානය ලබා ගැනීමට විවෘත විශ්වවිද්‍යාලයට හැකි විය. මීට අමතරව, විවෘත විශ්වවිද්‍යාලය දිවයිනේ විශ්වවිද්‍යාල අතරින් 5වන ස්ථානය ලබා ගන්නා ලදි.

අයිතමය	**2023**	2022	2021
ලෝක ශ්‍රේණිගත කිරීම	**651**	566	725
දිවයිනේ ශ්‍රේණිගත කිරීම	**5**	6	7
මුළු ලකුණු	**5760**	5600	4200
ස්ථානය සහ යටිතල පහසුකම්	**600**	950	875
බලශක්ති සහ දේශගුණික විපර්යාස	**1050**	1050	425
කසළ	**900**	750	750
ජලය	**350**	350	300
ප්‍රවාහන	**1210**	1250	925
අධ්‍යාපනය සහ පර්යේෂණ	**1650**	1250	925
සහභාගී වූ රටවල් ගණන	**1183**	1050	956

ප්ලාස්ටික් සහ පරිසර තිරසාරබව පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය

පාරිසරික සහ තිරසාර සංවර්ධන මධ්‍යස්ථානය විසින් දූෂණය, මානව සෞඛ්‍ය සහ විකල්ප යන තේමා යටතේ ප්ලාස්ටික් සහ පරිසර තිරසාරබව පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණයක් දැනට සංවිධානය කරමින් පවතී. මෙම සම්මන්ත්‍රණය 2024 වර්ෂයේ මාර්තු 7 සහ 8 වන දිනවල වෝටර්ස් එජ් හීදී පවත්වනු ලැබේ.

තිරසාරබව සඳහා කඩොලාන පිළිබඳ 2වන ජාත්‍යන්තර සම්මන්ත්‍රණය



කඩොලාන පිළිබඳ කේන්ද්‍ර කර ගනිමින් පාරිසරික සහ තිරසාර සංවර්ධන මධ්‍යස්ථානය විසින් ජාත්‍යන්තර සම්මන්ත්‍රණයක් දැනට සංවිධානය කරමින් පවතී. මෙම සම්මන්ත්‍රණය 2024 ජූලි 22 සහ 23 දිනවල කළුතර තූර්යා හෝටලයේදී පැවැත්වීමට නියමිත වේ. මේ සඳහා නිබන්ධන කැඳවීම ආරම්භ කර ඇති අතර ඒ පිළිබඳ උනන්දුවක් දක්වන අයට නිල සම්මන්ත්‍රණ වෙබ් අඩවිය හරහා තම නිබන්ධන ඉදිරිපත් කිරීමට ආරාධනා කෙරේ.

6.13 ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමතාවය සහ සමානාත්මතාවය සඳහා වූ මධ්‍යස්ථානය



ස්ත්‍රී පුරුෂ සමතාවය සහ සමානාත්මතාවය සඳහා වූ මධ්‍යස්ථානය විසින් 2023 වර්ෂය තුළ සිදු කළ ක්‍රියාකාරකම්.

- ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය උසස් කළමනාකාරීත්වය සඳහා Learning to live with diversity (LLWD) පාඨමාලාව පිළිබඳ විශේෂ දැනුවත් කිරීමේ සැසියක් 2023 ජනවාරි මස පවත්වන ලදී.

- IWD චිත්‍රපට උළෙල අනෝමා රාජකරුණා මහත්මියගේ ප්‍රධානත්වයෙන් කාන්තා චිත්‍රපට නිර්මාණකරුවන් විසින් නිර්මාණය කරන ලද කෙටි චිත්‍රපට 4ක් සහ වාර්තා වැඩසටහනක් ප්‍රදර්ශනය කරමින් නව ශ්‍රවණාගාරයේදී අප්‍රේල් 25වන දින 9.30 සිට 12.30 දක්වා සාර්ථකව පවත්වන ලද අතර මණ්ඩල සාකච්ඡාවක් ඔවුන් සමඟ පවත්වන ලදී.







- කළමනාකරණ අධ්‍යයන පීඨය සඳහා වන guest talk සැසියේදී ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය කළමනාකරණ අධ්‍යයන පීඨයේ පීඨාධිපති මහාචාර්ය. නලීන් අබේසේකර විසින් ඉදිරිපත් කරන ලද “Transformational leadership – is it gender sensitive?” මාතෘකාව සාකච්ඡා කිරීම ජුනි 14 වන දින ඉංජිනේරු තාක්ෂණ පීඨයේ රැස්වීම් ශාලාවේදී පෙ.ව. 10.00 සිට ප.ව 12.00 දක්වා සාර්ථකව පැවැත්විණ.

- කළමනාකරණ අධ්‍යයන පීඨය සඳහා වන guest talk සැසියේදී පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ නීති පීඨයේ ප්‍රධානී, මහාචාර්ය. දීපිකා උඩුගම විසින් ඉදිරිපත් කරන ලද “University as our workplace – Reflection on duties and rights” මාතෘකාව සාකච්ඡා කිරීම ජුනි 14 වන දින ඉංජිනේරු තාක්ෂණ පීඨයේ රැස්වීම් ශාලාවේදී පෙ.ව. 10.00 සිට ප.ව 12.00 දක්වා සාර්ථකව පැවැත්විණ.

- ආචාර්ය. අනෝමා සතරසිංහ, ආචාර්ය. රේණුකා පෙරේරා, ආචාර්ය. කාංචනා බුළුමුල්ල, එම්.එල්. සුදර්ශන මහතා සහ කේතිස්වරන් මහතා යන සාමාජිකයින්ගෙන් සමන්විත මණ්ඩලයක් සමඟ Learning to Live with Diversity (LLWD) කෙරෙහි අවධානය යොමු කරමින් කාර්ය මණ්ඩල සාමාජිකයින් (අධ්‍යයන හා අනධ්‍යයන)සඳහා දින භාගයක දැනුවත් කිරීමේ සැසියක් ජුනි 23 වන දින ප.ව. 1.00 සිට 4.00 දක්වා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේදී පැවැත්විණ.



- ස්වභාවික විද්‍යා පීඨය සඳහා වන මණ්ඩල සාකච්ඡා සැසිය ආචාර්ය. මනෝජ් ප්‍රනාන්දු (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ව්‍යවහාරික වෛද්‍ය පීඨය, රජරට විශ්වවිද්‍යාලය), ආචාර්ය. නදීක චන්ද්‍රරත්න (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය), ආචාර්ය. කාංචනා බුළුමුල්ල (අධ්‍යක්ෂ, ස්ත්‍රී පුරුෂ සමතාවය සහ සමානාත්මතාවය සඳහා වූ මධ්‍යස්ථානය) යන සාමාජිකයින් විසින් ඉදිරිපත් කරන ලද "Gender equity and science: Context of the higher education, possibilities and nuances" මාතෘකාව පිළිබඳ සාකච්ඡා කිරීම සැප්තැම්බර් 01 වන දින පෙ.ව.10.00 - ප.ව.12.00 දක්වා ස්වභාවික විද්‍යා පීඨයේ රැස්වීම් ශාලාවේදී සාර්ථකව පැවැත්විණ.

- Learning to Live with Diversity (LLWD) ක්ෂේත්‍රය කෙරෙහි අවධානය යොමු කරමින් කාර්ය මණ්ඩල සාමාජිකයින් (අධ්‍යයන හා අනධ්‍යයන), ශිෂ්‍යයින්, ගුරුවරුන් සහ නිලධාරීන් සඳහා දින භාගයක දැනුවත් කිරීමේ සැසියක් සැප්තැම්බර් 14 වන දින 120 දෙනෙකුගේ සහභාගීත්වයෙන් හැටන් අධ්‍යයන මධ්‍යස්ථානයේදී පැවැත්විණ.



- කාර්යාල සංවර්ධන මධ්‍යස්ථානයේ උසස් අධ්‍යාපනය ඉගැන්වීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව සඳහා සැසියක් සැප්තැම්බර් 21 වන දින සහ සෞඛ්‍ය විද්‍යා පීඨයේ නව ශිෂ්‍යයින් සඳහා නම්නීකරණ වැඩසටහනක් සැප්තැම්බර් 26 වන දින අධ්‍යක්ෂ විසින් පවත්වන ලදි.

- මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨය සඳහා වන guest talk සැසියේදී ''යෙහෙලිය පදනම'' නිර්මාතෘ, නීතිඥ, නෞශල්‍යා රාජපක්ෂ මෙය විසින් "Comprehensive and affective policies to prevent and response to sexual harassment in Sri Lanka මාතෘකාව පිළිබඳ සාකච්ඡා කිරීම 2023 නොවැම්බර් 22වන දින පෙ.ව. 10.30 සිට ප.ව. 12.00 දක්වා මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨයේ රැස්වීම් ශාලාවේදී පැවැත්විණ.



ස්ත්‍රී පුරුෂ අසමානතාව සහ ලිංගික හා ස්ත්‍රී පුරුෂභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය පිළිබඳ රාජකාරී ස්ථාන පදනම් කරගත් අත්දැකීම් පිළිබඳ සමීක්ෂණය සිදු කෙරෙමින් පවතින අතර දත්ත විශ්ලේෂණය සිදු කර ප්‍රතිඵල වාර්තාවක් ලෙස සූදානම් කෙරේ.

6.14 තත්ත්ව පාලන මධ්‍යස්ථානය

තත්ත්ව පාලන මධ්‍යස්ථානයේ අභිප්‍රාය

විවෘත දුරස්ථ ඉගෙනුම් ක්‍රමවේදයට අනුකූලව ප්‍රථම උපාධි, පශ්චාත් උපාධි සහ වෘත්තීය සංවර්ධන පාඨමාලා සහ අධ්‍යයන වැඩසටහන් වැඩි දියුණු කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ පරමාර්ථය සාක්ශාත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය සියළුම ක්‍රියාකාරකම්වල ගුණාත්මකභාවය පවත්වාගෙන යාම සහ ඉහළ නැංවීම වෙනුවෙන් යාන්ත්‍රණ සහ ක්‍රියාපටිපාටි වැඩි දියුණු කර ක්‍රියාත්මක කිරීම තත්ත්ව පාලන මධ්‍යස්ථානයේ අභිප්‍රාය වේ. පීඨ සහ අධ්‍යනාංශ සහ වෙනත් අධ්‍යයන ආයතන මඟින් සිදු කරනු ලබන අධ්‍යයන ක්‍රියාකාරකම්වලට අමතරව සියළුම පරිපාලන කාර්යයන් සහ ප්‍රාදේශිය අධ්‍යාපන සේවාවන් ආවරණය කිරීම තත්ත්ව පාලන මධ්‍යස්ථානය විසින් සිදු කරනු ලබයි.

තත්ත්ව පාලන මධ්‍යස්ථානයේ කාර්යයන් පාලනය කිරීම සිදු කරනු ලබන්නේ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය තත්ත්ව පාලන මධ්‍යස්ථානයේ අංක.14 දරන අතුරු නීති විධිවිධානවලට අනුකූලව වේ.

තත්ත්ව පාලනය පිළිබඳ සනාථන සභාවේ කැඳවුම්කරු සහ ලේකම් තත්ත්ව පාලන මධ්‍යස්ථානයේ සහකාර ලේඛකාධිකාරී වේ.

තත්ත්ව පාලන මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරයා තත්ත්ව පාලන විෂය ක්ෂේත්‍රය තුළ ප්‍රමාණවත් පළපුරුද්දක් සහ දැනුමක් සහිත ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය මහාචාර්යවරයෙකු හෝ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු විය යුතු ය. සනාථන සභාවේ නිර්දේශය මත ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය පාලක සභාව විසින් වසර 3ක කාල සීමාවක් සඳහා ඔහු/ඇය පත් කරනු ලැබේ.

තත්ත්ව පාලන ස්ථාවර කමිටුව අවශ්‍ය යැයි සැලකෙන අවස්ථාවල සහ අවම වශයෙන් මාස 2කකට වරක් රැස්විය යුතු ය. එවැනි රැස්වීමක් සඳහා වන ගණපූරණය සම්පූර්ණ සාමාජිකත්වයෙන් අඩක් වේ.

තත්ත්ව පාලන මධ්‍යස්ථානයේ කාර්යයන් සහ වගකීම්

තත්ත්ව පාලන මධ්‍යස්ථානයේ කාර්යයන් සහ වගකීම් පහත සඳහන් ක්‍රියාකරකම්වලින් සමන්විත වේ:

i. විශ්වවිද්‍යාලය තුළ තත්ත්ව පාලනය ආශ්‍රිත සියළුම ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම.

ii. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා තත්ත්ව පාලන කවුන්සිලය සහ වෙනත් බාහිර තත්ත්ව පාලන ආයතන හා සම්බන්ධ වීම.

iii. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව පාලන කවුන්සිලය විසින් වැඩි දියුණු කරන ලද සාමාන්‍ය මාර්ගෝපදේශවලට අනුකූලව තත්ත්ව පාලන මධ්‍යස්ථානය සඳහා මෙහෙයුම් මාර්ගෝපදේශ සකස් කිරීම.

iv. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව පාලනය පිළිබඳ ස්ථාවර කමිටුව වෙත විශ්වවිද්‍යාලයීය තත්ත්ව පාලන ක්‍රියාකාරකම් වාර්තා කිරීම.

v. තත්ත්ව පාලන මධ්‍යස්ථානය සඳහා තුන් අවුරුදු උපායමාර්ගික සැලැස්මක් වැඩි දියුණු කර සනාථන සභාවේ සහ පාලක සභාවේ අනුමැතිය ලබාගෙන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව පාලන කවුන්සිලයේ එකඟතාවය මත ක්‍රියාත්මක කිරීම.

vi. තත්ත්ව පාලන මධ්‍යස්ථානය සඳහා වාර්ෂික සේවා සැලැස්මක් වැඩි දියුණු කර ඒ සඳහා විශ්වවිද්‍යාල සනාථන සභාවේ සහ පාලක සභාවේ අනුමැතිය ලබා ගැනීම.

vii. තත්ත්ව පාලන සමාලෝචන/ විගණන සහ පසුවිපරම් ක්‍රියාත්මක කිරීම

viii. සියළුම පීඨ, අධ්‍යනාංශ සහ පරිපාලන අංශ වෙත තත්ත්ව පාලන උපදේශන ලබා දීම.

ix. පීඨවල තත්ත්ව පාලන අංශයන් පිළිබඳ අත්පොත් සකස් කිරීමට සහාය දැක්වීම.

x. වැඩසටහන් සමාලෝචන සඳහා ස්වයං ඇගයීම් වාර්තා සකස් කිරීම ඇතුළු පීඨ මට්ටමේ තත්ත්ව පාලන ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම සහ මාර්ගෝපදේශ සැපයීම.

xi. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය උපායමාර්ගික කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම.

xii. කාර්ය මණ්ඩල කාර්යසාධනය සමාලෝචනය කිරීම සහ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය විවිධ කාර්ය මණ්ඩල කාණ්ඩවල පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම.

xiii. අධ්‍යනාංශ අතර සිදු කරන ක්‍රියාමාර්ග හඳුනාගෙන පහසුකම් සැලසීම.

xiv. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය තුළ භාවිත කිරීම සඳහා තත්ත්ව පාලනය හා සම්බන්ධ මාර්ගෝපදේශ සහ අත්පොත් සකස් කිරීම.

xv. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ සහාය ඇතිව පීඨ මට්ටමින් සහ පරිපාලන මට්ටමින් කාර්ය මණ්ඩල සාමාජිකයින් අතර තත්ත්ව පාලනය සම්බන්ධ වැඩසටහන් පවත්වන ලදි.

xvi. පීඨ සහ පරිපාලන මට්ටමේ තත්ත්ව පාලන කුටි පිහිටුවීම එහි කාර්යයන් සහ වගකීම් නිර්වචනය කිරීම.

xvii. විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩලය සහ ආයතනවල ස්වයං ඇගයීම් සකස් කිරීම සහ පැවැත්වීම.

xviii. තත්ත්ව පාලනය කිරීමේ ක්‍රියාකරකම් සම්බන්ධයෙන් ජාත්‍යන්තර නියෝජිත ආයතන සහ විශ්වවිද්‍යාල සමඟ සබඳතා වර්ධනය කිරීම සහ සම්බන්ධ කිරීම.

xix. ශිෂ්‍යය සමීක්ෂණ ඇතුළු බාහිර සහ අභ්‍යන්තර සමාලෝචන ප්‍රතිඵල සියළුම කාර්ය මණ්ඩල සාමාජිකයින්ට සහ පර්ශවකරුවන්ට ලබා දීම.

7 කොටස – අනාගත සැලසුම්

07. අනාගත සැලසුම් - 2024

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම විවෘත හා දුරස්ථ ඉගෙනුම් උසස් අධ්‍යාපන ආයතනය වශයෙන් එහි මෙහෙවරෙහි අරමුණු වෙත ළඟා වීමේදී ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය සේවාවන් තවදුරටත් ව්‍යාප්ත කිරීම හා වැඩි දියුණු කිරීම සඳහා ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන අනාගත වැඩසටහන්වලින් කිහිපයක් පහත දැක්වේ. මෙම යෝජිත වැඩසටහන් තිරසර සංවර්ධන අරමුණු සැලකිල්ලට ගෙන සකස් කර ඇත.

1. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය තුළ අධ්‍යාපනය හදාරන ශිෂ්‍යයින් විවිධ වන අතර දිවයිනේ සියළුම ප්‍රදේශ නියෝජනය කරනු ලබයි. ශිෂ්‍යයින් විසින් සිදු කරනු ලබන විමසීම්වලට ප්‍රතිචාර දැක්වීම සඳහා web-based portal සහ AI chatbot පාදක කරගත් දියුණු වෙමින් පවතින කෘතිම බුද්ධිය (AI) හරහා කාර්යක්ෂම ඉගෙනුම් සහාය සේවාවක් ලබා දීමට විශ්වවිද්‍යාලය අපේක්ෂා කරනු ලබයි.

2. ලොව පුරා ඇති විශ්වවිද්‍යාල industry micro credentials තුළින් ප්‍රතිලාභ ලබන අතර එමගින් විශ්වවිද්‍යාලයීය ලියාපදිංචි කිරීම්, ශ්‍රේණිගත කිරීම සහ කීර්තිනාමයේ ඉහළ යාමක් ද සිදු වේ. එම නිසා, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය වෘත්තීය ආයතනයක් ස්ථාපිත කිරීම මඟින් micro credentials හඳුන්වා දෙනු ලැබේ.

3. 2028 වර්ෂය සහ ඉන් ඉදිරියට ඇති රැකියා ඉල්ලුමට අනුකූල වන පරිදි විෂයමාලා සංස්කරණය/ සියළුම පීඨවල උපාධි වැඩසටහන් ප්‍රතිව්‍යූහගත කිරීම සිදු කරනු ලැබේ. රැකියා පාදක කරගත් නව උපාධි වැඩසටහන් හඳුන්වා දීම සහ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන සියළුම වැඩසටහන් සඳහා ශිෂ්‍යයින් බඳවා ගැනීම වැඩි කිරීම.

4. මධ්‍යම මණ්ඩපය හා ප්‍රාදේශීය සහ අධ්‍යයන මධ්‍යස්ථාන දියුණු කිරීමේ අනෙකුත් ව්‍යාපෘති සැළසුම් කෙරෙමින් පවතින අතර 2024 වර්ෂය තුළ සම්පූර්ණ කිරීමට අපේක්ෂා කෙරේ.

    (අ) සෞඛ්‍ය විද්‍යා පීඨය සඳහා වන පස් මහල් ගොඩනැගිල්ලෙහි ඉදිකිරීම් කටයුතු.

    (ආ) කොළඹ ප්‍රාදේශීය මධ්‍යස්ථානය තුළ සිසුන්ට අධ්‍යයන කටයුතු සිදු කිරීම සඳහා ස්ථාන ඉදි කිරීම.

    (ඇ) ගම්පහ, අම්පාර, මන්නාරම, මඩකළපුව, මහනුවර, බණ්ඩාරවෙල අධ්‍යයන මධ්‍යස්ථාන සඳහා තාවකාලික විභාග ශාලා ඉදි කිරීම.

    (ඈ) විවෘත විශ්වවිද්‍යාලයීය කළමනාකරණ තොරතුරු පද්ධතිය වැඩි දියුණු කිරීම අඛණ්ඩව සිදු කෙරේ. මෙම පද්ධතිය මඟින් ශිෂ්‍යය ලියාපදිංචි කිරීමේ සිට උපාධි ප්‍රදානෝත්සවය දක්වා සියළුම ක්‍රියාවලි ස්වයංක්‍රීයව මෙහෙයවීම සිදු කෙරේ.

ලියාපදිංචි ගාස්තු	25,000,000	25,000,000	20,620,724	(4,379,276)
සිසුන්ගෙන් ලැබෙන ආදායම	1,650,000,000	1,650,000,000	1,836,216,426	186,216,426
විභාග ගාස්තු/ සහතික පත්‍ර ගාස්තු	10,000,000	10,000,000	22,906,911	12,906,911
පුස්තකාල දඩ	100,000	350,000	366,180	16,180
නේවාසික ගාස්තු	1,000,000	1,500,000	1,498,500	(1,500)
ප්‍රකාශන/අයදුම්පත්‍ර අලෙවි කිරීම	30,000,000	30,000,000	72,839,393	42,839,393
දේපළවලින් ලැබෙන කුලිය/ වාහන කුලියට දීම	3,000,000	3,000,000	3,082,245	82,245
විවිධ හා වෙනත් ආදායම්	32,500,000	48,500,000	125,123,709	76,623,709
මුළු ආදායම	**4,400,600,000**	**4,602,350,000**	**4,908,565,068**	**306,215,068**
වියදම				
පුද්ගලික වැටුප්	2,700,000,000	2,710,000,000	2,775,780,952	65,780,952
ගමන් හා යැපීම්	7,000,000	4,500,000	5,958,506	1,458,506
සැපයුම්	92,750,000	109,250,000	113,295,098	4,045,098
නඩත්තු සේවා	94,000,000	138,500,000	141,801,081	3,301,081
කොන්ත්‍රාත් සේවා	614,500,000	549,500,000	460,150,899	(89,349,101)
වෙනත් පුනරාවර්තන වියදම්	279,000,000	292,250,000	358,211,462	65,961,462
මුළු වියදම	**3,787,250,000**	**3,804,000,000**	**3,855,197,999**	**51,197,999**

❖ **ඉංග්‍රීසි පිටපතේ අත්සන යොදා ඇත.**

9.7 පසුගිය වර්ෂ පහ තුළ මුල්‍යමය ලෙස වැදගත් සිදුවීම්

(රු.)

විස්තරය	2019 (නැවත සඳහන් කල)	2020	2021 (නැවත සඳහන් කල)	2022 (නැවත සඳහන් කල)	2023
ආදායම					
පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන	1,600,000,000	1,920,000,000	2,280,000,000	2,484,000,000	2,605,000,000
පර්යේෂණ සඳහා ප්‍රාග්ධන ප්‍රදාන	9,000,000	-		-	-
ආයෝජන සඳහා පොලිය	93,743,600	40,531,326	23,863,338	121,221,816	-
ණය සහ අත්තිකාරම්වලින් පොලිය	3,376,124	3,458,172	3,233,012	3,275,711	3,590,999
දේපළවලින් ලැබෙන කුලිය	1,953,813	2,827,241	958,841	2,732,468	2,950,535
පැරණි ගබඩා අලෙවිය	783,820	4,100	-	31,500	1,213,952
විවිධ ලැබීම්	12,540,349	11,914,685	18,344,085	4,665,986	-
ලියාපදිංචි ගාස්තු	25,354,799	7,560,100	17,679,366	19,246,638	20,620,724
ශිෂ්‍යයින්ගෙන් ලැබුණු ආදායම	1,214,557,500	739,787,584	951,801,361	1,720,679,953	
විභාග ගාස්තු	4,754,172	4,332,170	1,106,996	12,025,403	22,906,911
ප්‍රකාශන/අයදුම්පත්‍ර අලෙවි කිරීම	14,199,170	50,422,798	24,657,224	65,047,975	72,866,144
පුස්තකාල දඩ	280,520	91,770	11,438	104,550	-
පරිපුරක ගාස්තු	3,500	-	75,000	120,000	80,000
නේවාසික ගාස්තු	1,633,500	504,350	45,450	924,150	1,498,500
කෙටි පාඨමාලා වලින් හා වෙනත් මූලාශ්‍රවලින් ලැබෙන ආදායම	29,136,288	51,397,032	82,125,354	63,222,705	
වාහන කුලියට දීම	105,674	64,747	-	125,306	131,710
බැඳුම්කර උල්ලංඝනය කිරීමට අදාළව ලැබුණු ආදායම	8,427,337	22,386,910	9,420,072	18,713,974	25,462,920
විනිමය අනුපාත වෙනස			17,085	376,943	-
පරිත්‍යාග ක්‍රමක්ෂය කිරීම හා ප්‍රාග්ධන වියදම්	121,416,738	81,752,918	83,562,992	90,230,424	-
වියදම් කරන ලද ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම	82,823,152	80,328,867	63,874,828	47,074,110	-
මුළු එකතුව	**3,224,090,058**	**3,017,364,771**	**3,560,776,443**	**4,653,819,611**	**2,756,322,394**
වියදම					
සාමාන්‍ය පරිපාලන සහ කාර්ය මණ්ඩල සේවා	459,503,554	415,057,866	431,588,220	499,118,590	596,177,468
එකතු කළා : ක්ෂයවීම්	345,022,489	381,587,113	406,673,931	462,313,133	-
	804,526,043	**796,644,979**	**24,914,288**	**36,805,457**	**596,177,468**

සංසරණය නොවන ද්‍රව්‍ය බැහැර කිරීම සහ කාර්ය මණ්ඩල සේවා			2,891,380	1,065,551	8,050,365
ලැබිය යුතු මුදල් නොලැබීම් (ශිෂ්‍ය)	37,827,384	40,655,161	-		43,766,998
අස්පෘෂ්‍ය වත්කම් ක්‍රමක්ෂය කිරීම	2,382,353	2,382,353	3,442,092	3,491,601	-
ලැබිය යුතු මුදල් නොලැබීම (කාර්ය මණ්ඩල/ ශිෂ්‍ය)	-	-	43,729,298	10,487,725	-
විනිමය අනුපාත වෙනස	11,706				298,316
අධ්‍යයන සේවා	2,540,839,811	2,397,981,360	2,256,130,720	2,530,045,369	2,779,232,450
ඉගැන්වීම් සම්පත්	158,260,681	146,332,728	137,930,943	155,735,019	167,007,348
සෞඛ්‍ය සේවා	5,510,585	6,220,381	6,641,971	6,727,842	6,069,696
ඉඩම් හා ගොඩනැගිලි නඩත්තුව	66,606,729	60,435,254	58,542,667	83,597,120	106,629,188
අනුෂාංගික කටයුතු	124,669,971	98,229,330	121,139,264	225,441,255	200,081,849
මුළු එකතුව	**3,740,635,263**	**3,548,881,546**	**2,655,362,624**	**3,978,023,204**	**3,907,313,678**

10 කොටස - විගණන වාර්තා

10.0 විගණන වාර්තා

10.1 විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. HED/F/1/OUSL/2023/FA/20
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2024 ජූලි 23 දින

උපකුලපති,
ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය.

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) විශ්වවිද්‍යාලයේ ගොඩනැගිලි 02 කට තෙකලා විදුලි සම්බන්ධතාවය ලබාගැනීම සඳහා 2022 වර්ෂයේදී විදුලිබල මණ්ඩලයට ගෙවා තිබුණු රු.4,098,592 ක් එම වර්ෂයේදී පුනරාවර්තන වියදමක් ලෙස ගිණුම්ගත කර තිබීමේ අදාළය සමාලෝචිත වර්ෂය තුළදීද අනිනානුයෝගිව නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

අංක 306/72, පොළුදුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

(ආ) 2018 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාලසීමාව තුල උසස් අධ්‍යාපන ප්‍රවේශ වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියෙන් (AHEAD) ගොඩනැගිලි හා උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් හා වැටුප්, දීමනා හා අනෙකුත් වියදම් ගෙවීම සඳහා ලැබී තිබුණු රු.241,336,414 ක් ගිණුම්ගතකර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාළව ලැබිය යුතු ශිෂ්‍ය ආදායම නිවැරදිව හඳුනාගැනීමකින් තොරව ශිෂ්‍ය ආදායම් පාලන ගිණුමේ ශේෂය හා හඳුනානොගත් ශිෂ්‍ය ආදායම් ගිණුමේ ශේෂය අතර රු.801,136,623 ක වෙනස ලැබිය යුතු ශිෂ්‍ය ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණු අතර එහි කාල විශ්ලේෂණයක්ද ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) 2023 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.13,382,583 ක් වූ අස්පෘශ්‍ය වත්කම් ඒවා මිලදීගත් දිනයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ක්‍රමක්ෂය කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට අධ්‍යයන මෙවලම් (Course Materials) තොගයේ වටිනාකම රු.123,405,203 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් ගබඩාවට ලැබී තිබුණු පිරිවැය රු.5,976,835 ක් වූ ලිපිද්‍රව්‍ය හා පරිගණක උපාංග ගිණුම්ගත කර නොතිබුණි.

(උ) ඉකුත් වර්ෂයේදී වැඩියෙන් ගිණුම්ගත කර තිබුණු උපචිත වියදම් රු.27,962,527ක් සමාලෝචිත වර්ෂයේ වියදම්වලින් අඩුකර දැක්වීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. තවද 2021 වර්ෂයේදී වැඩියෙන් ගිණුම්ගත කර තිබුණු රු.30,282,945ක උපචිත වියදම් 2022 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් උපචිත වියදම් රු.58,245,472ක් වැඩියෙන් දක්වා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.191,982,135 ක් වූ උපචිත වියදම් ශේෂය සඳහා කාලවිශ්ලේෂණයක් ඉදිරිපත් නොකෙරුණි.

(ඌ) 2018 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාලය තුළ එකතු කල අගය මත බදු(VAT) ඉන්වොයිස්පත් ඉදිරිපත් නොකරන ලද කොන්ත්‍රාත්කරුවන්ට හා සැපයුම්කරුවන්ට ගෙවිය යුතු එකතු කල අගය මත බදු (VAT) වියදම් ලෙස එකතුව රු.14,023,270ක් ගිණුම්ගත කර තිබීම හේතුවෙන් ගෙවිය යුතු බදු වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(එ) අක්කර 34 ක භූමි භාගයක් තුළ පිහිටි විවෘත විශ්වවිද්‍යාලයේ පවතින අභ්‍යන්තර මාර්ග පද්ධතිය තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඒ) 2019 දෙසැම්බර් සිට 2023 ජූනි දක්වා Curriculum Development on Europe Sri Lanka Capacity Building in Energy Circular Economy මගින් විශ්වවිද්‍යාලය වෙත ලැබී තිබූ එකතුව රු.175,405,241ක් හා ඉන් දරන ලද වියදම් ගිණුම්ගත කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ

මතය සඳහා පදනමක් සැපයීම් උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 විශ්වවිද්‍යාලයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් විශ්වවිද්‍යාලයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා

ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අබණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා විශ්වවිද්‍යාලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ (අ),(ආ),(ඇ),(ඈ),(ඉ),(ඌ) සහ (ඒ) ඡේද යටතේ දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනුකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති/ විධානයට යොමුව		නිරීක්ෂණය
(අ)	1971 අංක 38 දරන මුදල් පනතේ 11(අ) , 9(2)(ඊ) හා 10(5)(1) වගන්ති		අදාල අමාත්‍යවරයාගේ හා මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගැනීමකින් තොරව විශ්වවිද්‍යාලය විසින් 2023 දෙසැම්බර් 31 දින වන විට රු.2,238,763,138ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය		
	(i)	මුදල් රෙගුලාසි 102, 103, 104, හා 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය , 2023 මැයි 16 දිනැති අංක PED/01/2021 (i) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	2018 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා එකතුව රු.39,122,656 ක් වූ හානි වූ හා යල් පැනගිය අධ්‍යයන ද්‍රව්‍ය (Course materials) භාණ්ඩාගාර අනුමැතියකින් තොරව විශ්වවිද්‍යාල පාලක මණ්ඩලය විසින් කපාහැරීමට අනුමැතිය ලබාදී තිබුණි.
	(ii)	මුදල් රෙගුලාසි 371(2) වගන්තිය	2013 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළදී අවස්ථා 18කදී ලබාදී තිබුණු එකතුව රු.1,204,594 ක් වූ මුදුණාල අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා පියවා නොතිබුණි.
	(iii)	මුදල් රෙගුලාසි 571	එකතු වටිනාකම රු.55,295,904ක් වූ කල් ඉකුත් වූ රෙදිවුම්, ලංසු සුරක්ෂණ හා කාර්යසාධන සුරක්ෂණ නියාදනය කර නොතිබුණි.
	(iv)	මුදල් රෙගුලාසි 756	වටිනාකම රු.332,601,124 ක් වූ පුස්තකාල පොත් තොගය හා පිරිවැය රු.85,538,631 ක් වූ ප්‍රාදේශීය මධ්‍යස්ථාන 27 ක පාඨමාලා ද්‍රව්‍ය, ඇදීම් උපකරණ හා අනෙකුත් තොග සමීක්ෂණය කර නොතිබුණි.
(ඇ)		ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.7.5 හා 2020 මාර්තු 25 දිනැති අතිරේක 35	දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු(සුළු) සීමාව ඉක්මවීම වැළැක්වීමේ අරමුණින් රු.53,694,380ක්, රු.70,045,252ක් හා රු.58,804,931 ක් වූ ගොඩනැගිලි නවීකරණ ප්‍රසම්පාදන කාර්යයන් 03 ක් අදියර 2 ක් හා 3 ක් ලෙස කොටස්කර 2023 වර්ෂයේ එකම කාලසීමාවක් තුළ ආරම්භ කර වැඩ නිමවන පරිදි ප්‍රසම්පාදනය කර තිබුණි.

(ඇ)		2013 ජනවාරි 31 දිනැති අංක 02/2013 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1 වගන්තිය	භාණ්ඩාගාර අනුමැතියකින් තොරව උපරිමය රු.500,000ක ණය කාඩ්පතක් (Credit Card) 2021 සිට ආරම්භ කර ගනුදෙනු කරමින් පැවතුණි.
(ඉ)		1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය	2023 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.2,043,340,394ක් වූ දේපල පිරියත උපකරණ සහ පිරිවැය රු.18,780,970ක් වූ අස්පෘශ්‍ය වත්කම් සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.
(ඊ)	(i)	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ V වැනි පරිච්ඡේදයේ 7.6 වගන්තිය	1989 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාලසීමාව තුළ බැඳුම්කර ගිවිසුම් කඩකරන ලද නිලධාරීන් 39 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.177,019,582 ක් 2023 දෙසැම්බර් 31 දින දක්වා අයකර ගෙන නොතිබුණි
	(ii)	2023 ජනවාරි 18 දිනැති අංක BD/HRD/126/214/19/2023 දරන භාණ්ඩාගාර ලේකම්ගේ ලිපියේ 05 ඡේදය	බැඳුම්කර හා ගිවිසුම් කඩවීම් හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී අයකරගෙන තිබුණු රු.26,187,720 ක් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීමට කටයුතුකර නොතිබුණි.
(උ)		විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ XX පරිච්ඡේදයේ 3.1 වගන්තිය සහ 2017 ජූලි 10 දිනැති අංක 10/2017 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය.	අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 347 දෙනෙකුගේ පැමිණීම හා පිටවීම සනාථ කර ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය සඳහා වැටුප් හා දීමනා ලෙස රු.1,734,782,688 ක් ගෙවා තිබුණි.
(ඌ)		2021 නොවැම්බර් 16 දිනැති Operational Manual (01/2021) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2.3 වගන්තිය	පාඨමාලා මෙහෙයවීමේ ක්‍රියාකාරකම් කාලසටහන් (activity schedule) හා විශ්වවිද්‍යාලයේ සියළුම අංශවල ක්‍රියාකාරකම් ඇතුළත්ව 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම චක්‍රලේඛ උපදෙස් පරිදි පිළියෙල කර නොතිබුණි.
(එ)		මුදල් රෙගුලාසි 756 සහ 2020 අගෝස්තු 20 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 11 පරිච්ඡේදය	විවෘත විශ්වවිද්‍යාලයේ තොරතුරු තාක්ෂණ අංශයේ ඉන්ටෙන්ට්‍රි ලේඛන විධිමත්ව පවත්වා ගෙන ගොස් නොතිබුණි. එමෙන්ම, 2024 මාර්තු 11 දින සිදුකළ භෞතික පරීක්ෂාවේදී සර්වර් යන්ත්‍ර 04 ක ඌනතාවයක් පැවති අතර ඒ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි

(ඒ)	2020 අගෝස්තු 14 දිනැති අංක SC & PMU/Grant/20 දරන විදේශ සම්පත් දෙපාර්තමේන්තු චක්‍රලේඛය	විදේශ සම්පත් දෙපාර්තුමේන්තුවේ අනුදැනුම හා එකඟතාවය ලබාගැනීමෙන් තොරව, 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලය තුල දී පර්යේෂණ සඳහා රු.25,719,472 ක විදේශ ප්‍රදාන 5ක් සහ සංවර්ධන ව්‍යාපෘති සඳහා විදේශ ප්‍රදාන රු.193,888,967 ක් පුද්ගලයින්ගෙන් හා ආයතන මඟින් විවෘත විශ්වවිද්‍යාලය සෘජුවම ලබාගෙන තිබුණි.
(ඔ)	2020 අගෝස්තු 24 දිනැති අංක 02/2014 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 04 (III) ඡේදය	නියමිත පර්යේෂණ අධීක්ෂණ කමිටුවට ඉදිරිපත් කර එම කමිටුවේ එකඟතාවය ලබාගැනීමෙන් තොරව අවසන් පර්යේෂණ වාර්තාව ඉදිරිපත් කිරීම පදනම් කරගනිමින් විශ්වවිද්‍යාලයේ පර්යේෂණ අංශයේ හා මානව හා සමාජ විද්‍යා පීඨයේ පිළිවෙලින් නිලධාරීන් 113 දෙනෙකු හා 281 දෙනෙකු වෙත 2018-2022 කාලය තුළ පර්යේෂණ දීමනා ගෙවා තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය විශ්වවිද්‍යාලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 චෙනත් කරුණු

(අ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා නොගෙන විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයේ අනුමැතිය මත කොන්ත්‍රාත් පදනම මත අධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා 129 දෙනෙකු සහ අනධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා 269 දෙනෙකු බඳවාගෙන සමාලෝචිත වර්ෂය තුලදී පමණක් රු.137,402,969 ක් දීමනා වශයෙන් ගෙවා තිබුණු අතර, තාවකාලික පදනම මත අධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා 21 දෙනෙකුද බඳවාගෙන දීමනා ගෙවා තිබුණි.

(ආ) පිරිවැය රු.මිලියන 58 ක් වූ විශ්වවිද්‍යාලයේ අංශ 05 ක කටයුතු සම්බන්ධයෙන් මොඩියුල වශයෙන් ස්ථාපිත කර තිබුණු කළමනාකරණ තොරතුරු පද්ධතියේ (omis) අඩුපාඩු පැවතීම හේතුවෙන් 2018 වර්ෂයේ සිට නව කළමනාකරණ තොරතුරු පද්ධතියක් (new omis) ස්ථාපිත කිරීම සඳහා රු.48,864,381 ක් වැය කර තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් නව කළමනාකරණ තොරතුරු පද්ධතිය ස්ථාපිත කිරීමට කළමනාකරණය අපොහොසත් වී තිබුණි.

(ඇ) උසස් අධ්‍යාපනය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති (AHEAD) ප්‍රතිපාදන යටතේ රු.5,234,000 ක් වැයකර 2023 අප්‍රේල් 28 දින වනවිට වැඩ අවසන් කරන ලද ජංගම රසායනාගාර බස්රථය සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් ඌන උපයෝජිතව පැවතුණි.

(ඈ) විශ්වවිද්‍යාලය විසින් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව 2020 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා රජයේ අරමුදල් හා සේවක දායකය ලෙස පිළිවෙලින් රු.44,000,000 ක් හා රු.39,872,693 ක් යොදවා විශ්වවිද්‍යාලය තුළ පිහිටුවන ලද රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා ගෙවිය යුතු රක්ෂණ ගිණුමක් හරහා අභ්‍යන්තරිකව පත්කළ කමිටුවක නිර්දේශ මත සේවක රක්ෂණ ඉල්ලුම්පත්‍ර වෙනුවෙන් රු.82,511,730 ක් ගෙවා තිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

10.2 පිළිතුරු වාර්තාව

මගේ අංකය
எமது இல.
My No. VV/AC/A.R/2023 (F.R)

ඔබේ අංකය
உமது இல.
Your No. HEDE/F/I/OUSL/2023/FA/20

දුරකථනය
தொலைபேசி
Telephone 94 112807574
94 112881201
94 112881202

Facsimile : 94 112806577

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
இலங்கை திறந்த பல்கலைக்கழகம்
THE OPEN UNIVERSITY OF SRI LANKA

P.O.Box 21,
Nawala
Nugegoda.

அஞ்சற் பெட்டி 21,
நாவல,
நுகேகொட.

2024 අගෝස්තු 21

විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය
අංක 306/72, පොල්දූව පාර
බත්තරමුල්ල.

මහත්මයාණෙනි,

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

1.2 මතය සඳහා පදනම

(අ) විදුලි බල මණ්ඩලය විසින් ස්ථාපනය කරන ලද විදුලි රැහැන් පද්ධතිය විශ්වවිද්‍යාලයේ වත්කමක් නොවන අතර එය විදුලි බල මණ්ඩලය සතු වත්කමකි. එම නිසා විදුලි රැහැන් පද්ධතිය වෙනුවෙන් ගෙවන ලද සේවා ගාස්තුව පුනරාවර්තන වියදමක් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කර ඇත.

(ආ) කිසිම මුදලක් පොත්වලින් අත්හැර නොමැති බව සඳහන් කරමි. පශ්චාත් උපාධි පාඨමාලා, වැටුප් හා දීමනා, ගොඩනැඟිලි සහ රසායනාගාර වියදම් ඇතුළු සියලු වියදම් දරන ලද්දේ AHEAD ව්‍යාපෘතිය මඟිනි. එම වියදම් එම ව්‍යාපෘතියේ ගිණුම් වල සඳහන් වී ඇති බව මාගේ විශ්වාසයයි.

අප වෙත ලැබෙන භාණ්ඩ වල වටිනාකම පමණක් ගිණුම් ගතකර ඇත්තේ ව්‍යාපෘතිය අවසානයේ මාරුකරන තුරු බලා සිටියහොත් නැවත සොයා ගැනීම අපහසු වීම නිසාය. අතීතයේ DEMP ව්‍යාපෘතිය මඟින් ලද භාණ්ඩ සම්බන්ධයෙන් ද පසුව ගැටළු පැන නැඟීම හේතුවෙන් මෙසේ භාණ්ඩ ලද අවස්ථාවේම ගිණුම්ගත කිරීමට කටයුතු කරන ලදී.

(ඇ) OMIS පරිගණක පද්ධතියේ පවතින අපහසුතා හේතුවෙන් ශිෂ්‍ය ආදායමට අදාලව නිවැරදි කාල විශ්ලේෂණයක් ලබා ගැනීමට නොහැකි වී ඇත. නව පරිගණක පද්ධතිය මඟින් එම අඩුපාඩු නිවැරදි කර ගැනීමට ඉදිරියේදී බලාපොරොත්තු වේ.

1

(ඇ) එකඟ නොවෙමි. රු. 5,340,344.00 ක් වූ E-books හා මෘදුකාංග (Software) හි ජීවිත කාලය පුරෝකථනය කල නොහැකි බැවින් එම වත්කම් අවිනිශ්චිත ජීවිත කාලයක් ඇති අස්පෘෂ්‍ය වත්කම් ලෙස හෙළිදරව් කිරීමට කටයුතු කර ඇති අතර අනෙකුත් සියළුම අස්පෘෂ්‍ය වත්කම් ඒවායේ ජීවිත කාලය පදනම්ව ක්‍රමක්ෂය කිරීමට කටයුතු කර ඇත.

(ඉ) එකඟ නොවෙමි. නොග සමීක්ෂණ මණ්ඩල විසින් අධ්‍යයන මෙවලම් නොගය පිරිවැයට ආගණනය කරන ලද අතර, එම වියදම ගිණුම්ගත කිරීමට කටයුතු කර ඇත.

(ඊ) 2023 දෙසැම්බර් මස අවසානයේදී ලිපි ද්‍රව්‍ය හා පරිගණක උපාංග නොගයක් ගබඩාවට ලැබුනත්, එම භාණ්ඩ වල ඉන්වොයිස් පත් අදාල සැපයුම්කරුවන් විසින් ගබඩාවට භාර දෙන ලද්දේ 2024 වර්ෂයේදීය. 2023 වර්ෂයේදී ඉන්වොයිස් පත් නොලැබීම නිසා ගබඩා භාරකරුට එම භාණ්ඩ ඉන්වෙන්ට්‍රිගත කිරීමට නොහැකි වූ අතර, ඒවා 2024 වර්ෂයේදී ඉන්වෙන්ට්‍රිගත කිරීමට සිදුවිය. ඒ අනුව 2024 වර්ෂයේදී ලද භාණ්ඩ ලෙස ගිණුම්ගත කිරීමට මුදල් අංශය කටයුතු කර ඇත.

(උ) 2022 වසරට අදාලව උපචිත වියදම් වෙනුවෙන් ගෙවීම් සිදු කිරීමේදී එම වියදම උපචිත වියදම් ගිණුමට හර කිරීම වෙනුවට අදාල වියදම් ගිණුමට හර කර තිබීම නිවැරදි කිරීමට 2023 වර්ෂයේ අදාල වියදම් ගිණුමෙන් අඩු කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව, සමාලෝචිත වසරේ වියදම අඩුවෙන් වාර්තා කර ඇත යන්න පිළිගත නොහැකිය.

(ඌ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලද උපදෙස් වලට අනුව, විශ්වවිද්‍යාලය කටයුතු කරනු ලැබේ. ඒ අනුව වලංගු වැට් බදු නිශ්කාෂණ සහතිකයක් ඉදිරිපත් නොකරන ලද සැපයුම් කරුවන්ගේ වැට් බදු මුදලට අදාල ගෙවීම, එම නිශ්කාෂණ සහතිකය ලැබෙන තුරු රඳවා ගැනීමට විශ්වවිද්‍යාලය කටයුතු කර ඇත. ඒ අනුව, එම ගෙවිය යුතු මුදල ගෙවිය යුතු වියදමක් ලෙස ගිණුම්ගත කර ඇත.

(එ) විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රතිපත්තිය වන්නේ සෑම වර්ෂ 05 කට වරක්ම දේපළ පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනයක් සිදු කිරීමයි. ඉඩම් හා ගොඩනැඟිලි ප්‍රත්‍යාගණනය රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් සිදුකරන අතර විශ්වවිද්‍යාලයේ පවතින අභ්‍යන්තර මාර්ග පද්ධතිය සම්බන්ධයෙන් සැලකිල්ලට ගෙන එම තක්සේරුව සිදුකර ඇති බව අපගේ විශ්වාසයයි. තවද ඉඩම් හා ගොඩනැඟිලි සම්බන්ධ සත්‍යාපනයක් විශ්වවිද්‍යාලය විසින් 2023 වර්ෂයේදී තක්සේරු දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව සිදුකර ඇත. එමෙන්ම 2023 වර්ෂයට අදාලව විවෘත විශ්වවිද්‍යාලය වාහන සත්‍යාපනයක්ද සිදුකරන ලදී.

(ඒ) ERASMUS+CBHE ව්‍යාපෘතිය විශ්වවිද්‍යාලයේ ගිණුම් වලින් පරිබාහිරව වෙනමම ක්‍රියාත්මක වන ව්‍යාපෘතියකි. එම නිසා ERASMUS+CBHE ව්‍යාපෘතියේ බැංකු ගිණුම් ශේෂය විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය කිරීමේ කිසිදු අවශ්‍යතාවයක් නොමැත.

1.3 විශ්වවිද්‍යාලයේ **2023** වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.2.2

නීතිරීති/ විධානයට යොමුව			විස්තරය
(අ)	1978 අංක 38 දරන මුදල් පනතේ 11(අ),9(2) (ඊ) හා 10(5)(i) වගන්ති		භාණ්ඩාගාර අනුමැතිය ලැබෙන තුරු කෙටිකාලීන ආයෝජන කිරීම් ප්‍රමාද කල නොහැකි බැවින් භාණ්ඩාගාර නිලධාරීන්ගේ උපදෙස් මත ස්ථාවර තැන්පතු වල අයෝජනය කරන අවස්ථාවේදීම භාණ්ඩාගාර අනුමැතිය ඉල්ලීම් ලිපි භාණ්ඩාගාරයට යොමුකර ඇත.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය		
	(i)	මුදල් රෙගුලාසි 102,103,104, හා 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය, 2023 මැයි 16 දිනැති අංක PED 01/2021 (i) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	විශ්වවිද්‍යාලය විසින් වාර්ෂිකව ලියාපදිංචි වන ශිෂ්‍ය සංඛ්‍යාව පදනම් කරගෙන අධ්‍යයන ප්‍රකාශන මුද්‍රණය කරනු ලබයි. මෙය විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය වියදමකි. නමුත් අධ්‍යයන වර්ෂ අතරතුර සිසුන් විසින් පාඨමාලා හැරයාම, විෂය නිර්දේශයන් වෙනස්වීම් ආදී කරුණු හේතුවෙන් ඇතැම් විට මුද්‍රණය කරන ලද පොත්පත් ඉවත් කිරීමට සිදුවේ. මෙය මාර්ගගත අධ්‍යාපනය ලබාදෙන විශ්වවිද්‍යාලයක් තුල සිදුවිය හැකි පොදු තත්වයකි. ඒ අනුව මුද්‍රණය කරන ලද පොත් පත් භාවිතයෙන් ඉවත් කිරීම තොග හානියක් ලෙස සඳහන් කල නොහැකිය. ඒ අනුව පාලක සභා අනුමැතිය මත එම පාඨමාලා ද්‍රව්‍ය අදාල වසරේ වියදමක් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කර ඇත.
	(ii)	මුදල් රෙගුලාසි 371(2) වගන්තිය	රු. 1,204,594 ක් වූ මුදල අත්තිකාරම් මුදලක් නොවන අතර එය මුද්‍රණාලය විසින් භාහිර පාර්ශවයන් වෙත සිදුකරනු ලබන මුද්‍රණ වැඩ වෙනුවෙන් ලද ආදායමේ එකතුවකි. මේවන විට අදාල වැඩ නිමකර ඇතත්, ආදායම් බෙදාහැරීමක් සිදුකර නොමැත. එම ආදායම මෙම වසරේදී C-SFA මාර්ගෝපදේශය අනුව බෙදාහැරීමක් සිදුකර හැකි ඉක්මනින් ගිණුම් නිරවුල් කිරීමට කටයුතු කරමි.
	(iii)	මුදල් රෙගුලාසි 571	මෙයට පිළිතුර අමුණා ඇත.
	(iv)	මුදල් රෙගුලාසි 756	විශ්වවිද්‍යාලයේ ප්‍රාදේශීය මධ්‍යස්ථානවල පාඨමාලා ද්‍රව්‍ය ප්‍රාදේශීය මධ්‍යස්ථාන වල සහකාර අධ්‍යක්ෂක වරුන්ගෙන් සැදුම් ලත් කමිටු මඟින් භෞතිකව පරීක්ෂා කර බලා තොග ගණනය කිරීම සිදුකරනු ලබයි. ඒ අනුව පාඨමාලා ද්‍රව්‍යය (මුද්‍රිත පොත්) භෞතිකව පරීක්ෂාකර නොතිබුණු බව පිළිගත නොහැකිය. 2019 වර්ෂයේදී සමීක්ෂණයක් සිදුකර ඇත.
(ඇ)	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.7.5 හා 2020 මාර්තු දිනැති අතිරේක 35		2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.4 ට අනුව විශාල කොන්ත්‍රාත්තුවක් කුඩා ප්‍රමාණවලට

		වෙන්කර වෙන වෙනම කොන්ත්‍රාත් ලංසු කැඳවිය හැකිය. (Packaging and Slicing of Contracts) එබැවින් පරිපාලන ගොඩනැගිල්ලේ (ප්‍රථම සහ බිම් මහල) කාර්යාල පරිශ්‍ර සහ මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨයේ (බිම් මහල) ප්‍රතිසංස්කරණය කිරීමේදී එම කාර්යාල කටයුතු පවත්වා ගැනීම සඳහා තාවකාලික ස්ථාන යොදා ගැනීම ප්‍රයෝගිකව ඉතා දුෂ්කර වූ බැවින් හා විශ්වවිද්‍යාලය සතුව මූල්‍ය ප්‍රතිපාදන නොතිබූ බැවින් සැලසුම් සහ සංවර්ධන කමිටුව විසින් (Planning and Development Committee) විශ්වවිද්‍යාල වැඩ ඉංජිනේරුවරයාට අදියර වශයෙන් ලංසු ලේඛන සකස් කර ලංසු කැඳවන ලෙස උපදෙස් ලබාදෙන ලදී. පසුව පරිපාලන ගොඩනැගිල්ලේ ප්‍රථම මහලේ ප්‍රතිසංස්කරණය අදියර වශයෙන් එකවර කල අතර එහිදී ඉතිරිව තිබූ පරිපාලන ගොඩනැගිල්ලේ සහ මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨයේ (බිම් මහල) ප්‍රතිසංස්කරණය කිරීමට විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් වූ බැවින් සැලසුම් සහ සංවර්ධන කමිටුව විසින් මෙම කොන්ත්‍රාත් කාර්යය අදියර වශයෙන් එකවර කිරීමට යෝජනා කලේය. එබැවින් සැලසුම් සහ සංවර්ධන කමිටුව විසින් අදියර වශයෙන්ම ලංසු කැඳවන ලෙසත් එමගින් කුඩා කොන්ත්‍රාත්කරුවන්ගේ තරගකාරීත්වය යටතේ ඉතා හොඳ තරගකාරී මිලකට කොන්ත්‍රාත්තුව ලබා ගත හැකි බව හා වෙන වෙනම අදියර වශයෙන් කිරීමේදී අඩු කාලයකින් සම්පූර්ණ කොන්ත්‍රාත් කාර්යයම ඉටුකරගත හැකි බව පෙන්වා දෙන ලදී. එමනිසා මෙම උපදෙස් මත මූලධන අංශය මගින් අදියර වශයෙන් වෙන වෙනම තරගකාරී ලංසු කැඳවීම් යටතේ (National Competitive Bidding) ලංසු කැඳවා අදියර වෙන වෙනම දෙපාර්මේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (Department of Procurement Committee – Minor) අනුමැතීන්ට යටත්ව කොන්ත්‍රාත්කරුවන් හට අදාළ කොන්ත්‍රාත් ප්‍රදානය කරන ලදී. මෙම තීරණය හේතුවෙන් විශ්වවිද්‍යාලය බලාපොරොත්තු වූ පරිදි අඩු කාලසීමාවකින් නියමිත ප්‍රමිතියෙන් මෙම ප්‍රතිසංස්කරණය කරගැනීමට හැකිවී ඇත.
(ඇ)	2013 ජනවාරි 31 දිනැති අංක 02/2013 දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛයේ 3.1 වගන්තිය	විශ්වවිද්‍යාල මුදල් කමිටුවේ සහ පාලක සභා අනුමැතිය මත මහා භාණ්ඩාගාරය අනුමැතිය සඳහා මේ වනවිටත් අදාල ලිපි ලේඛන යොමුකර ඇත.
(ඉ)	1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍ර ලේඛය	විගණන දෙපාර්තමේන්තුවේ විගණන නිලධාරී සඳහන් කර ඇති දේපළ පිරියත හා උපකරණ අගය වන රු. 14,176,191,934 ට අදාලව 2020 වර්ෂයේ

		අවසන් ගිණුම් වල සටහන් අංක 6 යටතේ පිරිවැය, ශේෂ කිරීම් හා වසර තුල මිළදී ගන්නා ලද වටිනාකම්, ඉවත් කරන ලද වටිනාකම් ආදී තොරතුරු අඩංගුවේ. මෙම අගයෙන් ඉඩම්, බදුකුලී ඉඩම්, ඉඩම් හා ගොඩනැඟිලි වල වටිනාකම රු. 13,737,776,913 වන අතර මුළු ස්ථාවර වත්කම් වල වටිනාකමින් ප්‍රතිශතයක් ලෙස 96.90% වේ. එම වත්කම් වලට අදාල ස්ථාවර වත්කම් ලේඛණයේ ඇතුලත් වියයුතු සියළු තොරතුරු අවසන් ගිණුම් මඟින් හෙලිදරව් කර ඇත. ඉන් 3.10% ප්‍රමාණයට අදාල තොරතුරු වසරක් පාසා ගිණුම් පරීක්ෂා කිරීමෙන් සත්‍යාපනය කර ගත හැක. පරිගණක පද්ධතියේ ස්ථාවර වත්කම් ලේඛණය ක්‍රියාත්මක නොවූවත් එම තොරතුරු පදනම් කරගෙන ගිණුම් වාර්තා වල විස්තරාත්මක උපලේඛන වලින් සියළු තොරතුරු ලබාගත හැක. නිවැරදි ක්ෂය ගණනය කල හැකි වන පරිදි OMIS පරිගණක පද්ධතියේ ස්ථාවර වත්කම් මොඩියුලය නිවැරදි කිරීමට අදාල නිලධාරීන්ට උපදෙස් දී ඇති බැවින් දැනටමත් එම කටයුතු ආරම්භ කර ඇති අතර, බඳවා ගැනීමේ සීමා, සේවකයින් විදේශ ගතවීම්, තොරතුරු තාක්ෂණ සේවක හිඟය මෙම කාර්යයට ද බලපා ඇති බව සඳහන් කරනු කැමැත්තෙමි.
(ඊ) (i) (ii)	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ V වැනි පරිච්ඡේදයේ 7.6 වගන්තිය 2023 ජනවාරි 18 දිනැති අංක BD/HRD/126/214/19/2023 දරන භාණ්ඩාගාර ලේකම්ගේ ලිපියේ 05 ඡේදය	විශ්වවිද්‍යාල ගිවිසුම් කඩකිරීමෙන් ලැබෙන ආදායම සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛන නිකුත් කර ඇත. ඒ අනුව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 737 මඟින් සඳහන් කර ඇති විධිවිධාන අනුව විශ්වවිද්‍යාලය කටයුතු කර ඇත.
(උ)	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ XX වැනි පරිච්ඡේදයේ 3.1 වගන්තිය සහ 2017 ජූලි 10 දිනැති අංක 10/2017 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය	අධ්‍යයන කාර්යය මණ්ඩලය වැඩ නියමාවලියට (Work Norm) අනුකූලව අධ්‍යයනාංශ්‍ය ප්‍රධාන සහ පීඨාධිපතිගේ අධීක්ෂණය යටතේ තම කාල සටහනට අනුව අධ්‍යයන කාර්යයන් කිරීම සිදුකරයි. ආයතන සංග්‍රහයේ හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ ප්‍රතිපාදන සලසා තිබුනද අධ්‍යයන කාර්යය මණ්ඩලය පැමිණීම පිටවීම සටහන් කරනු නොලැබේ. මෙය මෙම විශ්වවිද්‍යාලයේ පමණක් නොව සෑම විශ්වවිද්‍යාලයකම සිදුවන බව විමසා බැලීමේදී දැනගත හැකිය.
(ඌ)	2021 නොවැම්බර් 16 දිනැති හා Operational Manual (01/2021) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍ර ලේඛයේ 2.3 වගන්තිය	විවෘත විශ්වවිද්‍යාලයේ දැක්ම හා මෙහෙවර වෙත ළඟාවීම උදෙසා පුළුල් පරාසයක් ආවරණය වන පරිදි විශ්ව විද්‍යාලයේ උපායමාර්ගික කළමනාකරණ සැලැස්ම (Strategic Management Plan) නිර්මාණය කර ඇති අතර එය ඉලක්ක 6 කින් සමන්විතවේ. එහි සඳහන් ඉලක්ක 1 වන Achieve

		Excellence in Quality of Teaching and Learning which Support Life-Changing Education සාක්ෂාත් කර ගැනීම උදෙසා අධ්‍යක්ෂ මෙහෙයුම් විසින් පිළියෙළ කරනු ලබන ක්‍රියාකාරකම් කාලසටහන් (Activity Schedules) දායකවේ. විශ්වවිද්‍යාලයේ පාඨමාලාවලට අදාල දින වකවානු එම ක්‍රියාකාරකම් කාලසටහන්වල (Activity Schedules) ඇතුලත්වේ. විශ්ව විද්‍යාලයේ උපායමාර්ගික කළමනාකරණ සැලැස්මට (Strategic Management Plan) අදාලව ක්‍රියාකාරී සැලැස්ම (Action Plan) නිර්මාණය කර තිබේ. ක්‍රියාකාරකම් කාලසටහන්වල (Activity Schedules) සඳහන්වන දින වකවානු විශ්ව විද්‍යාලයේ ක්‍රියාකාරී සැලැස්මට (Action Plan) ඇතුලත් කිරීම සිදු නොකෙරේ. විශ්ව විද්‍යාලයේ ක්‍රියාකාරී සැලැස්ම (Action Plan) නැවත අධ්‍යනය කොට අඩුපාඩු පවතින්නේනම් එය නිවැරදි කිරීමටත්, ප්‍රගති සමාලෝචනයන් අදාල කාල සිමාවන් තුල සිදුකිරීමටත් අදාල නිලධාරීන්ට උපදෙස් දෙමි.
(එ)	මුදල් රෙගුලාසි 756 සහ 2020 අගෝස්තු 20 දිනැති 01/2020 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍ර ලේඛයේ II පරිච්ඡේදය	තොරතුරු තාක්ෂණ අංශයේ ඉන්වෙන්ට්‍රි ලේඛනය විධිමත් ලෙස පවත්වාගෙන යාම ආරම්භකර ඇති අතර මේ වන විට අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ වත්තීය ක්‍රියා මාර්ගයක් පවතින බැවින් එය අවසන් වූ විගස භෞතික පරීක්ෂාවක් සිදුකර ඌනතාවයක් පෙන්නුම් කර ඇති සර්වර් යන්ත්‍ර පිළිබඳ කරුණු සොයා බලා ඉන්වෙන්ට්‍රි ලේඛනය නැවත යාවත්කාලීන කිරීම සඳහා කටයුතු සූදානම් කරමින් පවතී.
(ඒ)	2020 අගෝස්තු 14 දිනැති අංක SC & PMU/Grant/20 දරන විදේශ සම්පත් දෙපාර්තමේන්තු චක්‍ර ලේඛය	2020 අගෝස්තු 14 දින නිකුත් වූ චක්‍රලේඛනයට පෙර මෙම ව්‍යාපෘති 5න් 4ක්ම 2018 වර්ෂයේදී ක්‍රියාත්මක වූ ඒවාය. එම ව්‍යාපෘති 4න් 3 ක්ම ක්‍රියාත්මක වී ඇත්තේ Commonwealth Digital Education Leadership Training in Action (C-DELTA) යටතේ ද්විතීය පාසැල් මට්ටමේ ගුරුවරුන් සහ ලමුන් සඳහාය. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ සක්කාරක සේවාවක් ලෙස මෙය ක්‍රියාත්මක කර ඇති අතර මෙම ව්‍යාපෘති තුනේම වටිනාකම ඇමරිකානු ඩොලර් 34,470 ක් වැනි අගයකි. 2018 ක්‍රියාත්මක වූ අනෙක් ව්‍යාපෘතිය CONTESSA ව්‍යාපෘතියක් ලෙස ඇ.ඩොලර් 67,145 ක මෙම ව්‍යාපෘතිය ද ගුරුවරුන් පුහුණු කිරීමේ ව්‍යාපෘතියකි.

		2021 ක්‍රියාත්මක වී ඇති ව්‍යාපෘතිය පර්යේෂණයන් සඳහා රසායන විද්‍යා දෙපාර්තමේන්තුවට ලැබුනු මුදලකි. වටිනාකම ඇ.ඩොලර් 17.265 කි. විවෘත විශ්වවිද්‍යාලය ආරම්භයේ සිටම විවිධ පර්යේෂණ හා අධ්‍යාපනික වැඩසටහන් සඳහා විදේශ ආයතනවල අනුග්‍රහය යටතේ සිදුකර ඇති අතර ඒවා විදේශ මූදල් ප්‍රදානයන් නොව විදේශ ආයතන වෙනුවෙන් කරන ලද වැඩසටහන් වල පිරිවැය ආවරනය කර ගැනීමකි. මෙම ව්‍යාපෘති විශ්වවිද්‍යාලයේ ආචාර්යයවරුන් විදේශ ආයතනවලට යෝජනා කර එම ආයතනවල අනුමැතිය ලබාගෙන වැඩසටහන් වියදම් සඳහා මුදල් ලබාදීමකි. එම නිසා, ඉහත සඳහන් ව්‍යාපෘති සඳහා කිසිම මුදලක් සෘජුවම ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය වෙනුවෙන් ලැබුනු විදේශ මුදල් ප්‍රදානයන් නොවන බව ප්‍රකාශකරමි. හුදෙක් විවෘත විශ්වවිද්‍යාලය ක්‍රියාත්මක කර අත්තේ විදේශ ආයතන හා අපගේ ආචාර්යවරුන් අතර අරමුදල් හුවමාරුවේදී අතරමැදි ආයතනයක් ලෙස කටයුතු කිරීමයි. එබැවින් ඔබ සඳහන් කර ඇති SC & PMU/Grant/19 චක්‍රලේඛයේ විෂය පථයට අදාල නොවන බව මගේ මතයයි.
(ඔ)	2020 අගෝස්තු 24 දිනැති අංක 02/2014 දරන කළමණාකාරණ සේවා චක්‍රලේඛයේ 04 (III) ඡේදය	කළමණාකරණ සේවා චක්‍රලේඛ අංක: 02/2014 නිකුත් කර ඇත්තේ සියළුම රාජ්‍ය නිලධාරීන් සඳහා වේ. චක්‍ර ලේඛයේ අංක 3.1 අනුව මෙම නිලධාරීන් වන්නේ, (i) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 හි සඳහන් නිර්වචනය අනුව "ජ්‍යෙෂ්ඨ මට්ටමේ" තනතුරක් සඳහා ස්ථිර පදනමින් පත්කර ඇති රාජ්‍ය නිලධාරීන්, (ii)විශ්වවිද්‍යාල හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ස්ථිර කාර්යය මණ්ඩලයට අයත් පහත සඳහන් නිලධාරීන්, • කථිකාචාර්ය හා ඉන් ඉහළ මට්ටමේ ආචාර්යවරුන් (U-Ac 3, U-Ac 4, U-Ac 5) හා U-Ac 3, U-Ac 4, U-Ac 5 වැටුප් කාණ්ඩ යටතේ වැටුප් ලබන අනෙකුත් නිලධාරීන් • වෛද්‍ය නිලධාරීන් (U-MO) • මධ්‍යම මට්ටමේ හා ඉන් ඉහළ මට්ටමේ විධායක නිලධාරීන් (U-Ex 2, U-Ex 2a, U-Ex3) (iii) කළමණාකරණ සේවා චක්‍රලේඛ අංක 30 හි සඳහන් නිර්වචනය අනුව අධ්‍යයන හා පර්යේෂණ (AR) හෝ කළමණාකරන (MM) සේවා ගණයේ හෝ ඉන් ඉහළ මට්ටමේ තනතුරක ස්ථිර සේවයේ නියුතු රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල

		නිලධාරීන් හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල නිලධාරීන් වේ. එමෙන්ම වක්‍රලේඛයේ 5.1 ට අනුව "විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හා විශ්වවිද්‍යාල, උසස් අධ්‍යාපන ආයතනයන්හි කාර්ය මණ්ඩලයේ පර්යේෂණ යෝජනා - අදාල විශ්වවිද්‍යාලයේ සනාතන සභාව පිළිගත පර්යේෂණ කමිටු හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් පර්යේෂණ කමිටු මඟින් අනුමත කල හැක". ඒ අනුව ඉහත පර්යේෂණ කළමණාකරණ කමිටුව විසින්ම පර්යේෂණ අධීක්ෂණ කමිටුවේ කාර්යයන් ඉටු කිරීම සියළුම විශ්වවිද්‍යාල වල සිදුවන ක්‍රමයකි. ඔබ සඳහන් කර ඇති පරිදි පර්යේෂණ අධීක්ෂණ කමිටුව මඟින් විශ්වවිද්‍යාල පර්යේෂණ අධීක්ෂණය කිරීම කිසිසේත්ම ප්‍රායෝගික නොවේ. එයට හේතුව පිහිටුවිය යුතු පර්යේෂණ අධීක්ෂණ කමිටුවේ සභාපතීත්වය සඳහා තාක්ෂණ හා පර්යේෂණ විෂය භාර ලේකම් ඇතුළු පහත සඳහන් නිලධාරීන් සම්බන්ධ කර ගත යුතුය. • සෞඛ්‍ය විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් • පරිසරය විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් • උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් • රාජ්‍ය කළමණාකරන ප්‍රතිසංස්කරණ විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් • විධායක අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය • අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මෙය අතිශයින්ම ප්‍රායෝගිකව කල නොහැක්කක් වන අතර කිසිම විශ්වවිද්‍යාලයක් මෙය අනුගමනය නොකරන බව විමසීමේදී තහවුරු විය. එම නිසා පර්යේෂණ අධීක්ෂණ කමිටුවේ කටයුතු, පර්යේෂණ කළමණාකරණ කමිටුව මඟින්ම සිදුකල බව තහවුරු කිරීම සඳහා ඇමුණුම් අංක I හි ඒ ඒ පර්යේෂකයින් විසින් කරන ලද පර්යේෂණ වල විස්තරාත්මකව සහ ඔවුන් අවසන් වාර්තා ලබාදී ඇත්ද, නැද්ද යන්න සඳහන් කර ඇත.

2.3 වෙනත් කරුණු

(අ) රජය විසින් තාවකාලිකව කාර්යය මණ්ඩල බදවා ගැනීම අත්හිටුවීමත් සමගම විවෘත විශ්වවිද්‍යාලයේ දෛනික අධ්‍යන හා පරිපාලන කටයුතු බාධාවකින් තොරව පවත්වා ගෙන යාම සඳහා අධ්‍යන හා අනධ්‍යන කාර්යය මණ්ඩලය තාවකාලික පදනම යටතේ බදවා ගැනීම් සිදුකර ඇත.

මෙම බදවා ගැනීම් සඳහා පාලකසභා අනුමැතිය ලබා ගෙන ඇති අතර මතු සඳහන් වක්‍රලේඛ හා ලිපි මගපෙන්වීම් ලෙස පාදක කරගෙන ඇත.

(1) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 04/2022 – 2022.08.08.

(2)මූල්‍ය චක්‍රලේඛ අංක - 07/2022 - විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

(3) අංක U.G.C/DA – F / Bond දරන 2022.01.09 දිනැති ලිපිය.

(4) අංක U.G.C/HR/10/01 දරන 2023.06.06 දිනැති ලිපිය.

(ආ) මෙම New OMIS පද්ධතිය යාවත්කාලීන කර කෙටිකාලීන පායමාලා සඳහා මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ අයදුම්පත් භාරගැනීම සහ ලියාපදිංචි කිරීම සඳහා ස්ථාපනය කරමින් පවතින අතර එහි මූලික තත්ව සහතිකකරන හා පරීක්ෂණ (Quality Assurance and Testing) කටයුතු අවසන් කර ඇත.

(ඇ) පිළිගත නොහැක. එම බස්රථය 2023 අප්‍රේල් මස සිට විවිධ දැනුවත් කිරීමේ වැඩ සටහන්/ විවිධ වැඩමුළු සඳහා යොදාගත් බව සඳහන් කරනු කැමැත්තෙමි.

(ඈ) විශ්වවිද්‍යාලීය වෛද්‍ය රක්ෂණ ක්‍රමය පාලක සභා අනුමැතිය මත පවත්වාගෙන ගිය අතර ඒ සඳහා 2013 වසරේ සිට 2019 වසර දක්වා විශ්වවිද්‍යාල වෛද්‍ය රක්ෂණ ක්‍රමය සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙත මුදල් ගෙවා පවත්වා ගෙන යන ලදී. ඒ සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීම සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලිපියක් යොමු කල අතර එයට පිළිතුරු ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති විසින් විශ්වවිද්‍යාල පනත සහ කොමිෂන් සභා චක්‍ර ලේඛ අංක 718 අනුව විවෘත විශ්වවිද්‍යාලය තුළ වෛද්‍ය සුභ සාධන යෝජනා ක්‍රමයක් එහි උත්පාදිත ආදායම සහ සේවක දායකත්ව අරමුදලක් සහිතව පවත්වාගෙන යා හැකි බව 2023.10.24 දිනැති ලිපියෙන් වැඩි දුරටත් දැනුම් දී ඇත. එම උපදෙස් මත වාර්ෂිකව පාලකා සභා අනුමැතිය ඇතිව වෛද්‍ය සුභ සාධන යෝජනා ක්‍රමය ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය තුල පවත්වා ගෙන යනු ලබයි.

මෙයට විශ්වාසී,

මහාචාර්ය පී.එම්.සී. නිලකරත්න
උපකුලපති

පිටපත් - ලේකම්/අධ්‍යාපන අමාත්‍යාංශය
ලේකම්/මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
සභාපති/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

9

පිළිතුරු වාර්තාවේ ඇමුණුම

FACULTY OF NATURAL SCIENCES
Audit Query on Faculty Research Grant

Serial No.	Name of Principle Investigator	Names of Co-Investigators & Collaborators	Department	Title	Amount Granted SLR	Annual Research Forum	Final Report
2018-12	Prof. G.W.A.R. Fernando	-	Physics	*Pressure-Temperature-Time (P-T-t) and Fluid Evolution of Calc Silicate rocks in the Southern and Southwestern Highland Complex of Sri Lanka* Extended from 2017 to 2018 to 2019	**93,750.00**	Presented	Submitted
2020-1	Dr. U.K.G.K. Padmalal (Retired)	Co-Investigator – Mr. T.S.P. Fernando	Zoology	The aspects of behavioural response of Red Wattled Lapwing (*Vanellus indicus*) in different environmental conditions: urban, semi-urban and natural	444,000.00		Justification submitted
2020-2	Dr. N. Karthikeyan	Co-investigator – Prof. S.R. Weerakoon Collaborator- Dr. S. Somaratna	Physics	Growth and yield performances of rice under SMART – Nano Micronutrient fertilizers: A case study of Nano-CuO, Nano-MnO and Nano-ZnO	879,350.00	Presented	Submitted
2020-3	Dr. H.L.D. Weerahewa	-	Botany	The investigation on effect of partially burnt rice hull on growth of immature rubber plants, soil properties and the cost effectiveness of the application Transferred to 2021	423,980.00		submitted
2020-4	Dr. A.K.L.A. Wijenayake (Resigned)	Co-investigator – Dr. H.L.D. Weerahewa	Chemistry	Rice-hull Mediated Preparation of Si Nanoparticles as a Novel Nano-fertilizer for Oryza sativa (rice): From 'Waste" to 'Sustainable Agronomy" Transferred to 2021	600,000.00	Presented	Not submitted
2020-5	Dr. K.O.L.C. Karunanayake	Co-investigator – Dr. W.H.M.A.T. Herath	Botany	Morphological and molecular identification of foliar disease causing fungal agent of rubber *Hevea brasiliensis*; with special emphasis on identifying the newly recorded foliar disease causing agent	252,000.00	Presented	submitted
2020-7	Dr. M.G.Y.L. Mahagamage	Co-Investogators- 1. Dr. Amila	CESSD	Persistent Organic Pollutants (POPs), Heavy Metals and Microplastics in Surface water of the Kelani	999,375.00		submitted

1

		Abeynayake 2. Prof. M.M. Pathmalal		River Basin, Sri Lanka Transferred to 2021			
2020-8	Dr. D.D.D.H. Alwis		Chemistry	Carotenoid analysis, phytochemical screening and Proximate analysis of Clausena Indica (Meegon Karapincha) Transferred from 2019	360,000.00	Presented	submitted
2020-9	Dr. N. Nilakarawasam		Zoology	DNA barcoding of selected anti-hypercholesterolemic plants of family Euphorbiaceous Transferred from 2019	631,000.00		Justification submitted
2021-1	Prof. S.R. Weerakoon	Co-Investigator- Dr. S.A. Chandrika N. Perera, UoPeradeniya Collaborator- Mr. Lakshman Dissanayake, Manager-Research Development, Oasis Marketing	Botany	Molecular and Agro-morphological characterization and Molecular screening for Bacterial Wilt in Brinjal (*Solanum melongena)* varieties cultivated in Sri Lanka	993,050.00	Presented	Submitted
2021-2	Dr. H.B.P. Sandani	Co-Investigator: Prof. H.L.D. Weerahewa	Botany	Preliminary study on the potential of biological control of tomato anthracnose using native bioagents	483,800.00	Presented	Submitted
2021-3	Dr. K.H. Jayawardena	Co-Investigators: Dr. C. Ranasinghe Chemistry Prof. G.M.K.B. Gunaherath	Zoology	Investigation on the expression of proteins and/or cytokines during cell migration assay conducted with wound healing active medical plant extracts and chemical constituents using Madin-Darby Canine Kidney (MDCK) cells Extended to 2022	308,000.00	Presented	Not submitted
2021-4	Dr. C.D. Jayasinghe	Co-Investigators: Dr. T.S.P. Fernando	Zoology	Eco-immunological investigation of mite-induced responses in Red-vented bulbul (*Pycnonotus cafer*) in semi-urban environment	300,000.00	Presented	submitted

		Dr. U.A. Jayawardena					
2021-5	Dr. D.D.G.L. Dahanayake	-	Zoology	Development of integrated coastal and marine spatial planning (MSP) for Sri Lanka	842,000.00	Presented	submitted
2021-6	Dr. N.U.S. Yapa	Co-investigator- Prof. G.K.R. Senadheera	Physics	Synthesis and Characterization of conducting polymer films for applications in smart windows	300,000.00		Not submitted
2021-7	Dr. Prasad Senadheera	-	Botany	Genome-wide association mapping to discover quantitative trait loci / genes that confex salt tolerance in rice at the reproductive stage in Sri Lankan rice diversity panel	1,000,000.00	Presented	Not submitted
2022-1	Prof. S.R. Weerakoon	1. Dr. C. Ranasinghe, Senior Lecturer in Chemistry 2. Ms. Y.A.S. Samithri, Senior Lecturer in Botany	Botany	Geographical mapping of *Phyllanthus maderaspatensis* in different locations of Sri Lanka and comparison of Phytochemical composition of anti-hypercholesterolemic methanolic fractions Extended to 2023	997,850.00		
2022-2	Prof. R. Senthilnithy	No	Chemistry	Exploring novel therapeutic compounds to inhibit human DNA Methyltransferase using some selective compounds in Sri Lanka Flora Database: *In-Silico* approach Extended to 2023	984,000.00		
2022-3	Prof. G.K.R. Senadheera	Collaborators: Prof. M.A.K.I. Dissanayake,	Physics	Synthesis and applications of navel quasi solid polymer electrolytes based on polymeric nano fibres and their applications in Dye/Qdot Sensitized Solar Cells Extended to 2023	350,000.00		
2022-4	Ms. M.D.J.S. Saparamadu	Co-Investigators: 1. Ms. M. Thayaparan Senior Lecturer in Chemistry Mr. V.	Chemistry	A field trial on Application of research findings on prevention of colour formation in tube well water of Chavakachcheri area (OURS, 2020 Paper no. 66) Extended to 2023	265,050.00		

		Vithathagan Workshop Engineer, Dept. of Mechanical Eng.					
2022-5	Dr. S.K. Rodrigo	Collaborators: 1. Dr. D. Udayanga, UoSJP Dr. I. Munaweea, UoSJP	Chemistry	Sustained release of anti-dandruff natural compounds via a nano/microparticle formulation as a possible cosmeceutical product Extended to 2023	397,375.00		
2022-6	Ms. S.M.M.P.K. Seneviratne	Co-Investigators: 1. Prof. T.K. Weerasinghe, Associate Professor in Botany Dr. J.J. Wewalwela, Dept. of Agri. Tech, UoC	Botany	Effect of prolong drought followed by rewetting on soil microbial activity and soil nutrient availability	483,430.00		Not submitted
2022-7	Dr. N. Nilakarawasam	Collaborators: Prof. S.R. Weerakoon, Dept. of Botany, OUSL	Zoology	*In vitro* study of possible hypocholesterolemic mechanisms, cytotoxic and genotoxic activity of *Phyllanthus maderaspatensis* L Extended to 2023	995,042.00		
2022-8	Dr. T.S.P. Fernando	Co-Investigators: 1. Dr. Ruwan Illeperuma Senior Lecturer in Zoology Colloborators: 1. Dr. Wipula Yapa, Retired Professor Mr. Sahan Siriwardana, UoC	Zoology	Roosting ecology, morphometrics and genetic affinities of *Pteropus* giganteus (Indian flying fox) in Sri Lanka	904,000.00	Presented	Progress Submitted